# 2022 දෙසැම්බර් මස 06 වන දින ගඟ ඉහළ කෝරළේ ප්‍රාදේශීය සභාවේ පැවති මහා සභා රැස්වීම් වාර්තාව

දිනය සහ වේලාව :- 2022.12.06 පෙ:ව: 09.30

ස්ථානය :- ගඟ ඉහළ කෝරළේ ප්‍රාදේශීය සභා රැස්වීම් ශාලාව

පැමිණීම:-

| | |
|---|---|
| 01. පී.ඕ.පී.ඩී. නදීර බණ්ඩාර ජයසේකර මහතා | ගරු ප්‍රාදේශීය සභා සභාපති |
| 02. ඒ. මහින්දරත්න අලුත්ගමගේ මහතා | ගරුප්‍රාදේශීය සභා උප සභාපති |
| 03. ආර්.පී. ගුණරත්න මහතා | ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී |
| 04. එස්.ඒ.ඩබ්. පතිරණ මහතා | ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී |
| 05. ඩී.ඩබ්.නාලක වසන්ත අබේසේකර මහතා | ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී |
| 06. එම්.පී.ප්‍රසන්න විමල් මනතුංග මහතා | ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී |
| 07.ඒ.පී. කොල්වින් සිල්වා මහතා | ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී |
| 08. ඩී.පී.පී. විශ්වජිත් ගංගා ප්‍රේමලාල් ගුරුගේ මහතා | ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී |
| 09. සුබෝධා ලක්ෂාණි රිබේරා මහත්මිය | ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රිනී |
| 10. ඩබ්.එම්. උදය කුමාර බණ්ඩාර මහතා | ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී |
| 11. ඒ.ඒ. අජිත් ප්‍රියන්ත බණ්ඩාර මහතා | ගරු ප්‍රාදේශීයසභාමන්ත්‍රී |
| 12. එම්.ඒ. සුමේධ අලුත්ගමගේ මහතා | ගරුප්‍රාදේශීය සභා මන්ත්‍රී |
| 13. පූජ්‍ය පට්ටිපොල සුමනරතන හිමි | ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී |
| 14. එච්.පී. ආනන්ද කුලතිලක මහතා | ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී |
| 15. එම්.පී. අබේරත්න බණ්ඩාර මහතා | ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී |
| 16. එස්. නිලාම් මහතා | ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී |
| 17. ඩී.පී. නිරෝෂා දිල්රුක්ෂිකා ජයසේකර මහත්මිය | ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රිනී |
| 18. එස්.පී. සරත් කුමාර ලාල් මහතා | ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී |
| 19. එන්.එම්. නන්දාවතී මහත්මිය | ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රිනී |
| 20. ආර්.පී. පී. ඉෂංකා ලක්මාලි සෙනෙවිරත්න මහත්මිය | ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රිනී |

නොපැමිණි-

| | |
|---|---|
| 01.චන්ද්‍රා අලුත්ගමගේ මහත්මිය | ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රිනී |
| 02. ආර්.එම්.චාමික අනුරාධ රත්නායක මහතා | ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී |
| 03.රාජකුමාර් විදුෂණී මහත්මිය | ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රිනී |

ගරු සභාපතිතුමා

ගරු සභාපතිතුමා විසින් මහා සභා රැස්වීමේ වැඩ කටයුතු ආරම්භ කරමින් පැමිණ සිටි ගරු උප සභාපතිතුමා ඇතුළු ගරු මන්ත්‍රීතුමන්ලා, ගරු මන්ත්‍රීතුමියන්ලා, ප්‍රාදේශීය සභාවේ ලේකම්තුමිය ඇතුළු නිලධාරීන් සියලුදෙනා හා පැමිණ සිටි සියලුදෙනාම ගෞරවයෙන් යුතුව පිළිගන්නා ලදී. සභා රැස්වීමට සහභාගීවූ සියල්ලෝම තම ආගම සිහිකර ජාතික ගීය ගායනා කිරීමෙන් පසුව මියගිය රණවිරුවන් හා මියගිය පළාත් පාලන ආයතන නියෝජිතයින් සිහිකර විනාඩියක නිශ්ශබ්දතාවයක් පවත්වන ලදී. ඉන් අනතුරුව ගරු සභාපතිතුමා විසින් න්‍යාය පත්‍රයානුකූලව පසුගිය සභා වාර්තාව ගරු මහා සභාවට ඉදිරිපත් කරන ලදී.

පෙ.ව.9.40ට ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රිනී එන්.එම්. නන්දාවතී මහත්මිය සභා ගර්භයට පැමිණියා ය.

පෙ.ව 9.45ට ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එස්.ඒ.ඩබ්. පතිරණ මහතා සහ ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඩී.ඩබ්.නාලක වසන්ත අබේසේකර මහතා සභා ගර්භයට පැමිණියහ.

01.පසුගිය සභා වාර්තාව සම්මත කර ගැනීම

2022 නොවැම්බර් මස 09 වන දින පැවති මහා සභා රැස්වීම් වාර්තාව සම්මත කර ගැනීමට ගරු සභාපතිතුමා විසින් ගරු මහා සභාවට ඉදිරිපත් කරන ලදි.

ගරු සභාපතිතුමා

සංශෝධන ඇත්නම් ඉදිරිපත් කරන ලෙසත් එසේ නොමැතිනම් පසුගිය සභා වාර්තාව සම්මත කිරීම සුදුසුයි.

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එච්.පී. ආනන්ද කුලතිලක මහතා

ගරු සභාපතිතුමා විසින් ඉදිරිපත් කරන ලද 2022.11.09 වන දින පැවති මහා සභා රැස්වීම් වාර්තාව පිළිගතහැකි සංශෝධන රහිත සත්‍ය වාර්තාවක් බවට මා විසින් යෝජනා කරනවා.

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එස්.ඒ.ඩබ්. පතිරණ මහතා

එම යෝජනාව මා විසින් ස්ථිර කරනවා.

යෝජනා ස්ථිරත්වයෙන් අනතුරුව 2022.11.09 වන දින පැවති මහා සභා රැස්වීම් වාර්තාව සංශෝධන රහිතව ඒකමතිකව සභා සම්මත විය.

පෙ.ව.9.50ට ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එස්. නිලාම් මහතා සහ ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රිනී ඩී.පී.නිරෝෂා දිල්රුක්ෂිකා ජයසේකර මහත්මිය සභා ගර්භයට පැමිණියහ.

02. ගරු සභාපතිතුමාගේ විශේෂ නිවේදන - ඇත

01. 2022 අගෝස්තු හා සැප්තැම්බර් මාසයට අදාළ මහා සභා රැස්වීම් වාර්තාවේ නිරීක්ෂණ ඇතුළත් කරමින් පළාත් පාලන සහකාර කොමසාරිස්තුමිය විසින් ඉදිරිපත් කර ඇති ලිපි සභා ගත කරමි.

02.රජය මගින් ක්‍රියාත්මක කරනු ලබන ජපන් හා කොරියා රැකියා ලබාදීමේ වැඩසටහන සඳහා භාෂා නිපුණතාවය ලබාදීම පිළිබඳව හෙල්පින් සිලෝන් ෆවුන්ඩේෂන් ආයතනය විසින් ඉදිරිපත් කරන ලද ලිපිය සභාගත කරමි.

03. ගඟ ඉහළ කෝරළේ ප්‍රාදේශීය සභාව මගින් ක්‍රියාත්මක කරනු ලබන ටේලරින් ක්‍රමයට ඇඳුම් මැසීමේ පාඨමාලාවේ මැහුම් උපදේශිකාව සඳහා මාසිකව ගෙවනු ලබන දීමනාව වශයෙන් එක් පාඨමාලාවක් සඳහා

රු.2500.00 බැගින් වැඩි කිරීමටත් ඒ අනුව පාඨමාලා 2ක් සඳහා දීමනාව වශයෙන් රු.25,000.00ක මුදලක් සභා අරමුදලින් ගෙවීම සඳහා ගරු ආණ්ඩුකාරතුමාගේ අනුමැතිය ලැබී ඇති බව දන්වමින් මධ්‍යම පළාත් ආණ්ඩුකාර ලේකම්තුමා විසින් යොමු කරන ලද ලිපිය සභාගත කරමි.

04.ශ්‍රී චක්කින්දාරාම විහාරයේ විහාරාධිපති ස්වාමින් වහන්සේ විසින් කරන ලද ඉල්ලීම අනුව ගම්පොළ පුරවරයේ සංවිධානය වන උදුවප් පෙරහැර සඳහා අප පළාත් පාලන ආයතනයේ සහයෝගය ලබාදෙන ලෙස ඉල්ලමින් පළාත් පාලන සහකාර කොමසාරිස්තුමිය විසින් ඉදිරිපත් කර ඇති ලිපිය සභා ගත කරමි.

පෙ.ව.9.55ට ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඩී.පී.පී. විශ්වජිත් ගංගා ප්‍රේමලාල් ගුරුගේ මහතා සභා ගර්භයට පැමිණියේ ය.

පෙ.ව.10.00ට ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රිනී ආර්.පී. පී. ඉෂංකා ලක්මාලි සෙනෙවිරත්න මහත්මිය සභා ගර්භයට පැමිණියා ය.

<u>03. සභාවට ලැබී ඇති සංදේශ, පෙත්සම්, පැමිණිලි, හා සන්නිවේදන - නැත</u>

<u>04. යථා පරිදි කල්දී ඇති ප්‍රශ්න - ඇත</u>

<u>I. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රිනී චන්ද්‍රා අලුත්ගමගේ මහත්මිය විසින් ඉදිරිපත් කරන ලද ප්‍රශ්න</u>

පැරණි ප්‍රාදේශීය සභා ගොඩනැගිල්ල සහ ප්‍රාදේශීය සභා පාර සම්බන්ධව

1.ඉඩම පරිහරණය කිරීමට ලී මෝල් හිමියා මාසික බදු කොපමණ ගෙවනවාද?

2.බදු ගිවිසුමේ පිටපතක් සභාගත කර තිබේද?

3.නියම බදුකරුගේ නම හා ලිපිනය දැනසිටීද?

4.බදු දී ඇති කාලය කොපමණද?

5.කුමන බදු පදනමක් මත බදු දුන්නාද ?

6.සභාව සතු ඉඩමට යන ප්‍රවේශ මාර්ගයට අලාභ වී ඇත්ද?

7.එම මාර්ගය ප්‍රති- සංස්කරණය කිරීම සඳහා අත්සන් කළ ගිවිසුමක් තිබේද?

පිළිතුරු-

1. ඉඩම පරිහරණය කිරීමට ලී මෝල් හිමියා මාසික බදු කොපමණ ගෙවනවාද?

පිළිතුර - ඉඩම පරිහරණය සඳහා රු.10,000.00ක මාසික බදු මුදලක් තීරණය කර ඇත.

2.බදු ගිවිසුමේ පිටපතක් සභාගත කර තිබේද?

පිළිතුර - බදු ගිවිසුම සභාගත කර ඇත.

3.නියම බදුකරුගේ නම හා ලිපිනය දැනසිටීද?

පිළිතුර -ඒ.එම්.ටී.එන්.අබේසේකර මයා,අංක 40,කීරපනේ ,ගම්පොළ.

4.බදු දී ඇති කාලය කොපමණද?

පිළිතුර - 2022-12-31 වන දිනෙන් අවසන් වේ.

5.කුමන බදු පදනමක් මත බදු දුන්නාද ?

පිළිතුර - වාර්ෂික බදු පදනම මත

6.සභාව සතු ඉඩමට යන ප්‍රවේශ මාර්ගයට අලාභ වී ඇත්ද?

පිළිතුර - ප්‍රවේශ මාර්ගය අබලන් තත්ත්වයේ ඇත.මාර්ගය සෑදීමට අවශ්‍ය කටයුතු සිදුකෙරෙමින් පවතී.

7.එම මාර්ගය ප්‍රති- සංස්කරණය කිරීම සඳහා අත්සන් කළ ගිවිසුමක් තිබේද?

පිළිතුර - මාර්ගය ප්‍රතිසංස්කරණය පිළිබඳ ගිවිසුමේ කොන්දේසි ඇතුළත් වී නොමැත.

05.යථා පරිදි කල්දී ඇති යෝජනා - ඇත

05:01 ගරු සභාපතිතුමා විසින් ඉදිරිපත් කරන ලද යෝජනා

05:01:01 ගරු සභාපතිතුමා විසින් ඉදිරිපත් කරන ලද යෝජනාව සභාගත කරන ලදී.

2022 සැප්තැම්බර් 20 වන දින තීරණ අංක 05:01:09 යටතේ මහ සභාවේ සම්මත වූ මගේ පහත යෝජනාව,1987 අංක 15 දරණ ප්‍රාදේශීය සභා පනතේ 11 වන වගන්තිය සමග කියවිය යුතු 184 වන වගන්තිය ප්‍රකාරව අමාත්‍යතුමාගේ 1988.01.13 දිනැති 488/16 ගැසට් පත්‍රයෙන් ප්‍රසිද්ධ කරන ලද අංක 11 දරණ ප්‍රාදේශීය සභා රීතියේ අංක (5)දරණ උපවගන්තියට අනුකූල ලෙස මෙයින් පරිච්ජින්න කිරීමටත් ඊට පහතින් වූ යෝජනාව ඇතුළත් කිරීමටත් මා විසින් ගරු මහා සභාවට යෝජනා කරමි.

දැනට සම්මත වී ඇති හා පරිච්ජින්න කළ යුතු යෝජනාව

2022-04-26 දින පැවති මහා සභාවේ තීරණ අංක 05:01:02 යටතේ මැනුම් කර ගැසට් කිරීම සඳහා සභා අනුමැතිය ලද ගඟ ඉහළ කෝරළේ ප්‍රාදේශීය සභාවට අයත් මාර්ග 09ක් මැනුම් කිරීම අවසන් බැවින් වසර තුනක කාල සීමාවක් ඇතුළත නීත්‍යනුකූලව ගැසට් කිරීම සඳහා ගරු විෂයභාර අමාත්‍යතුමාගේ අනුමැතිය ලබා ගැනීම සුදුසු බවට ගරු මහා සභාවට යෝජනා කරමි.

නව යෝජනාව

2022-04-26 දින පැවති මහා සභාවේ තීරණ අංක 05:01:02 යටතේ මැනුම් කර ගැසට් කිරීම සඳහා සභා අනුමැතිය ලද ගඟ ඉහළ කෝරළේ ප්‍රාදේශීය සභාවට අයත් පහත සඳහන් මාර්ග 09ක් මැනුම් කිරීම අවසන් බැවින් වසර තුනක අවසරලත් කාලසීමාවක් තුළ එනම් 2022-11-01 සිට 2025-11-01 දක්වා කාල සීමාව ඇතුළත නීත්‍යනුකූලව ගැසට් කිරීම සඳහා ගරු විෂයභාර අමාත්‍යතුමාගේ අනුමැතිය ලබා ගැනීම සුදුසු බවට ගරු මහා සභාවට යෝජනා කරමි.

| අනු අංකය | මාර්ගයේ නම | දිග (කි.මි/මි) | පළල (අඩි) | පිඹුරුපත් අංකය |
|---|---|---|---|---|
| 01 | රජ්ඇල අසල සිට ගම්පොලවෙල ප්‍රධාන පාරට සම්බන්ධ වන මහපුරණ පාර | 01Km | 12 | 3418 |
| 02 | ඇත්ගාල ප්‍රධාන පාර | 02km | 14 | 3417 |
| 03 | සිංහපුරගම මැද පාර | 750m | 10 | 3419 |
| 04 | වැටකේදෙණිය සිට උඩුවැල්ල දක්වා පාර | 3.5km | 10 | 3421 |
| 05 | යටපාන බුන්නාව හරහා තියඹරාමය දක්වා පාර | 750m | 10 | 3420 |
| 06 | පරගල බස්නැවතුම්පොල අසල සිට පරගල නව ජනපදය පාර | 2km | 10 | 3413 |
| 07 | කොලුවල වැලිහිරියේ සිට බටගොල්ල දක්වා පාර | 1.7km | 10 | 3416 |
| 08 | මීතලාව නාගහමුල හන්දියේ සිට ගිරාඋල්ල පන්සල හරහා ප්‍රධාන පාරට සම්බන්ධ වන අතුරු මාර්ගය | 1.5km | 10 | 3415 |

| | | | | |
|---|---|---|---|---|
| 09 | අලුගොල්ලේ සිට රන්තැටියාවත්තට යන පාර | 1km | 10 | 3414 |

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී පූජ්‍ය පට්ටිපොල සුමනරතන හිමි

එම යෝජනාව මා විසින් ස්ථිර කරනවා.

ගරු සභාපතිතුමා

2022 සැප්තැම්බර් 20 වන දින තීරණ අංක 05:01:09 යටතේ මහ සභාවේ සම්මත වූ යෝජනාව පරිච්ඡින්න කර 2022-04-26 දින පැවති මහා සභාවේ තීරණ අංක 05:01:02 යටතේ මැනුම් කර ගැසට් කිරීම සඳහා සභා අනුමැතිය ලද ගඟ ඉහළ කෝරළේ ප්‍රාදේශීය සභාවට අයත් ඉහත සඳහන් මාර්ග 09 මැනුම් කිරීම අවසන් බැවින් වසර තුනක අවසරලත් කාලසීමාවක් තුළ එනම් 2022-11-01 සිට 2025-11-01 දක්වා කාල සීමාව ඇතුළත නීත්‍යනුකූලව ගැසට් කිරීම සඳහා ගරු විෂයභාර අමාත්‍යතුමාගේ අනුමැතිය ලබා ගැනීම සුදුසු බවට ගරු මහා සභාවට යෝජනා කරනවා. මේ පිළිබඳව අදහස් දැක්වීමට අවස්ථාව ලබාදෙනවා.

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එම්.පී. අබේරත්න බණ්ඩාර මහතා

ගරු සභාපතිතුමනි,සමහර මාර්ගවල දැනට භාවිතා වන නම හා මෙහි සඳහන් කර ඇති නමත් අතර ගැටළුවක් තිබෙනවා.

ගරු සභාපතිතුමා

ගරු මන්ත්‍රීතුමා සඳහන් කරන්නේ ඇත්ගාල මාර්ගය සම්බන්ධව විය යුතුයි.බංගලාව පාර අවසන් වන්නේ ක්‍රිස්බෝ ආයතනයට පහළින් නමුත් අපි මෙම පාර මැනුම් කර ඇත්තේ බංගලාව පාරෙන් ගොස් නැවත පැමිණ උඩගම පාසල අසලින් ප්‍රධාන පාරට සම්බන්ධවන කොටසටයි.බංගලාව පාරට යන තෙක් බංගලාව පාර වශයෙන් ද එතැන් සිට සිංහපුර ගම මැද පාර වශයෙන් ද නම් කරන බවයි.නැත්නම් මෙය ගැසට් කිරීම අපහසුයි.

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එච්.පී. ආනන්ද කුලතිලක මහතා

ඉඩම්වල පිඹුරුපත්වල මෙම මාර්ගය පිළිබඳව සටහන්ව ඇති ආකාරයත් සොයා බලා ඒවාටද ගැටළුවක් ඇති නොවන ආකාරයෙන් කටයුතු කිරීම සුදුසු බව මගේ අදහසයි.මීතලාව නාගහමුල හන්දියේ සිට ගිරාඋල්ල පන්සල හරහා ප්‍රධාන පාරට සම්බන්ධ වන අතුරු මාර්ගය වශයෙන් සඳහන් වන්නේ උද්දල්තුඩුවට යන පාර වුවත් වෙනත් කිසිවෙකුට එය තැලිහුන්නට යන මාර්ගය බවට තර්ක කළ හැකියි.

ගරු සභාපතිතුමා

ගරු මන්ත්‍රීතුමනි,මෙය ගැසට් කිරීමේදී මාර්ගය දෙපස ජනතාවගෙන් විරෝධතා කැඳවනවා.එම අවස්ථාවේදී ගැටළුවක් මතු වුවහොත් විසඳා ගැනීම සුදුසු බව මගේ අදහසයි.ප්‍රධාන පාර වන්නේ කරගල ගිරාඋල්ල ප්‍රධාන මාර්ගය බව සඳහන් කිරීම සුදුසුයි.වෙනත් අදහසක් ඉදිරිපත් නොවන බව පෙනී යනවා.

තීරණය

2022-04-26 දින පැවති මහා සභාවේ තීරණ අංක 05:01:02 යටතේ මැනුම් කර ගැසට් කිරීම සඳහා සභා අනුමැතිය ලද ගඟ ඉහළ කෝරළේ ප්‍රාදේශීය සභාවට අයත් රජඇල අසල සිට ගම්පොලවෙල ප්‍රධාන පාරට සම්බන්ධ වන මහපුරණ පාර , ඇත්ගාල ප්‍රධාන පාර ,සිංහපුරගම මැද පාර , වැටකේදෙණිය සිට උඩුවැල්ල දක්වා පාර , යටපාන බුන්නාව හරහා තියඹරාමය දක්වා පාර , පරගල බස්නැවතුම්පොල අසල සිට පරගල නව ජනපදය පාර , කොලුවල වැලිහිරියේ සිට බටගොල්ල දක්වා පාර , මීතලාව නාගහමුල හන්දියේ සිට ගිරාඋල්ල පන්සල හරහා ප්‍රධාන පාරට සම්බන්ධ වන අතුරු මාර්ගය , අලුගොල්ලේ සිට රන්තැටියාවත්තට යන පාර යන මාර්ග මැනුම් කිරීම අවසන් බැවින් වසර තුනක අවසරලත් කාලසීමාවක් තුළ එනම් 2022-11-01 සිට 2025-11-01 දක්වා කාල සීමාව ඇතුළත නීත්‍යනුකූලව ගැසට් කිරීම සඳහා ගරු විෂයභාර අමාත්‍යතුමාගේ අනුමැතිය ලබා ගැනීම සුදුසු බවට ගරු මහා සභාව තීරණය කිරීමෙන් අනතුරුව එම යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

**05:01:02 ගරු සභාපතිතුමා විසින් ඉදිරිපත් කරන ලද යෝජනාව සභාගත කරන ලදී.**

**2023 වර්ෂය සඳහා සකස් කරන ලද වාර්ෂික සංවර්ධන සැළැස්ම, කෙටිකාලීන සැළැස්ම, මධ්‍යකාලීන සැළැස්ම හා දිගු කාලීන හෙවත් උපාය මාර්ගික සැළැස්ම සඳහා ගරු මහා සභාවේ අනුමැතිය ලබාදීම සුදුසු බවට ගරු මහා සභාවට යෝජනා කරමි.**

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී පූජ්‍ය පට්ටිපොල සුමනරතන හිමි**

**එම යෝජනාව මා විසින් ස්ථිර කරනවා.**

**ගරු සභාපතිතුමා**

**2023 වර්ෂය සඳහා ගඟ ඉහළ කෝරළේ ප්‍රාදේශීය සභාව මඟින් සකස් කරන ලද වාර්ෂික සංවර්ධන සැළැස්ම, සිව් අවුරුදු සැළැස්ම, කෙටිකාලීන සැළැස්ම, මධ්‍යකාලීන සැළැස්ම හා දිගු කාලීන හෙවත් උපාය මාර්ගික සැළැස්ම සඳහා ගරු මහා සභාවේ අනුමැතිය ලබාදීම සුදුසු බවට ගරු මහා සභාවට යෝජනා කරනවා. මේ පිළිබඳව අදහස් දැක්වීමට අවස්ථාව ලබාදෙනවා.**

**ගරු සභාපතිතුමා**

**වෙනත් අදහසක් ඉදිරිපත් නොවන බව පෙනී යනවා.**

**තීරණය**

**2023 වර්ෂය සඳහා සකස් කරන ලද වාර්ෂික සංවර්ධන සැළැස්ම, සිව් අවුරුදු සැළැස්ම, කෙටිකාලීන සැළැස්ම, මධ්‍යකාලීන සැළැස්ම හා දිගු කාලීන හෙවත් උපාය මාර්ගික සැළැස්ම සඳහා ගරු මහා සභාවේ අනුමැතිය ලබාදීම සුදුසු බවට ගරු මහා සභාව තීරණය කිරීමෙන් අනතුරුව එම යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.**

**05:01:03 ගරු සභාපතිතුමා විසින් ඉදිරිපත් කරන ලද යෝජනාව සභාගත කරන ලදී.**

**2023 වර්ෂය සඳහා සකස් කරන ලද ගඟ ඉහළ කෝරළේ ප්‍රාදේශීය සභාවේ ක්‍රියාත්මක සැළැස්ම සඳහා ගරු මහා සභාවේ අනුමැතිය ලබාදීම සුදුසු බවට ගරු මහා සභාවට යෝජනා කරමි.**

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එම්.ජී.ප්‍රසන්න විමල් මනතුංග මහතා**

**එම යෝජනාව මා විසින් ස්ථිර කරනවා.**

**ගරු සභාපතිතුමා**

**ගඟ ඉහළ කෝරළේ ප්‍රාදේශීය සභාව මඟින් 2023 වර්ෂය සඳහා සකස් කරන ලද ක්‍රියාත්මක සැළැස්ම සඳහා ගරු මහා සභාවේ අනුමැතිය ලබාදීම සුදුසු බවට මා ගරු මහා සභාවට යෝජනා කරනවා.වෙනත් අදහස් ඇත්නම් ඉදිරිපත් කිරීමටත් එසේ නොමැතිනම් මෙම යෝජනාව සභා සම්මත කර ගන්නා ලෙසත් මා ගරු මහා සභාවෙන් ඉල්ලා සිටිනවා.**

**තීරණය**

**2023 වර්ෂය සඳහා සකස් කරන ලද ගඟ ඉහළ කෝරළේ ප්‍රාදේශීය සභාවේ ක්‍රියාත්මක සැළැස්ම සඳහා ගරු මහා සභාවේ අනුමැතිය ලබාදීම සුදුසු බවට ගරු මහා සභාව තීරණය කිරීමෙන් අනතුරුව එම යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.**

05:01:04 ගරු සභාපතිතුමා විසින් ඉදිරිපත් කරන ලද යෝජනාව සභාගත කරන ලදී.

2023 වර්ෂයේ සාමාන්‍ය මහා සභා රැස්වීම් පැවැත්විය යුතු දිනයන් හා වේලාව පෙර වර්ෂයේ අවසන් මහා සභා රැස්වීමේදි සභා සම්මුතියක් මගින් තීරණය කර ගැනිමට අවශ්‍යව ඇති හෙයින් 2023 වර්ෂයේ පහත සඳහන් කර ඇති ආකාරයට සෑම මසකම තුන් වන අඟහරුවාදා දිනයේ පෙ:ව: 09.30ට ගරු මහා සභා රැස්වීම් පැවැත්වීම සුදුසු බවට ගරු මහ සභාවට යෝජනා කරමි.

| මාසය | දිනය | මාසය | දිනය |
|---|---|---|---|
| ජනවාරි | 17 | ජූලි | 18 |
| පෙබරවාරි | 21 | අගෝස්තු | 15 |
| මාර්තු | 21 | සැප්තැම්බර් | 19 |
| අප්‍රේල් | 18 | ඔක්තෝම්බර් | 17 |
| මැයි | 16 | නොවැම්බර් | 21 |
| ජූනි | 20 | දෙසැම්බර් | 19 |

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඒ.ඒ. අජිත් ප්‍රියන්ත බණ්ඩාර මහතා

එම යෝජනාව මා විසින් ස්ථිර කරනවා.

ගරු සභාපතිතුමා

2023 වර්ෂයේ මහා සභා රැස්වීම් පැවැත්විය යුතු දිනයන් පෙර වර්ෂයේ තීරණය කළයුතු බැවින් ලබන වසරේ සෑම මසකම තුන්වන සතියේ අඟහරුවාදා දිනය ගරු මහා සභාව පැවැත්වෙන දිනය ලෙස සළකා ඉහත දින යෝජනා කරන අතර එම යෝජිත දිනය රජයේ නිවාඩු දිනයක් වුවහොත් ඊට පෙර දිනය සභාව පැවැත්වෙන දිනය ලෙස තීරණය කිරීමත් සුදුසු බවට ගරු මහා සභාවට යෝජනා කරනවා.

ගරු සභාපතිතුමා

මේ පිළිබඳව විරුද්ධත්වයක් නොමැතිබව පෙනීයන නිසා මෙම යෝජනාව සභා සම්මත කර ගන්නා ලෙස මා ගරු මහා සභාවෙන් ඉල්ලා සිටිනවා.

තීරණය

2023 වර්ෂයේ ඉහත සඳහන් කර ඇති ආකාරයට සෑම මසකම තුන් වන අඟහරුවාදා දිනයේ පෙ:ව: 09.30ට මහා සභා රැස්වීම් පැවැත්වීම සුදුසු බවට ගරු මහ සභාව තීරණය කිරීමෙන් අනතුරුව එම යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

05:01:05 ගරු සභාපතිතුමා විසින් ඉදිරිපත් කරන ලද යෝජනාව සභාගත කරන ලදී.

2023 වර්ෂය සඳහා සකස් කරන ලද ඵලදායිතා සැළැස්ම හා හරිත ඵලදායිතා සැළැස්ම සඳහා ගරු මහා සභාවේ අනුමැතිය ලබාදීම සුදුසු බවට ගරු මහා සභාවට යෝජනා කරමි.

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එම්.ඒ. සුමේධ අලුත්ගමගේ මහතා

එම යෝජනාව මා විසින් ස්ථිර කරනවා.

ගරු සභාපතිතුමා

2023 වර්ෂය සඳහා සකස් කරන ලද ඵලදායිතා සැළැස්ම හා හරිත ඵලදායිතා සැළැස්ම සඳහා ගරු මහා සභාවේ අනුමැතිය ලබාදීම සුදුසු බවට යෝජනා කරනවා.

ගරු සභාපතිතුමා

වෙනත් අදහසක් ඉදිරිපත් නොවන බව පෙනීයනවා.

තීරණය

2023 වර්ෂය සඳහා සකස් කරන ලද ඵලදායිතා සැළැස්ම හා හරිත ඵලදායිතා සැළැස්ම සඳහා ගරු මහා සභාවේ අනුමැතිය ලබාදීම සුදුසු බවට ගරු මහා සභාව තීරණය කිරීමෙන් අනතුරුව එම යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

05:01:06 ගරු සභාපතිතුමා විසින් ඉදිරිපත් කරන ලද යෝජනාව සභාගත කරන ලදී.

ප්‍රාදේශීය සභා අරමුදලෙහි ආදායම් හා වියදම් සම්බන්ධයෙන් ඊට අනුශාංගික කරුණු සම්බන්ධයෙන් ප්‍රාදේශීය සභාවට උපදෙස් ලබාදීම සඳහා ද ප්‍රාදේශීය සභාව විසින් පවරනු ලබන බලතල හා කාර්යය හා කර්තව්‍යය ක්‍රියාත්මක කිරීම සඳහා ද ප්‍රාදේශීය සභාව සඳහා මුදල් හා ප්‍රතිපත්ති කාරක සභාවක් ප්‍රාදේශීය සභා පනතේ 12වන වගන්තිය යටතේ පත්කර ගත යුතු බවත්, එසේ පත්කර ගනු ලබන 2023 වර්ෂයේ මුදල් හා ප්‍රතිපත්ති කාරක සභාවේ සංයුතිය පහත උප ලේඛනයේ සඳහන් ආකාරයට විය යුතු බවටත් යෝජනා කරමි.

උප ලේඛනය

| | | |
|---|---|---|
| 01.පී.ඕ.පී.ඩී.නදීර බණ්ඩාර ජයසේකර මහතා | ගරු ප්‍රාදේශීය සභා සභාපති | - කමිටු සභාපති |
| 02.ඒ. මහින්දරත්න අලුත්ගමගේ මහතා | ගරු ප්‍රාදේශීය සභා උප සභාපති | - සාමාජික |
| 03.ආර්.පී. ගුණරත්න මහතා | ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී | - සාමාජික |
| 04.එස්.ඒ.ඩබ්.පතිරණ මහතා | ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී | - සාමාජික |
| 05.ඩී.ඩබ්.නාලක වසන්ත අබේසේකර මහතා | ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී | - සාමාජික |
| 06.එම්.පී.ප්‍රසන්න විමල්මනතුංග මහතා | ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී | - සාමාජික |
| 07.ඩී.පී.ඩී.විශ්වජිත් ගංගා ප්‍රේමලාල් ගුරුගේ මහතා | ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී | - සාමාජික |
| 08.ඒ.ඒ. අජිත් ප්‍රියන්ත බණ්ඩාර මහතා | ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී | - සාමාජික |
| 09.පූජ්‍ය පට්ටිපොල සුමනරතන හිමි | ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී | - සාමාජික |
| 10.එම්.ඒ.සුමේධ අලුත්ගමගේ මහතා | ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී | - සාමාජික |

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඩී.පී.ඩී.විශ්වජිත් ගංගා ප්‍රේමලාල් ගුරුගේ මහතා

එම යෝජනාව මා විසින් ස්ථිර කරනවා.

ගරු සභාපතිතුමා

මේ පිළිබඳව විරුද්ධත්වයක් නොමැති බව පෙනීයන නිසා මෙම යෝජනාව සභා සම්මත කර ගන්නා ලෙස මා ගරු මහා සභාවෙන් ඉල්ලා සිටිනවා.

තීරණය

ප්‍රාදේශීය සභා අරමුදලෙහි ආදායම් හා වියදම් සම්බන්ධයෙන් ඊට අනුෂාංගික කරුණු සම්බන්ධයෙන් ප්‍රාදේශීය සභාවට උපදෙස් ලබාදීම සඳහා ද ප්‍රාදේශීය සභාව විසින් පවරනු ලබන බලතල හා කාර්යය හා කර්තව්‍යය ක්‍රියාත්මක කිරීම සඳහා ද ප්‍රාදේශීය සභාව සඳහා මුදල් හා ප්‍රතිපත්ති කාරක සභාවක් ප්‍රාදේශීය සභා පනතේ 12වන වගන්තිය යටතේ පත්කර ගත යුතු බවත්, එසේ පත්කර ගනු ලබන 2023 වර්ෂයේ මුදල් හා ප්‍රතිපත්ති කාරක සභාවේ සංයුතිය ඉහත උප ලේඛනයේ සඳහන් ආකාරයට විය යුතු බවටත් ගරු මහා සභාව තීරණය කිරීමෙන් අනතුරුව එම යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

05:01:07 ගරු සභාපතිතුමා විසින් ඉදිරිපත් කරන ලද යෝජනාව සභාගත කරන ලදී.

ප්‍රාදේශීය සභා අරමුදලෙහි ආදායම් හා වියදම් සම්බන්ධයෙන් හා ඊට අනුෂාංගික කරුණු සම්බන්ධයෙන් ප්‍රාදේශීය සභාවට උපදෙස් ලබාදීම සඳහා ද ප්‍රාදේශීය සභාව විසින් පවරනු ලබන බලතල හා කාර්යය හා කර්තව්‍යය ක්‍රියාත්මක කිරීම සඳහා ද ප්‍රාදේශීය සභාව සඳහා කාර්මික හා කර්මාන්ත කමිටු කාරක සභාවක් ප්‍රාදේශීය සභා පනතේ 12 වන වගන්තිය යටතේ පත්කර ගත යුතු බවත්, එසේ පත්කර ගනු ලබන 2023 වර්ෂයේ කාර්මික හා කර්මාන්ත කමිටු කාරක සභාවේ සංයුතිය පහත උප ලේඛනයේ සඳහන් ආකාරයට විය යුතු බවටත් යෝජනා කරමි.

උප ලේඛනය

| | | |
|---|---|---|
| 01.එම්.පී. ප්‍රසන්න විමල් මනතුංග මහතා | ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී | - කමිටු සභාපති |
| 02. චන්ද්‍රා අලුත්ගමගේ මහත්මිය | ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රිනී | - සාමාජික |
| 03.ඒ.පී. කොල්වින් සිල්වා මහතා | ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී | - සාමාජික |
| 04.ඩබ්.එම්. උදය කුමාර බණ්ඩාර මහතා | ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී | - සාමාජික |
| 05. ඒ.ඒ. අජිත් ප්‍රියන්ත බණ්ඩාර මහතා | ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී | - සාමාජික |
| 06.ඩී.පී.ඩී.විශ්වජිත් ගංගා ප්‍රේමලාල් ගුරුගේ මහතා | ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී | - සාමාජික |
| 07. එස්.නිලාම් මහතා | ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී | - සාමාජික |
| 08.එච්.පී.ආනන්ද කුලතිලක මහතා | ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී | - සාමාජික |

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඒ.එස්.ඩබ්.පතිරණ මහතා

එම යෝජනාව මා විසින් ස්ථිර කරනවා.

ගරු සභාපතිතුමා

මේ පිළිබඳව විරුද්ධත්වයක් නොමැති බව පෙනී යන නිසා මෙම යෝජනාව සභා සම්මත කර ගන්නා ලෙස මා ගරු මහා සභාවෙන් ඉල්ලා සිටිනවා.

තීරණය

ප්‍රාදේශීය සභා අරමුදලෙහි ආදායම් හා වියදම් සම්බන්ධයෙන් ඊට අනුෂාංගික කරුණු සම්බන්ධයෙන් ප්‍රාදේශීය සභාවට උපදෙස් ලබාදීම සඳහා ද ප්‍රාදේශීය සභාව විසින් පවරනු ලබන බලතල හා කාර්යය හා කර්තව්‍යය ක්‍රියාත්මක කිරීම සඳහා ද ප්‍රාදේශීය සභාව සඳහා කාර්මික හා කර්මාන්ත කමිටු කාරක සභාවක් ප්‍රාදේශීය සභා පනතේ 12වන වගන්තිය යටතේ පත්කර ගත යුතු බවත්, එසේ පත්කර ගනු ලබන 2023 වර්ෂයේ කාර්මික හා කර්මාන්ත කමිටු කාරක සභාවේ සංයුතිය ඉහත උප ලේඛනයේ සඳහන් ආකාරයට විය යුතු බවටත් ගරු මහා සභාව තීරණය කිරීමෙන් අනතුරුව එම යෝජනාව ඒකමතිකව සභා සම්මත විය

05:01:08 ගරු සභාපතිතුමා විසින් ඉදිරිපත් කරන ලද යෝජනාව සභාගත කරන ලදී.

ප්‍රාදේශීය සභා අරමුදලෙහි ආදායම් හා වියදම් සම්බන්ධයෙන් හා ඊට අනුශාංගික කරුණු සම්බන්ධයෙන් ප්‍රාදේශීය සභාවට උපදෙස් ලබාදීම සඳහා ද ප්‍රාදේශීය සභාව විසින් පවරනු ලබන බලතල හා කාර්යය හා කර්තව්‍යය ක්‍රියාත්මක කිරීම සඳහා ද ප්‍රාදේශීය සභාව සඳහා පරිසර හා පහසුකම් පිලිබඳ කාරක සභාවක් ප්‍රාදේශීය සභා පනතේ 12 වන වගන්තිය යටතේ පත්කර ගත යුතු බවත්, එසේ පත්කර ගනු ලබන 2023 වර්ෂයේ පරිසර හා පහසුකම් පිලිබඳ කාරක සභාවේ සංයුතිය පහත උප ලේඛනයේ සඳහන් ආකාරයට විය යුතු බවටත් යෝජනා කරමි.

උප ලේඛනය

| | | |
|---|---|---|
| 01.ඒ.එස්.ඩබ්.පතිරණ මහතා | ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී | -කමිටු සභාපති |
| 02.ඩී.ඩබ්.නාලක වසන්ත අබේසේකර මහතා | ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී | - සාමාජික |
| 03.එම්.පී.ප්‍රසන්න විමල් මනතුංග මහතා | ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී | - සාමාජික |
| 04.චන්ද්‍රා අලුත්ගමගේ මහත්මිය | ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රිනි | - සාමාජික |
| 05.ඒ.පී. කොල්වින් සිල්වා මහතා | ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී | - සාමාජික |
| 06. එස්. නිලාම් මහතා | ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී | - සාමාජික |
| 07.එස්.පී. සරත් කුමාර ලාල් මහතා | ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී | - සාමාජික |
| 08.ඩී.පී.එන්.දිල්රුක්ෂිකා ජයසේකර මහත්මිය | ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රිනී | - සාමාජික |

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඩී.පී.ඩී.විශ්වජිත් ගංගා ප්‍රේමලාල් ගුරුගේ මහතා

එම යෝජනාව මා විසින් ස්ථිර කරනවා.

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ආර්.පී. ගුණරත්න මහතා

පරිසර හා පහසුකම් පිළිබඳ කාරක සභාව සඳහා ඉහත සඳහන් කළ කමිටු සාමාජිකයන්ට අමතරව ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රිනී එන්.එම්. නන්දාවතී මහත්මිය කමිටු සමාජිකාවක වශයෙන් ඇතුළත් කිරීම සුදුසු බව යෝජනා කරනවා.

ගරු ප්‍රාදේශීය සභා උප සභාපති ඒ. මහින්දරත්න අලුත්ගමගේ මහතා

එම යෝජනාව මා විසින් ස්ථිර කරනවා.

ගරු සභාපතිතුමා

මේ පිළිබඳව වෙනත් අදහසක් ඉදිරිපත් නොවන බව පෙනීයන නිසා මෙම යෝජනාව සභා සම්මත කර ගන්නා ලෙස මා ගරු මහා සභාවෙන් ඉල්ලා සිටිනවා.

තීරණය

ප්‍රාදේශීය සභා අරමුදලෙහි ආදායම් හා වියදම් සම්බන්ධයෙන් හා ඊට අනුශාංගික කරුණු සම්බන්ධයෙන් ප්‍රාදේශීය සභාවට උපදෙස් ලබාදීම සඳහා ද ප්‍රාදේශීය සභාව විසින් පවරනු ලබන බලතල හා කාර්යය හා කර්තව්‍යය ක්‍රියාත්මක කිරීම සඳහා ද ප්‍රාදේශීය සභාව සඳහා පරිසර හා පහසුකම් පිලිබඳ කාරක සභාවක් ප්‍රාදේශීය සභා පනතේ 12 වන වගන්තිය යටතේ පත්කර ගත යුතු බවත්, එසේ පත්කර ගනු ලබන 2023

වර්ෂයේ පරිසර හා පහසුකම් පිලිබඳ කාරක සභාවේ සංයුතිය ඉහත උප ලේඛනයේ සඳහන් ආකාරයට විය යුතු බවටත් එයට ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රිනී එන්.එම්.නන්දාවතී මහත්මිය කමිටු සමාජිකයෙකු වශයෙන් ඇතුළත් කිරීම සුදුසු බවටත් ගරු මහා සභාව තීරණය කිරීමෙන් අනතුරුව එම යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

05:01:09 ගරු සභාපතිතුමා විසින් ඉදිරිපත් කරන ලද යෝජනාව සභාගත කරන ලදී.

ප්‍රාදේශීය සභා අරමුදලෙහි ආදායම් හා වියදම් සම්බන්ධයෙන් හා ඊට අනුශාංගික කරුණු සම්බන්ධයෙන් ප්‍රාදේශීය සභාවට උපදෙස් ලබාදීම සඳහා ද ප්‍රාදේශීය සභාව විසින් පවරනු ලබන බලතල හා කාර්යය හා කර්තව්‍යය ක්‍රියාත්මක කිරීම සඳහා ද ප්‍රාදේශීය සභාව සඳහා නිවාස හා ප්‍රජා සංවර්ධන කාරක සභාවක් ප්‍රාදේශීය සභා පනතේ 12 වන වගන්තිය යටතේ පත්කර ගත යුතු බවත්, එසේ පත්කර ගනු ලබන 2023 වර්ෂයේ නිවාස හා ප්‍රජා සංවර්ධන කාරක සභාවේ සංයුතිය පහත උප ලේඛනයේ සඳහන් ආකාරයට විය යුතු බවටත් යෝජනා කරමි.

උප ලේඛනය

| | | |
|---|---|---|
| 01.ඩී.ඩබ්.නාලක වසන්ත අබේසේකර මහතා | ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රි | - කමිටු සභාපති |
| 02. ඩී.පී.ඩී.විශ්වජිත් ගංගා ප්‍රේමලාල් ගුරුගේ මහතා | ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රි | - සාමාජික |
| 03. සුබෝධා ලක්ෂාණි රිබේරා මහත්මිය | ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රිනී | - සාමාජික |
| 04. එම්.පී.අබේරත්න බණ්ඩාර මහතා | ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රි | - සාමාජික |
| 05. එච්.පී.ආනන්ද කුලතිලක මහතා | ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රි | - සාමාජික |
| 06. එම්.ඒ.සුමේධ අලුත්ගමගේ මහතා | ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රි | - සාමාජික |
| 07. ආර්.එම්.චාමික අනුරාධ රත්නායක මහතා | ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රි | - සාමාජික |
| 08. රාජකුමාර් විදුෂණී මහත්මිය | ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රිනී | - සාමාජික |

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එම්.පී.ප්‍රසන්න විමල් මනතුංග මහතා

එම යෝජනාව මා විසින් ස්ථිර කරනවා.

ගරු සභාපතිතුමා

මේ පිළිබඳව වෙනත් අදහසක් ඉදිරිපත් නොවන බව පෙනීයන නිසා මෙම යෝජනාව සභා සම්මත කර ගන්නා ලෙස මා ගරු මහා සභාවෙන් ඉල්ලා සිටිනවා.

තීරණය

ප්‍රාදේශීය සභා අරමුදලෙහි ආදායම් හා වියදම් සම්බන්ධයෙන් හා ඊට අනුශාංගික කරුණු සම්බන්ධයෙන් ප්‍රාදේශීය සභාවට උපදෙස් ලබාදීම සඳහා ද ප්‍රාදේශීය සභාව විසින් පවරනු ලබන බලතල හා කාර්යය හා කර්තව්‍යය ක්‍රියාත්මක කිරීම සඳහා ද ප්‍රාදේශීය සභාව සඳහා නිවාස හා ප්‍රජා සංවර්ධන කාරක සභාවක් ප්‍රාදේශීය සභා පනතේ 12 වන වගන්තිය යටතේ පත්කර ගත යුතු බවත්, එසේ පත්කර ගනු ලබන 2023 වර්ෂයේ නිවාස හා ප්‍රජා සංවර්ධන කාරක සභාවේ සංයුතිය පහත උප ලේඛනයේ සඳහන් ආකාරයට විය යුතු බවටත් ගරු මහා සභාව තීරණය කිරීමෙන් අනතුරුව එම යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

05:01:10 ගරු සභාපතිතුමා විසින් ඉදිරිපත් කරන ලද යෝජනාව සභාගත කරන ලදී.

ගඟ ඉහළ කෝරළේ ප්‍රාදේශීය සභාවේ 2023 වර්ෂයේ ප්‍රසම්පාදන කටයුතු සඳහා මුදල් හා ප්‍රතිපත්ති කාරක සභාවේ සාමාජිකයින්ගෙන් යුතු ප්‍රසම්පාදන කමිටුව පත් කිරීම සුදුසු බවට ගරු මහා සභාවට යෝජනා කරමි.

| | | |
|---|---|---|
| 01. පී.ඕ.පී.ඩී. නදීර බණ්ඩාර ජයසේකර මහතා | ගරු ප්‍රාදේශීය සභා සභාපති - | කමිටු සභාපති |
| 02. ඒ. මහින්දරත්න අලුත්ගමගේ මහතා | ගරු ප්‍රාදේශීය සභා උප සභාපති - | සමාජික |
| 03. ආර්.පී. ගුණරත්න මහතා | ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී - | සමාජික |
| 04. එස්.ඒ.ඩබ්. පතිරණ මහතා | ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී - | සමාජික |
| 05. ඩී.ඩබ්.නාලක වසන්ත අබේසේකර මහතා | ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී - | සමාජික |
| 06. එම්.පී. ප්‍රසන්න විමල් මනතුංග මහතා | ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී - | සමාජික |
| 07. ඩී.පී.ඩී.විශ්වජිත් ගංගා ප්‍රේමලාල් ගුරුගේ මහතා | ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී - | සමාජික |
| 08. ඒ.ඒ. අජිත් ප්‍රියන්ත බණ්ඩාර මහතා | ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී - | සමාජික |
| 09. පූජ්‍ය පට්ටිපොල සුමනරතන හිමි | ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී - | සමාජික |
| 10. එම්.ඒ. සුමේධ අලුත්ගමගේ මහතා | ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී - | සමාජික |

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ආර්.පී. ගුණරත්න මහතා

එම යෝජනාව මා විසින් ස්ථිර කරනවා.

ගරු සභාපතිතුමා

මේ පිළිබඳව වෙනත් අදහසක් ඉදිරිපත් නොවන බව පෙනීයන නිසා මෙම යෝජනාව සභා සම්මත කර ගන්නා ලෙස මා ගරු මහා සභාවෙන් ඉල්ලා සිටිනවා.

තීරණය

ගඟ ඉහළ කෝරළේ ප්‍රාදේශීය සභාවේ 2023 වර්ෂයේ ප්‍රසම්පාදන කටයුතු සඳහා මුදල් හා ප්‍රතිපත්ති කාරක සභාවේ සාමාජිකයින්ගෙන් යුතු ප්‍රසම්පාදන කමිටුව පත් කිරීම සුදුසු බවට ගරු මහා සභාව තීරණය කිරීමෙන් අනතුරුව එම යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

05:01:11 ගරු සභාපතිතුමා විසින් ඉදිරිපත් කරන ලද යෝජනාව සභාගත කරන ලදී.

ගඟ ඉහළ කෝරළේ ප්‍රාදේශීය සභාවේ 2023 වර්ෂයේ ලංසු විවෘත කිරීමේ කමිටුව ලෙස පහත නිලධාරීන්ගෙන් යුත් කමිටුව පත් කිරීම සුදුසු බවට ගරු මහා සභාවට යෝජනා කරමි.

- ප්‍රාදේශීය සභාවේ ලේකම් - ඩී.එම්.එල්.ඩී. දසනායක මිය
- ප්‍රධාන කළමනාකරණ සේවා නිලධාරි - ටී.සී.පී. ද සිල්වා මිය
- ආදායම් පරීක්ෂක - ඩබ්.ජේ.පී. ගුණරත්න මයා

<u>ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එම්.ඒ. සුමේධ අලුත්ගමගේ මහතා</u>

**එම යෝජනාව මා විසින් ස්ථිර කරනවා.**

<u>ගරු සභාපතිතුමා</u>

**මේ සම්බන්ධයෙන් වෙනත් අදහස් ඇත්නම් ඉදිරිපත් කරන ලෙසත් එසේ නොමැති නම් මෙම යෝජනාව සභා සම්මත කර ගන්නා ලෙසත් මා ගරු මහා සභාවෙන් ඉල්ලා සිටිනවා.**

<u>තීරණය</u>

ගඟ ඉහළ කෝරළේ ප්‍රාදේශීය සභාවේ 2023 වර්ෂයේ ලංසු විවෘත කිරීමේ කමිටුව ලෙස ප්‍රාදේශීය සභාවේ ලේකම් - ඩී.එම්.එල්.ඩී. දසනායක මිය, ප්‍රධාන කළමනාකරණ සේවා නිලධාරි - ටී.සී.පී. ද සිල්වා මිය,ආදායම් පරීක්ෂක - ඩබ්.ජේ.පී. ගුණරත්න මයා යන නිලධාරීන්ගෙන් යුත් කමිටුව පත් කිරීම සුදුසු බවට ගරු මහා සභාව තීරණය කිරීමෙන් අනතුරුව එම යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

<u>05:01:12 ගරු සභාපතිතුමා විසින් ඉදිරිපත් කරන ලද යෝජනාව සභාගත කරන ලදී.</u>

ගඟ ඉහළ කෝරළේ ප්‍රාදේශීය සභාවේ 2023 වර්ෂයේ තාක්ෂණ කමිටුව ලෙස පහත නිලධාරීන්ගෙන් යුත් කමිටුව පත් කිරීම සුදුසු බවට ගරු මහා සභාවට යෝජනා කරමි.

- තාක්ෂණ නිලධාරි - ඩබ්.එම්. මද්දුම බණ්ඩාර මයා
- තාක්ෂණ නිලධාරි - ඩී.පී. නදුන් ජයසේකර මයා
- සංවර්ධන නිලධාරි (පරිසර) - පී.පී.එස්.ජේ. කිත්සිරි මයා
- සංවර්ධන නිලධාරි - පී.බී.එන්.එම්.රොද්‍රිගෝ මයා

<u>ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එම්.පී.ප්‍රසන්න විමල් මනතුංග මහතා</u>

**එම යෝජනාව මා විසින් ස්ථිර කරනවා.**

<u>ගරු සභාපතිතුමා</u>

**මේ සම්බන්ධයෙන් වෙනත් අදහස් ඇත්නම් ඉදිරිපත් කරන ලෙසත් එසේ නොමැති නම් මෙම යෝජනාව සභා සම්මත කර ගන්නා ලෙසත් මා ගරු මහා සභාවෙන් ඉල්ලා සිටිනවා.**

<u>තීරණය</u>

ගඟ ඉහළ කෝරළේ ප්‍රාදේශීය සභාවේ 2023 වර්ෂයේ තාක්ෂණ කමිටුව ලෙස තාක්ෂණ නිලධාරි- ඩබ්.එම්. මද්දුම බණ්ඩාර මයා, තාක්ෂණ නිලධාරි - ඩී.පී. නදුන් ජයසේකර මයා ,සංවර්ධන නිලධාරි (පරිසර) - පී.පී.එස්.ජේ. කිත්සිරි මයා ,සංවර්ධන නිලධාරි - පී.බී.එන්.එම්.රොද්‍රිගෝ මයා යන නිලධාරීන්ගෙන් යුත් කමිටුව පත් කිරීම සුදුසු බවට ගරු මහා සභාව තීරණය කිරීමෙන් අනතුරුව එම යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

<u>05:01:13 ගරු සභාපතිතුමා විසින් ඉදිරිපත් කරන ලද යෝජනාව සභාගත කරන ලදී.</u>

ගඟ ඉහළ කෝරළේ ප්‍රාදේශීය සභාවේ 2023 පළමු අර්ධ වර්ෂය සහ දෙවන අර්ධ වර්ෂය සඳහා සකස් කරන ලද අභ්‍යන්තර විගණන සැළැස්ම අනුමත කිරීම සුදුසු බවට ගරු මහා සභාවට යෝජනා කරමි.

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඩබ්.එම්. උදය කුමාර බණ්ඩාර මහතා

**එම යෝජනාව මා විසින් ස්ථිර කරනවා.**

ගරු සභාපතිතුමා

**ගඟ ඉහළ කෝරළේ ප්‍රාදේශීය සභාවේ 2023 පළමු අර්ධ වර්ෂය සහ දෙවන අර්ධ වර්ෂය සඳහා සකස් කරන ලද අභ්‍යන්තර විගණන සැළැස්ම අනුමත කිරීම සුදුසු බවට ගරු මහා සභාවට යෝජනා කරනවා. මේ සම්බන්ධයෙන් වෙනත් අදහස් ඇත්නම් ඉදිරිපත් කරන ලෙසත් එසේ නොමැති නම් මෙම යෝජනාව සභා සම්මත කර ගන්නා ලෙසත් මා ගරු මහා සභාවෙන් ඉල්ලා සිටිනවා.**

තීරණය

**ගඟ ඉහළ කෝරළේ ප්‍රාදේශීය සභාවේ 2023 පළමු අර්ධ වර්ෂය සහ දෙවන අර්ධ වර්ෂය සඳහා සකස් කරන ලද අභ්‍යන්තර විගණන සැළැස්ම අනුමත කිරීම සුදුසු බවට ගරු මහා සභාව තීරණය කිරීමෙන් අනතුරුව එම යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.**

## 05:01:14 ගරු සභාපතිතුමා විසින් ඉදිරිපත් කරන ලද යෝජනාව සභාගත කරන ලදී.

**ගඟ ඉහළ කෝරළේ ප්‍රාදේශීය සභාවේ 2023 වර්ෂය සඳහා සකස් කරන ලද ප්‍රසම්පාදන සැළැස්ම සඳහා ගරු මහා සභාවේ අනුමැතිය ලබා දීම සුදුසු බවට ගරු මහා සභාවට යෝජනා කරමි.**

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඒ.ඒ. අජිත් ප්‍රියන්ත බණ්ඩාර මහතා

**එම යෝජනාව මා විසින් ස්ථිර කරනවා.**

ගරු සභාපතිතුමා

**ගඟ ඉහළ කෝරළේ ප්‍රාදේශීය සභාවේ 2023 වර්ෂය සඳහා සකස් කරන ලද ප්‍රසම්පාදන සැළැස්ම සඳහා ගරු මහා සභාවේ අනුමැතිය ලබා දීම සුදුසු බවට ගරු මහා සභාවට යෝජනා කරනවා. මේ සම්බන්ධයෙන් වෙනත් අදහස් ඇත්නම් ඉදිරිපත් කරන ලෙසත් එසේ නොමැති නම් මෙම යෝජනාව සභා සම්මත කර ගන්නා ලෙසත් මා ගරු මහා සභාවෙන් ඉල්ලා සිටිනවා.**

තීරණය

**ගඟ ඉහළ කෝරළේ ප්‍රාදේශීය සභාවේ 2023 වර්ෂය සඳහා සකස් කරන ලද ප්‍රසම්පාදන සැළැස්ම සඳහා ගරු මහා සභාවේ අනුමැතිය ලබා දීම සුදුසු බවට ගරු මහා සභාව තීරණය කිරීමෙන් අනතුරුව එම යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.**

## 05:01:15 ගරු සභාපතිතුමා විසින් ඉදිරිපත් කරන ලද යෝජනාව සභාගත කරන ලදී.

**2023 වර්ෂය සඳහා සකස් කරන ලද ගඟ ඉහළ කෝරළේ ප්‍රාදේශීය සභාවේ මානව සම්පත් සංවර්ධන පුහුණු සැළැස්ම සඳහා ගරු මහා සභාවේ අනුමැතිය ලබාදීම සුදුසු බවට ගරු මහා සභාවට යෝජනා කරමි.**

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී පූජ්‍ය පට්ටිපොල සුමනරතන හිමි

**එම යෝජනාව මා විසින් ස්ථිර කරනවා.**

ගරු සභාපතිතුමා

**2023 වර්ෂය සඳහා සකස් කරන ලද ගඟ ඉහළ කෝරළේ ප්‍රාදේශීය සභාවේ මානව සම්පත් සංවර්ධන පුහුණු සැළැස්ම සඳහා ගරු මහා සභාවේ අනුමැතිය ලබාදීම සුදුසු බවට ගරු මහා සභාවට යෝජනා කරනවා. මේ**

සම්බන්ධයෙන් වෙනත් අදහස් ඇත්නම් ඉදිරිපත් කරන ලෙසත් එසේ නොමැති නම් මෙම යෝජනාව සභා සම්මත කර ගන්නා ලෙසත් මා ගරු මහා සභාවෙන් ඉල්ලා සිටිනවා.

තීරණය

2023 වර්ෂය සඳහා සකස් කරන ලද ගඟ ඉහළ කෝරළේ ප්‍රාදේශීය සභාවේ මානව සම්පත් සංවර්ධන පුහුණු සැළැස්ම සඳහා ගරු මහා සභාවේ අනුමැතිය ලබාදීම සුදුසු බවට ගරු මහා සභාව තීරණය කිරීමෙන් අනතුරුව එම යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

05:01:16 ගරු සභාපතිතුමා විසින් ඉදිරිපත් කරන ලද යෝජනාව සභාගත කරන ලදී.

ගඟ ඉහළ කෝරළේ ප්‍රාදේශීය සභාවේ 2023 වර්ෂය සඳහා සකස් කරන ලද කසළ කළමනාකරණ වැඩ සැළැස්ම සඳහා ගරු මහා සභාවේ අනුමැතිය ලබා දීම සුදුසු බවට ගරු මහා සභාවට යෝජනා කරමි.

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එම්.ඒ. සුමේධ අලුත්ගමගේ මහතා

එම යෝජනාව මා විසින් ස්ථිර කරනවා.

ගරු සභාපතිතුමා

ගඟ ඉහළ කෝරළේ ප්‍රාදේශීය සභාවේ 2023 වර්ෂය සඳහා සකස් කරන ලද කසළ කළමනාකරණ වැඩ සැළැස්ම සඳහා ගරු මහා සභාවේ අනුමැතිය ලබා දීම සුදුසු බවට යෝජනා කරනවා. මේ සම්බන්ධයෙන් වෙනත් අදහස් ඇත්නම් ඉදිරිපත් කරන ලෙසත් එසේ නොමැති නම් මෙම යෝජනාව සභා සම්මත කර ගන්නා ලෙසත් මා ගරු මහා සභාවෙන් ඉල්ලා සිටිනවා.

තීරණය

ගඟ ඉහළ කෝරළේ ප්‍රාදේශීය සභාවේ 2023 වර්ෂය සඳහා සකස් කරන ලද කසළ කළමනාකරණ වැඩ සැළැස්ම සඳහා ගරු මහා සභාවේ අනුමැතිය ලබා දීම සුදුසු බවට ගරු මහා සභාව තීරණය කිරීමෙන් අනතුරුව එම යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

05:01:17 ගරු සභාපතිතුමා විසින් ඉදිරිපත් කරන ලද යෝජනාව සභාගත කරන ලදී.

පහත සදහන් 10% අතරැඳවුම් සඳහා වසර දෙකක් ඉක්මවා ඇතත් අදාළ කොන්ත්‍රාත් සමිති මගින් ඉල්ලීම් ඉදිරිපත් කර නොමැති බැවින් රජයේ ආදායමට ලබා ගැනීම සඳහා ගරු මහා සභාවේ අනුමැතිය ලබා දීම සුදුසු බවට ගරු මහා සභාවට යෝජනා කරමි.

| අනු අංකය | ව්‍යාපෘතිය | වර්ෂය | මුදල රු.ශත |
|---|---|---|---|
| 1 | සියරා කන්ට්‍රක්ෂන්ස් | 2013 | 2425894.80 |
| 2 | හල්දොල ග්‍රාම සංවර්ධන සමිතිය | 2017 | 50000.00 |
| 3 | ප්‍රගති ග්‍රාම සංවර්ධන සමිතිය | 2018 | 2996.35 |
| 4 | ප්‍රගති ග්‍රාම සංවර්ධන සමිතිය | 2019 | 2448.00 |
| 5 | සමගි ගොවි සංවිධානය-පැල්ලපිටිය උතුර | 2019 | 8690.00 |
| 6 | රන්කෙත ගොවි සංවිධානය ඇත්ගාල | 2019 | 20000.00 |
| | එකතුව | | 2510029.15 |

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ආර්.පී. ගුණරත්න මහතා

එම යෝජනාව මා විසින් ස්ථිර කරනවා.

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී  ආර්.පී. ගුණරත්න මහතා

ගරු සභාපතිතුමනි,මාගේ ධුර කාලයේදී සියරා කන්ට්‍රක්ෂන්ස් මගින් සකස් කළ මාර්ග නිසි ප්‍රමිතියෙන් සාදා නිම නොකිරීම නිසා මුදල් ගෙවූයේ නැහැ.එම මුදල් එම ව්‍යාපෘති ක්‍රියාත්මක කළ කොට්ඨාසවලට යෙදවීම සුදුසු බව මගේ අදහසයි.නමුත් 2013 සිට එන මුදලක් නිසා ප්‍රාදේශීය සභා ගිණුමට බැර කිරීම සුදුසුයි.

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී  ඩී.පී.ඩී.විශ්වජිත් ගංගා ප්‍රේමලාල් ගුරුගේ මහතා

ගරු සභාපතිතුමනි,මේ සම්බන්ධව යෝජනාවක් ගෙනා නමුත් එය ක්‍රියාත්මක වූයේ නැහැ.එම ව්‍යාපෘති සඳහා ලද මුදල් ඒ ඒ ව්‍යාපෘති සඳහා වෙන් කිරීම සුදුසුයි.

ගරු සභාපතිතුමා

මේ පිළිබඳව වෙනත් අදහසක් ඉදිරිපත් නොවන බව පෙනීයන නිසා මෙම යෝජනාව සභා සම්මත කර ගන්නා ලෙස මා ගරු මහා සභාවෙන් ඉල්ලා සිටිනවා.

තීරණය

වසර දෙකක් ඉක්මවා ඇතත් අදාළ කොන්ත්‍රාත් සමිති මගින් ඉල්ලීම් ඉදිරිපත් කර නොමැති පහත සඳහන් 10% අතරැඳවුම් සඳහා රජයේ ආදායමට ලබා ගැනීම සඳහා  ගරු මහා සභාවේ අනුමැතිය ලබා දීම සුදුසු බවට ගරු මහා සභාව තීරණය කිරීමෙන් අනතුරුව එම යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

| අනු අංකය | ව්‍යාපෘතිය | වර්ෂය | මුදල රු.ශත |
|---|---|---|---|
| 1 | සියරා කන්ට්‍රක්ෂන්ස් | 2013 | 2425894.80 |
| 2 | හල්දොල ග්‍රාම සංවර්ධන සමිතිය | 2017 | 50000.00 |
| 3 | ප්‍රගති ග්‍රාම සංවර්ධන සමිතිය | 2018 | 2996.35 |
| 4 | ප්‍රගති ග්‍රාම සංවර්ධන සමිතිය | 2019 | 2448.00 |
| 5 | සමගි ගොවි සංවිධානය-පැල්ලපිටිය උතුර | 2019 | 8690.00 |
| 6 | රන්කෙත ගොවි සංවිධානය ඇත්ගාල | 2019 | 20000.00 |
| | එකතුව | | 2510029.15 |

පෙ,ව.10.25ට ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී  පූජ්‍ය පට්ටිපොල සුමනරතන හිමියෝ සභා ගර්භයෙන් පිටව ගියහ.

05:01:18 ගරු සභාපතිතුමා විසින් ඉදිරිපත් කරන ලද යෝජනාව සභාගත කරන ලදී.

පහත සඳහන් විවිධ තැන්පත්වල කාලය  වසර දෙකක් ඉක්මවා ඇති බැවින්  රජයේ ආදායමට ලබා ගැනීම සඳහා  ගරු මහා සභාවේ අනුමැතිය ලබා දීම සුදුසු බවට ගරු මහා සභාවට යෝජනා කරමි.

| අනු අංකය | ව්‍යාපෘතිය | වර්ෂය | මුදල රු.ශත |
|---|---|---|---|
| 1 | ඒ.සී මැණිකේ වැටුප් හිඟ | 2019 | 15828.46 |
| 2 | 2019 වැටුප් ලේඛනයෙන් අයකර ගත් සේවක ණය | 2019 | 3471.58 |
| 3 | 2019 දේපල තහනම් දඩ | 2019 | 3094.65 |
| 4 | සේවක ණය | 2020 | 73.40 |
| | එකතුව | | 22468'09 |

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී  එම්.ඒ. සුමේධ අලුත්ගමගේ මහතා

එම යෝජනාව මා විසින් ස්ථිර කරනවා.

ගරු සභාපතිතුමා

මේ පිළිබඳව වෙනත් අදහසක් ඉදිරිපත් නොවන බව පෙනීයන නිසා මෙම යෝජනාව සභා සම්මත කර ගන්නා ලෙස මා ගරු මහා සභාවෙන් ඉල්ලා සිටිනවා.

තීරණය

පහත සඳහන් විවිධ තැන්පත්වල කාලය  වසර දෙකක් ඉක්මවා ඇති බැවින්  රජයේ ආදායමට ලබා ගැනීම සඳහා  ගරු මහා සභාවේ අනුමැතිය ලබා දීම සුදුසු බවට ගරු මහා සභාව තීරණය කිරීමෙන් අනතුරුව එම යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

| අනු අංකය | ව්‍යාපෘතිය | වර්ෂය | මුදල රු.ශත |
|---|---|---|---|
| 1 | ඒ.සී මැණිකේ වැටුප් හිඟ | 2019 | 15828.46 |
| 2 | 2019 වැටුප් ලේඛනයෙන් අයකර ගත් සේවක ණය | 2019 | 3471.58 |
| 3 | 2019 දේපල තහනම් දඩ | 2019 | 3094.65 |
| 4 | සේවක ණය | 2020 | 73.40 |
| | එකතුව | | 22468'09 |

05:01:19 ගරු සභාපතිතුමා විසින් ඉදිරිපත් කරන ලද යෝජනාව සභාගත කරන ලදී.

2022 අගෝස්තු මස 16 වන දින තීරණ අංක 06:02 යටතේ මහ සභාවේ සම්මත වූ  මගේ පහත යෝජනාව,1987 අංක 15 දරණ ප්‍රාදේශීය සභා පනතේ 11 වන වගන්තිය සමග කියවිය යුතු 184 වන වගන්තිය ප්‍රකාරව අමාත්‍යතුමාගේ 1988.01.13 දිනැති 488/16 ගැසට් පත්‍රයෙන් ප්‍රසිද්ධ කරන ලද අංක 11 දරණ ප්‍රාදේශීය සභා රීතියේ අංක (5)දරණ උපවගන්තියට අනුකූල ලෙස මෙයින් පරිච්ජින්න කිරීමටත් ඊට පහතින් වූ යෝජනාව ඇතුළත් කිරීමටත් මා විසින් ගරු මහා සභාවට යෝජනා කරමි.

දැනට සම්මත වී ඇති හා පරිච්ජින්න කළ යුතු  යෝජනාව

ගඟ ඉහළ කෝරලේ ප්‍රාදේශීය සභාව සතු ඩෙන්මාර්ක් කසළ ප්‍රතිචක්‍රීකරණ මධ්‍යස්ථානයේ කසළ කැපීම වෙනුවෙන් යන්ත්‍රයක් මිළදී ගැනීම සඳහා මිළ ගණන් කැඳවන ලදි. ඒ අනුව වර්තමානයේ එම කසළ කපන යන්ත්‍රය සඳහා රු:669,680.00ක මිළ ගණනක් ජිනසේන ඇග්‍රිකල්චරල් මැෂිනරී පුද්ගලික සමාගම විසින් ඉදිරිපත් කර ඇත. මීට ප්‍රථමයෙන් කසළ කපන යන්ත්‍රයක් මිළදී ගැනීම සඳහා කෘෂිකර්ම දෙපාර්තමේන්තුව වෙත මුදල් ගෙවූ නමුත් එම දෙපාර්තමේන්තුව විසින් එය ලබාදීම නතර කර ඇත. එම නිසා සේවා අවශ්‍යතාවය සළකා මෙම කසළ කපන යන්ත්‍රය රු.රු:669,680.00ක මුදලකට ජිනසේන ඇග්‍රිකල්චරල් මැෂිනරී පුද්ගලික සමාගම වෙතින් මිළදී ගැනීම සුදුසු බවට ගරු මහා සභාවට යෝජනා කරමි.

නව යෝජනාව

ගඟ ඉහළ කෝරලේ ප්‍රාදේශීය සභාව සතු ඩෙන්මාර්ක් කසළ ප්‍රතිචක්‍රීකරණ මධ්‍යස්ථානයේ කසළ කැපීම වෙනුවෙන් දැනට පවතින කසළ කපන යන්ත්‍රය ප්‍රමාණවත් නොවන බැවින්  කසළ කපන යන්ත්‍රයක් මිළදී ගැනීම සුදුසු බවටත්  පුවත්පත් දැන්වීම් භාෂා ත්‍රිත්වයෙන් පළ කිරීම සඳහා රුපියල් ලක්ෂයකට ආසන්න පිරිවැයක් වැයවන බැවින් පුවත්පත් දැන්වීම් භාෂා ත්‍රිත්වයෙන් පළ කිරීමෙන් තොරව සහ මධ්‍යම පළාත් සභාවේ 2020 සැපයුම්කරුවන් ලියාපදිංචි කිරීමේ නාම ලේඛනයට අනුව එම සැපයුම්කරුවන්ගෙන් සහ ගඟ ඉහළ කෝරලේ ප්‍රාදේශීය සභාවේ ලියාපදිංචි සැපයුම්කරුවන්ගෙන් මිළ කැඳවීම් කිරීමත් සුදුසු බවට ගරු මහා සභාවට යෝජනා කරමි.

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී  ඩී.ජී.ඩී.විශ්වජිත් ගංගා ප්‍රේමලාල් ගුරුගේ මහතා

එම යෝජනාව මා විසින් ස්ථිර කරනවා.

ගරු සභාපතිතුමා

ගඟ ඉහළ කෝරළේ ප්‍රාදේශීය සභාව සතු ඩෙන්මාර්ක් කසළ ප්‍රතිචක්‍රීකරණ මධ්‍යස්ථානයේ කසළ කැපීම වෙනුවෙන් දැනට පවතින කසළ කපන යන්ත්‍රය ප්‍රමාණවත් නොවන බැවින් කසළ කපන යන්ත්‍රයක් මිළදී ගැනීම සුදුසු බවටත් පුවත්පත් දැන්වීම් භාෂා ත්‍රිත්වයෙන් පළ කිරීම සඳහා රුපියල් ලක්ෂයකට ආසන්න පිරිවැයක් වැයවන බැවින් පුවත්පත් දැන්වීම් භාෂා ත්‍රිත්වයෙන් පළ කිරීමෙන් තොරව සහ මධ්‍යම පළාත් සභාවේ 2020 සැපයුම්කරුවන් ලියාපදිංචි කිරීමේ නාම ලේඛනයට අනුව එම සැපයුම්කරුවන්ගෙන් සහ ගඟ ඉහළ කෝරළේ ප්‍රාදේශීය සභාවේ ලියාපදිංචි සැපයුම්කරුවන්ගෙන් මිළ කැඳවීම් කිරීමත් සුදුසු බවට ගරු මහා සභාවට යෝජනා කරනවා.

ගරු සභාපතිතුමා

මේ පිළිබඳව වෙනත් අදහසක් ඉදිරිපත් නොවන බව පෙනීයන නිසා මෙම යෝජනාව සභා සම්මත කර ගන්නා ලෙස මා ගරු මහා සභාවෙන් ඉල්ලා සිටිනවා.

තීරණය

ගඟ ඉහළ කෝරළේ ප්‍රාදේශීය සභාව සතු ඩෙන්මාර්ක් කසළ ප්‍රතිචක්‍රීකරණ මධ්‍යස්ථානයේ කසළ කැපීම වෙනුවෙන් දැනට පවතින කසළ කපන යන්ත්‍රය ප්‍රමාණවත් නොවන බැවින් කසළ කපන යන්ත්‍රයක් මිළදී ගැනීම සුදුසු බවටත් පුවත්පත් දැන්වීම් භාෂා ත්‍රිත්වයෙන් පළ කිරීම සඳහා රුපියල් ලක්ෂයකට ආසන්න පිරිවැයක් වැයවන බැවින් පුවත්පත් දැන්වීම් භාෂා ත්‍රිත්වයෙන් පළ කිරීමෙන් තොරව සහ මධ්‍යම පළාත් සභාවේ 2020 සැපයුම්කරුවන් ලියාපදිංචි කිරීමේ නාම ලේඛනයට අනුව එම සැපයුම්කරුවන්ගෙන් සහ ගඟ ඉහළ කෝරළේ ප්‍රාදේශීය සභාවේ ලියාපදිංචි සැපයුම්කරුවන්ගෙන් මිළ කැඳවීම් කිරීමත් සුදුසු බවට ගරු මහා සභාව තීරණය කිරීමෙන් අනතුරුව එම යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

05:01:20 ගරු සභාපතිතුමා විසින් ඉදිරිපත් කරන ලද යෝජනාව සභාගත කරන ලදී.

ගඟ ඉහළ කෝරළේ ප්‍රාදේශීය සභාව සතු ඩෙන්මාර්ක් කසළ ප්‍රතිචක්‍රීකරණ මධ්‍යස්ථානයේ කසළ කැපීම වෙනුවෙන් කසළ කපන යන්ත්‍රයක් මිළදී ගැනීමේ තාක්ෂණ කමිටුව සඳහා පහත සඳහන් සාමාජිකයින් පත් කිරීම සුදුසු බවටත් ගරු මහා සභාවට යෝජනා කරමි.

| | |
|---|---|
| ප්‍රධාන ඉංජිනේරු (යාන්ත්‍රික) | - සභාපති |
| ගණකාධිකාරී - පළාත් පාලන දෙපාර්තමේන්තුව | - සාමාජික |
| ලේකම් -ගඟ ඉහළ කෝරළේ ප්‍රාදේශීය සභාව | - සාමාජික |
| වැඩ අධිකාරී-ගඟ ඉහළ කෝරළේ ප්‍රාදේශීය සභාව | - සාමාජික |
| පරිසර නිලධාරී | - සාමාජික |

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එම්.පී.ප්‍රසන්න විමල් මනතුංග මහතා

එම යෝජනාව මා විසින් ස්ථිර කරනවා.

ගරු සභාපතිතුමා

මේ පිළිබඳව වෙනත් අදහසක් ඉදිරිපත් නොවන බව පෙනීයන නිසා මෙම යෝජනාව සභා සම්මත කර ගන්නා ලෙස මා ගරු මහා සභාවෙන් ඉල්ලා සිටිනවා.

තීරණය

ගඟ ඉහළ කෝරළේ ප්‍රාදේශීය සභාව සතු ඩෙන්මාර්ක් කසළ ප්‍රතිචක්‍රීකරණ මධ්‍යස්ථානයේ කසළ කැපීම වෙනුවෙන් කසළ කපන යන්ත්‍රයක් මිළදී ගැනීමේ තාක්ෂණ කමිටුව සඳහා ප්‍රධාන ඉංජිනේරු (යාන්ත්‍රික) - සභාපති වශයෙන් ද ගණකාධිකාරී - පළාත් පාලන දෙපාර්තමේන්තුව - සාමාජික, ලේකම් -ගඟ ඉහළ කෝරළේ ප්‍රාදේශීය සභාව - සාමාජික ,වැඩ අධිකාරී-ගඟ ඉහළ කෝරළේ ප්‍රාදේශීය සභාව" සාමාජික , පරිසර නිලධාරී - සාමාජික වශයෙන් ද පත් කිරීම සුදුසු බවට ගරු මහා සභාව තීරණය කිරීමෙන් අනතුරුව එම යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

05:01:21 ගරු සභාපතිතුමා විසින් ඉදිරිපත් කරන ලද යෝජනාව සභාගත කරන ලදී.

2022.ඔක්තෝබර් මස 18 වන දින තීරණ අංක 05:01:04 යටතේ මහ සභාවේ සම්මත වූ මගේ පහත යෝජනාව,1987 අංක 15 දරණ ප්‍රාදේශීය සභා පනතේ 11 වන වගන්තිය සමග කියවිය යුතු 184 වන වගන්තිය ප්‍රකාරව අමාත්‍යතුමාගේ 1988.01.13 දිනැති 488/16 ගැසට් පත්‍රයෙන් ප්‍රසිද්ධ කරන ලද අංක 11 දරණ ප්‍රාදේශීය සභා රීතියේ අංක (5)දරණ උපවගන්තියට අනුකූල ලෙස මෙයින් පරිච්ජින්න කිරීමටත් ඊට පහතින් වූ යෝජනාව ඇතුළත් කිරීමටත් මා විසින් ගරු මහා සභාවට යෝජනා කරමි.

දැනට සම්මත වී ඇති හා පරිච්ජින්න කළ යුතු යෝජනාව

2022 වර්ෂයේ සභා අරමුදල් ප්‍රතිපාදන යටතේ ක්‍රියාත්මක කිරීමට නියමිත මල්වත්තගම උදාකළ ගම්මානයේ ඉදිකරන ලද බුදුමැදුර ප්‍රතිසංස්කරණය කිරීමට විෂයභාර අමාත්‍යවරයාගේ අනුමැතිය ලබාගැනීම සඳහා ගරු මහා සභාවේ අනුමැතිය ලබාදීම සුදුසු බවට ගරු මහා සභාවට යෝජනා කරමි.

නව යෝජනාව

2022 වර්ෂයේ සභා අරමුදල් ප්‍රතිපාදන යටතේ ක්‍රියාත්මක කිරීමට නියමිත මල්වත්තගම උදාකළ ගම්මානයේ ඉදිකරන ලද බුදුමැදුර ප්‍රතිසංස්කරණය කිරීම සඳහා රුපියල් 250,000.00ක මුදලක් සභා අරමුදලින් දැරීම වෙනුවෙන් ගරු විෂයභාර අමාත්‍යවරයාගේ අනුමැතිය ලබාගැනීම සඳහා ගරු මහා සභාවේ අනුමැතිය ලබාදීම සුදුසු බවට ගරු මහා සභාවට යෝජනා කරමි.

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එම්.ඒ.සුමේධ අලුත්ගමගේ මහතා

එම යෝජනාව මා විසින් ස්ථිර කරනවා.

ගරු සභාපතිතුමා

මේ පිළිබඳව වෙනත් අදහසක් ඉදිරිපත් නොවන බව පෙනීයන නිසා මෙම යෝජනාව සභා සම්මත කර ගන්නා ලෙස මා ගරු මහා සභාවෙන් ඉල්ලා සිටිනවා.

තීරණය:-

2022 වර්ෂයේ සභා අරමුදල් ප්‍රතිපාදන යටතේ ක්‍රියාත්මක කිරීමට නියමිත මල්වත්තගම උදාකළ ගම්මානයේ ඉදිකරන ලද බුදුමැදුර ප්‍රතිසංස්කරණය කිරීම සඳහා රුපියල් 250,000.00ක මුදලක් සභා අරමුදලින් දැරීම වෙනුවෙන් ගරු විෂයභාර අමාත්‍යවරයාගේ අනුමැතිය ලබාගැනීම සඳහා ගරු මහා සභාවේ අනුමැතිය ලබාදීම සුදුසු බවට ගරු මහා සභාව තීරණය කිරීමෙන් අනතුරුව එම යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

05:01:22 ගරු සභාපතිතුමා විසින් ඉදිරිපත් කරන ලද යෝජනාව සභාගත කරන ලදී.

2022 ඔක්තෝබර් මස 18 වන දින තීරණ අංක 05:01:04 යටතේ මහ සභාවේ සම්මත වූ මගේ පහත යෝජනාව,1987 අංක 15 දරණ ප්‍රාදේශීය සභා පනතේ 11 වන වගන්තිය සමග කියවිය යුතු 184 වන වගන්තිය ප්‍රකාරව අමාත්‍යතුමාගේ 1988.01.13 දිනැති 488/16 ගැසට් පත්‍රයෙන් ප්‍රසිද්ධ කරන ලද අංක 11 දරණ ප්‍රාදේශීය

සභා රීතියේ අංක (5)දරණ උපවගන්තියට අනුකූල ලෙස මෙයින් පරිච්ඡින්න කිරීමටත් ඊට පහතින් වූ යෝජනාව ඇතුළත් කිරීමටත් මා විසින් ගරු මහා සභාවට යෝජනා කරමි.

<u>දැනට සම්මත වී ඇති හා පරිච්ඡින්න කළ යුතු  යෝජනාව</u>

ගඟ ඉහළ කෝරළේ ප්‍රාදේශීය සභාව සතු පැරණි ප්‍රාදේශීය සභා භූමියේ ඉදිකිරීමට යෝජිත නව වෙළඳ සංකීර්ණයේ ටෙන්ඩර් පටිපාටියෙන් බැහැරව ගරු විෂයභාර අමාත්‍යවරයාගේ අනුමැතියට යටත්ව ගොඩනැගිල්ලෙහි පළමු මහළ ලංකා බැංකුව සහ කාර්ගිල්ස් ෆුඩ් කම්පැණි වෙත දීර්ඝකාලීන බදු පදනම මත බදු දීමට අදාළව 2022-06-29වන දිනැති සංශෝධිත සැළැස්ම අනුව පහළ මහලේ වාහන අංගනය ඉදිකෙරෙන කොටසේ කාර්ගිල්ස් ෆුඩ් ආයතනයේ ගබඩාව ඉදිකිරීම සුදුසු බවටත් පළමු මහලේ වාණිජ කටයුතු සඳහා වර්ග අඩි 3698ක ප්‍රමාණයත් සමග මුළු වර්ග අඩි 6587ක ප්‍රමාණයක් කාර්ගිලිස් ෆුඩ් කම්පැණි ආයතනය වෙත දීර්ඝකාලීන බදු පදනම මත ලබාදීම සුදුසු බවටත් කුරුඳුවත්ත ලංකා බැංකු ශාඛාව සඳහා පළමු මහලේ වර්ග අඩි 1620ක් සමග මුළු වර්ග අඩි 3297ක ප්‍රමාණයක් දීර්ඝ කාලීන බදු පදනම මත ලබාදීම සුදුසු බවටත් ගරු මහා සභාවට යෝජනා කරමි.

<u>නව යෝජනාව</u>

ගඟ ඉහළ කෝරළේ ප්‍රාදේශීය සභාව සතු පැරණි ප්‍රාදේශීය සභා භූමියේ ඉදිකිරීමට යෝජිත නව වෙළඳ සංකීර්ණයේ ටෙන්ඩර් පටිපාටියෙන් බැහැරව ගරු විෂයභාර අමාත්‍යවරයාගේ අනුමැතියට යටත්ව ගොඩනැගිල්ලෙහි පළමු මහළ ලංකා බැංකුව සහ කාර්ගිල්ස් ෆුඩ් කම්පැණි වෙත දීර්ඝකාලීන බදු පදනම මත බදු දීමට අදාළව 2022-06-29වන දිනැති සංශෝධිත සැළැස්ම අනුව පහළ මහලේ වාහන අංගනය ඉදිකෙරෙන කොටසේ කාර්ගිල්ස් ෆුඩ් ආයතනයේ ගබඩාව ඉදිකිරීම සුදුසු බවටත් පළමු මහලේ වාණිජ කටයුතු සඳහා වර්ග අඩි 3698ක ප්‍රමාණයත් සමග මුළු වර්ග අඩි 6587ක ප්‍රමාණයක් කාර්ගිලිස් ෆුඩ් කම්පැණි ආයතනය වෙත වසර  තිහක දීර්ඝකාලීන බදු පදනම මත ලබාදීම සුදුසු බවටත් කුරුඳුවත්ත ලංකා බැංකු ශාඛාව සඳහා පළමු මහලේ වර්ග අඩි 1620ක් සමග මුළු වර්ග අඩි 3297ක ප්‍රමාණයක් වසර  තිහක දීර්ඝ කාලීන බදු පදනම මත ලබාදීම සුදුසු බවටත් ගරු මහා සභාවට යෝජනා කරමි.

<u>ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එම්.ඒ.සුමේධ අලුත්ගමගේ මහතා</u>

එම යෝජනාව මා විසින් ස්ථිර කරනවා.

<u>ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී  ආර්.පී. ගුණරත්න මහතා</u>

ගරු සභාපතිතුමනි ,වෙළඳපොළ වටිනාකම අනුව වසර තුනෙන් හෝ හතරෙන් නීත්‍යානුකූල රාමුව තුළ නව තක්සේරුවකට ගොස් බදු මුදල් වැඩි කිරීම පිළිබඳව ගිවිසුමෙහි අනිවාර්යයෙන්ම සටහන් කරගැනිම සුදුසුයි.

<u>ගරු සභාපතිතුමා</u>

ගරු මන්ත්‍රීතුමනි, ඉඩම සභාවට පවරා ගැනීම සම්බන්ධයෙන් වන නඩුව පිළිබඳව LRC සභාපතිතුමා හමුවෙලා සාකච්ඡා කරන අවස්ථාවේ හිටපු අමාත්‍ය ගරු මහින්දානන්ද අලුත්ගමගේ මැතිතුමාත් පැමිණ සාකච්ඡා කළා.එතුමා සභාව ගැටළුවකට මුහුණපෑ සෑම අවස්ථාවකදිම මටත් සමස්ත සභාවටත් ශක්තියක් වීම සම්බන්ධයෙන් එතුමාට මේ අවස්ථාවේ ස්තූතිවන්ත විය යුතුයි. මේ පිළිබඳව වෙනත් අදහසක් ඉදිරිපත් නොවන බව පෙනීයන නිසා මෙම යෝජනාව සභා සම්මත කර ගන්නා ලෙස මා ගරු මහා සභාවෙන් ඉල්ලා සිටිනවා.

<u>තීරණය</u>

ගඟ ඉහළ කෝරළේ ප්‍රාදේශීය සභාව සතු පැරණි ප්‍රාදේශීය සභා භූමියේ ඉදිකිරීමට යෝජිත නව වෙළඳ සංකීර්ණයේ ටෙන්ඩර් පටිපාටියෙන් බැහැරව ගරු විෂයභාර අමාත්‍යවරයාගේ අනුමැතියට යටත්ව ගොඩනැගිල්ලෙහි පළමු මහළ ලංකා බැංකුව සහ කාර්ගිල්ස් ෆුඩ් කම්පැණි වෙත දීර්ඝකාලීන බදු පදනම මත බදු දීමට අදාළව 2022-06-29වන දිනැති සංශෝධිත සැළැස්ම අනුව පහළ මහලේ වාහන අංගනය ඉදිකෙරෙන කොටසේ කාර්ගිල්ස් ෆුඩ් ආයතනයේ ගබඩාව ඉදිකිරීම සුදුසු බවටත් පළමු මහලේ වාණිජ කටයුතු සඳහා වර්ග අඩි 3698ක ප්‍රමාණයත් සමග මුළු වර්ග අඩි 6587ක ප්‍රමාණයක් කාර්ගිලිස් ෆුඩ් කම්පැණි ආයතනය වෙත වසර  තිහක දීර්ඝකාලීන බදු පදනම මත ලබාදීම සුදුසු බවටත් කුරුඳුවත්ත ලංකා බැංකු ශාඛාව සඳහා පළමු මහලේ වර්ග අඩි 1620ක් සමග මුළු වර්ග අඩි 3297ක ප්‍රමාණයක් වසර තිහක දීර්ඝ කාලීන බදු පදනම මත ලබාදීම සුදුසු බවටත් ගරු මහා සභාව  තීරණය කිරීමෙන් අනතුරුව එම යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

06. යථාපරිදි කල්දී නොමැති යෝජනා /හදිසි යෝජනා - ඇත

06:01 ගරු සභාපතිතුමා විසින් ඉදිරිපත් කරන ලද යෝජනාව සභාගත කරන ලදි.

2022 වර්ෂයේ සභා අරමුදල් ප්‍රතිපාදන මගින් ක්‍රියාත්මක කරන ලද පහත සංවර්ධන ව්‍යාපෘති සඳහා අදාළ සමිති වලට මුදල් ගෙවීම සඳහා ගරු මහා සභාවේ අනුමැතිය ලබාදීම සුදුසු බවට ගරු මහා සභාවට යෝජනා කරමි.

| අනු අංකය | ව්‍යාපෘතිය | කොන්ත්‍රාත් සමිතිය | මුදල රු. |
|---|---|---|---|
| 01 | වෙළඳ වාණිජ හා සංචාරක දෙපාර්තමේන්තුව සහ සභා අරමුදල් ප්‍රතිපාදන යටතේ ක්‍රියාත්මක කරන ලද අසුපිණි ඇල්ල සංචාරක ව්‍යාපෘතිය | මල්වත්ත කන්ස්ට්‍රක්ෂන්ස්,අංක 119,ගම්පොළ පාර ,ගම්පොළ | 681,835 . 82 |
| 02 | 2022 වර්ෂයේ සභා අරමුදල් ප්‍රතිපාදන යටතේ ක්‍රියාත්මක කරන ලද ගිරාඋල්ල පුරාණ විහාරය අසලින් මලංගමුව මිතලාව දෙසට යන මාර්ගයේ රැඳවුම් බැම්ම ඉදිකිරීම | ග්‍රාම සංවර්ධන ප්‍රාදේශීය බල මණ්ඩලය,ගඟ ඉහළ කෝරළේ ,කුරුඳුවත්ත කඩවීදිය. | 1000,000 .00 |
| 03 | 2022 වර්ෂයේ සභා අරමුදල් ප්‍රතිපාදන යටතේ ක්‍රියාත්මක කරන ලද වැලිකන්දගම බාලසිංහ මහතාගේ නිවස සිට ඉදිරියට මාර්ගය සංවර්ධනය කිරීම - පළමු අදියර | සාමග්‍රි ග්‍රාම සංවර්ධන සමිතිය,අළුගොල්ල, මිතලාව. | 1000,000 .00 |
| 04 | 2022 වර්ෂයේ සභා අරමුදල් ප්‍රතිපාදන යටතේ ක්‍රියාත්මක කරන ලද කුරුඳුවත්ත වෙළඳ සංකීර්ණය ඉදිකිරීම ව්‍යාපෘතිය - පළමු අදියර | කවිඳු බිල්ඩර්ස්, අංක 162, පොල්ගහඅංග,වැලිගල්ල. | 4,264,954.37 |

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එස්.ඒ.ඩබ්. පතිරණ මහතා

එම යෝජනාව මා විසින් ස්ථිර කරනවා.

ගරු සභාපතිතුමා

කවිඳු බිල්ඩර්ස් අපට බිලක් ඉදිරිපත් කළවිට ගිවිසුම් ප්‍රකාරව එම බිල්පත නොගෙවා සිටීමේ හැකියාවක් නැහැ.නමුත් බිලක් ඉදිරිපත් කළවිට මහා සභා රැස්වීමක් පැවැත්වෙන තුරු ගෙවීම් සිදුකිරීමට නොහැකිවීම පවතින ආර්ථික තත්ත්වය මත එම කොන්ත්‍රාත්කරුට අපහසුයි. ආවරණ අනුමැතියට යටත්ව ගෙවීම් කිරීම සඳහා ගරු මහා සභාවේදී කිසියම් විසඳුමක් ලබාගත යුතු බව හිටපු අමාත්‍ය ගරු මහින්දානන්ද අලුත්ගමගේ මැතිතුමා සමගත් සාකච්ඡා සිදුකළා.

තීරණය

2022 වර්ෂයේ වෙළඳ වාණිජ හා සංචාරක දෙපාර්තමේන්තුව සහ සභා අරමුදල් ප්‍රතිපාදන යටතේ ක්‍රියාත්මක කරන ලද අසුපිණි ඇල්ල සංචාරක ව්‍යාපෘතිය සඳහා මල්වත්ත කන්ස්ට්‍රක්ෂන්ස් වෙත රු,681,835 . 82 ක් ද 2022 වර්ෂයේ සභා අරමුදල් ප්‍රතිපාදන මගින් ක්‍රියාත්මක කරන ලද ගිරාඋල්ල පුරාණ විහාරය අසලින් මලංගමුව මිතලාව දෙසට යන මාර්ගයේ රැඳවුම් බැම්ම ඉදිකිරීම ව්‍යාපෘතිය සඳහා ග්‍රාම සංවර්ධන ප්‍රාදේශීය බල මණ්ඩලය වෙත රු.1000,000.00 ක් ද වැලිකන්දගම බාලසිංහ මහතාගේ නිවස සිට ඉදිරියට මාර්ගය සංවර්ධනය කිරීම - පළමු අදියර සංවර්ධන ව්‍යාපෘතිය සඳහා සාමග්‍රි ග්‍රාම සංවර්ධන සමිතිය වෙත රු.1000,000.00 ක් ද කුරුඳුවත්ත වෙළඳ සංකීර්ණය ඉදිකිරීම ව්‍යාපෘතිය - පළමු අදියර සඳහා කවිඳු බිල්ඩර්ස් වෙත රු.4,264,954.37 ක මුදලක් ද ගෙවීම සඳහා ගරු මහා සභාවේ අනුමැතිය ලබාදීම සුදුසු බවට ගරු මහා සභාව තීරණය කිරීමෙන් අනතුරුව එම යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

06:02 ගරු සභාපතිතුමා විසින් ඉදිරිපත් කරන ලද යෝජනාව සභාගත කරන ලදි.

එක් එක් අයිතම අනුව සැපයුම්කරුවන් ලියාපදිංචි වී ඇති ප්‍රමාණය අවම මට්ටමක පවතින අවස්ථාවලදී මධ්‍යම පළාත් සභාවේ ලියාපදිංචි සැපයුම්කරුවන්ගෙන් ලංසු ලබාගැනීම සුදුසු බවටත් රු.5000.00 - රු.25,000.00 අතර වටිනාකමක් ඇති ද්‍රව්‍ය සඳහා අතින් ලබාගන්නා ලද මිළ ගණන් 03ක් තාක්ෂණ කමිටුව වෙත යොමු කර මිළ සැසඳුම් කර අවම මිළ හා ප්‍රමිතියෙන් යුත් භාණ්ඩ ලබා ගැනීම සුදුසු බවටත් ගරු මහා සභාවට යෝජනා කරමි.

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එම්.ඒ. සුමේධ අලුත්ගමගේ මහතා

එම යෝජනාව මා විසින් ස්ථිර කරනවා.

ගරු සභාපතිතුමා

එක් එක් අයිතම අනුව සැපයුම්කරුවන් ලියාපදිංචි වී ඇති ප්‍රමාණය අවම මට්ටමක පවතින අවස්ථාවලදී මධ්‍යම පළාත් සභාවේ ලියාපදිංචි සැපයුම්කරුවන්ගෙන් ලංසු ලබාගැනීම සුදුසු බවටත් රු.5000.00 - රු.25,000.00 අතර වටිනාකමක් ඇති ද්‍රව්‍ය සඳහා අතින් ලබාගන්නා ලද මිළ ගණන් 03ක් තාක්ෂණ කමිටුව වෙත යොමු කර මිළ සැසඳුම් කර අවම මිළ හා ප්‍රමිතියෙන් යුත් භාණ්ඩ ලබා ගැනීම සුදුසු බවටත් ගරු මහා සභාවට යෝජනා කරනවා.

තීරණය

එක් එක් අයිතම අනුව සැපයුම්කරුවන් ලියාපදිංචි වී ඇති ප්‍රමාණය අවම මට්ටමක පවතින අවස්ථාවලදී මධ්‍යම පළාත් සභාවේ ලියාපදිංචි සැපයුම්කරුවන්ගෙන් ලංසු ලබාගැනීම සුදුසු බවටත් රු.5000.00 - රු.25,000.00 අතර වටිනාකමක් ඇති ද්‍රව්‍ය සඳහා අතින් ලබාගන්නා ලද මිළ ගණන් 03ක් තාක්ෂණ කමිටුව වෙත යොමු කර මිළ සැසඳුම් කර අවම මිළ හා ප්‍රමිතියෙන් යුත් භාණ්ඩ ලබා ගැනීම සුදුසු බවටත් ගරු මහා සභාව තීරණය කිරීමෙන් අනතුරුව එම යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

06:03 ගරු සභාපතිතුමා විසින් ඉදිරිපත් කරන ලද යෝජනාව සභාගත කරන ලදි.

ගඟ ඉහළ කෝරළේ ප්‍රාදේශීය සභාව නමින් පවත්වාගෙන යනු ලබන පහත සඳහන් ස්ථාවර තැන්පතුවල කල්පිරීමේ කාලය අවසන් වී ඇති බැවින් නැවත අලුත් කිරීම සුදුසු බවට ගරු මහා සභාවට යෝජනා කරමි.

01. ජාතික ඉතිරි කිරීමේ බැංකුව - ගම්පොල

| | | |
|---|---|---|
| ගිණුම් අංක - | 2/0074/10/53329 | -රු.3,000,000.00 |
| | 2/0074/10/82442 | -රු.1,000,000.00 |

02. මහජන බැංකුව – කුරුඳුවත්ත

| | | |
|---|---|---|
| ගිණුම් අංක - | 018-60-01-00019417-3 | -රු.5,000,000.00 |
| | 018-60-01-00019418-3 | -රු.5,000,000.00 |

03. ලංකා බැංකුව – කුරුඳුවත්ත

| | | |
|---|---|---|
| ගිණුම් අංක - | 88862813 | -රු.2,500,000.00 |
| | 88862845 | -රු.2,500,000.00 |
| | 88862800 | -රු.2,500,000.00 |
| | 88862831 | -රු.2,500,000.00 |
| | 88862874 | -රු.5,000,000.00 |
| | 88862862 | -රු.5,000,000.00 |

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඒ. මහින්දරත්න අලුත්ගමගේ මහතා

එම යෝජනාව මා විසින් ස්ථිර කරනවා.

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ආර්.පී. ගුණරත්න මහතා

ගරු සභාපතිතුමනි,ඔබතුමා කේවල් කර වැඩිම පොළී අනුපාතය ලබාදෙන බැංකුවේ බැංකුගත කිරීම සුදුසුයි.

ගරු සභාපතිතුමා

මේ පිළිබඳව වෙනත් අදහසක් ඉදිරිපත් නොවන බව පෙනීයන නිසා මෙම යෝජනාව සභා සම්මත කර ගන්නා ලෙස මා ගරු මහා සභාවෙන් ඉල්ලා සිටිනවා.

තීරණය

ගඟ ඉහළ කෝරළේ ප්‍රාදේශීය සභාව නමින් පවත්වාගෙන යනු ලබන ස්ථාවර තැන්පතුවල කල්පිරීමේ කාලය අවසන් වී ඇති බැවින් නැවත අලුත් කිරීම සුදුසු බවට ගරු මහා සභාවට යෝජනා කරමි.ගරු මහා සභාව තීරණය කිරීමෙන් අනතුරුව එම යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

06:04 ගරු සභාපතිතුමා විසින් ඉදිරිපත් කරන ලද යෝජනාව සභාගත කරන ලදි.

ගඟ ඉහළ කෝරළේ ප්‍රාදේශීය සභාවට අයත් අංක 11 දරණ දැනට ලංකා බැංකු ශාඛාව පවත්වාගෙන යනු ලබන ගොඩනැගිල්ල ටෙන්ඩර් ක්‍රමයෙන් බැහැරව ,මාසික කුලී පදනම මත, වසර තුනෙන් තුනට ගිවිසුම් ගතවීමේ පදනම මත බදු ලබා දී ඇති අතර එහි ගිවිසුම් ගත කාලය 2022.08.31 දිනෙන් අවසන් වේ. ඒ අනුව ,එම ගොඩනැගිල්ල නව තක්සේරුව මත පදනම්ව, ටෙන්ඩර් පටිපාටියෙන් බැහැරව,ගරු විෂය භාර අමාත්‍යවරයාගේ අනුමැතියට යටත්ව 2022-09-01 දින සිට 2025-08-31 දක්වා වසර 03ක කාලයක් සඳහා ලංකා බැංකු ශාඛාව පවත්වාගෙන යාම සඳහා බදු ලබා දීම සුදුසු බවට ගරු මහා සභාවට යෝජනා කරමි.

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එම්.ඒ.සුමේධ අලුත්ගමගේ මහතා

එම යෝජනාව මා විසින් ස්ථිර කරනවා.

ගරු සභාපතිතුමා

ගඟ ඉහළ කෝරළේ ප්‍රාදේශීය සභාවට අයත් අංක 11 දරණ දැනට ලංකා බැංකු ශාඛාව පවත්වාගෙන යනු ලබන ගොඩනැගිල්ල ටෙන්ඩර් ක්‍රමයෙන් බැහැරව ,මාසික කුලී පදනම මත, වසර තුනෙන් තුනට ගිවිසුම් ගතවීමේ පදනම මත බදු ලබා දී ඇති අතර එහි ගිවිසුම් ගත කාලය 2022.08.31 දිනෙන් අවසන් වේ. ඒ අනුව ,එම ගොඩනැගිල්ල නව තක්සේරුව මත පදනම්ව, ටෙන්ඩර් පටිපාටියෙන් බැහැරව,ගරු විෂය භාර අමාත්‍යවරයාගේ අනුමැතියට යටත්ව 2022-09-01 දින සිට 2025-08-31 දක්වා වසර 03ක කාලයක් සඳහා ලංකා බැංකු ශාඛාව පවත්වාගෙන යාම සඳහා බදු ලබා දීම සුදුසු බවට ගරු මහා සභාවට යෝජනා කරනවා.

ගරු සභාපතිතුමා

මේ පිළිබඳව වෙනත් අදහසක් ඉදිරිපත් නොවන බව පෙනීයන නිසා මෙම යෝජනාව සභා සම්මත කර ගන්නා ලෙස මා ගරු මහා සභාවෙන් ඉල්ලා සිටිනවා.

තීරණයඃ-

ගඟ ඉහළ කෝරළේ ප්‍රාදේශීය සභාවට අයත් අංක 11 දරණ ලංකා බැංකු ශාඛාව පවත්වාගෙන යනු ලබන ගොඩනැගිල්ල ටෙන්ඩර් ක්‍රමයෙන් බැහැරව මාසික කුලී පදනම මත වසර තුනෙන් තුනට ගිවිසුම් ගතවීමේ

පදනම මත බදු ලබා දී ඇති අතර එහි ගිවිසුම් ගත කාලය 2022.08.31 දිනෙන් අවසන් වන බැවින් එම ගොඩනැගිල්ල නව තක්සේරුව මත පදනම්ව ,ටෙන්ඩර් පටිපාටියෙන් බැහැරව,ගරු විෂය භාර අමාත්‍යවරයාගේ අනුමැතියට යටත්ව 2022-09-01 දින සිට 2025-08-31 දක්වා වසර 03ක කාලයක් සඳහා ලංකා බැංකු ශාඛාව පවත්වාගෙන යාම සඳහා බදු ලබා දීම සුදුසු බවට ගරු මහා සභාව තීරණය කිරීමෙන් අනතුරුව එම යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

<u>06:05 ගරු සභාපතිතුමා විසින් ඉදිරිපත් කරන ලද යෝජනාව සභාගත කරන ලදි.</u>

ගඟ ඉහළ කෝරළේ ප්‍රාදේශීය සභාවට අයත් අංක 31 දරණ කඩ කාමරය දැනට ලංකා සතොස ආයතනයේ ශාඛාවක් සහ රට බීමහලක් පවත්වාගෙන යාම සඳහා ටෙන්ඩර් ක්‍රමයෙන් බැහැරව මාසික කුලී පදනම මත වසර තුනෙන් තුනට ගිවිසුම් ගතවීමේ පදනම මත බදු ලබා දී ඇති අතර එම ගිවිසුම්ගත කාලය 2023.01.31 දිනෙන් අවසන් වේ. තවද ,මෙම ආයතනයෙහි මත්පැන් බලපත්‍රය 2022.12.31 දිනෙන් අවසන් වන හෙයින් එම බලපත්‍රය ලබා ගැනීම සඳහා සුරාබදු දෙපාර්තමේන්තුව වෙත සතොස ආයතනයේ ගිවිසුම ඉදිරිපත් කළ යුතු බැවින් 2022.12.31 දිනට පෙර ගිවිසුම අත්සන් කිරීමට කටයුතු කර දෙන මෙන් කරන ලද ඉල්ලීම සඳහා 2022.11.29 දින මුදල් කමිටු අනුමැතිය හිමි විය.ඒ අනුව අංක 31 දරණ කඩ කාමරය ටෙන්ඩර් ක්‍රමයෙන් බැහැරව , වසර තුනෙන් තුනට ගිවිසුම් ගතවීමේ පදනම මත හා දැනට අය කරනු ලබන රු.82150.00ක මාසික කුලී මුදලම නව තක්සේරුවක් ලබාගන්නා තෙක් අය කිරීමේ පදනම මත ගරු විෂය භාර අමාත්‍යවරයාගේ අනුමැතියට යටත්ව 2023-02-01 දින සිට 2026-01-31 දින දක්වා වසර 03ක කාලයක් සඳහා ලංකා සතොස ආයතනයේ ශාඛාවක් සහ රට බීමහලක් පවත්වාගෙන යාම සඳහා බදු ලබා දීම සුදුසු බවට ගරු මහා සභාවට යෝජනා කරමි.

<u>ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ආර්.පී.ගුණරත්න මහතා</u>

මූලාසනයේ ගරු සභාපතිතුමනි,එම යෝජනාව මා විසින් ස්ථිර කරනවා.දැනට වැඩිම බදු මුදල් එකතු කර තිබෙන්නේ සුරාබදු මගින් වන අතර බාර් හිමියාගේ ලාභයත් මේවන විට වැඩිවී තිබෙනවා.එම නිසා මෙම බදු මුදල් වැඩිකළ යුතු බව මගේ අදහසයි.

<u>ගරු සභාපතිතුමා</u>

ගරු මන්ත්‍රීතුමනි,දැනට පවතින රජයේ තක්සේරුව අනුව එසේ කළ නොහැකි වුවත් ඉදිරියේදී යම් ප්‍රමාණයක් වැඩි කිරීමට කටයුතු කිරීමට කටයුතු කරන බව දන්වා ලිපියක් යොමු කිරීම සුදුසු බව මගේ අදහසයි. මේ පිළිබඳව වෙනත් අදහසක් ඉදිරිපත් නොවන බව පෙනීයන නිසා මෙම යෝජනාව සභා සම්මත කර ගන්නා ලෙස මා ගරු මහා සභාවෙන් ඉල්ලා සිටිනවා.

<u>තීරණය:-</u>

ගඟ ඉහළ කෝරළේ ප්‍රාදේශීය සභාවට අයත් අංක 31 දරණ කඩ කාමරය දැනට ලංකා සතොස ආයතනයේ ශාඛාවක් සහ රට බීමහලක් පවත්වාගෙන යාම සඳහා ටෙන්ඩර් ක්‍රමයෙන් බැහැරව ,මාසික කුලී පදනම මත වසර තුනෙන් තුනට ගිවිසුම් ගතවීමේ පදනම මත බදු ලබා දී ඇති අතර එම ගිවිසුම්ගත කාලය 2023.01.31 දිනෙන් අවසන් වන බැවින් 2022.12.31 දිනෙන් අවසන්වන එම ආයතනයෙහි මත්පැන් බලපත්‍රය නැවත ලබා ගැනීම සඳහා සුරාබදු දෙපාර්තමේන්තුව වෙත සතොස ආයතනයේ ගිවිසුම ඉදිරිපත් කළ යුතු හෙයින් 2022.12.31 දිනට පෙර ගිවිසුම අත්සන් කිරීමට කටයුතු කර දෙන ලෙස කරන ලද ඉල්ලීම අනුව අංක 31 දරණ කඩ කාමරය ටෙන්ඩර් ක්‍රමයෙන් බැහැරව , වසර තුනෙන් තුනට ගිවිසුම් ගතවීමේ පදනම මත හා දැනට අය කරනු ලබන රු.82150.00ක මාසික කුලී මුදලම නව තක්සේරුවක් ලබාගන්නා තෙක් අය කිරීමේ පදනම මත, ගරු විෂය භාර අමාත්‍යවරයාගේ අනුමැතියට යටත්ව 2023-02-01 දින සිට 2026-01-31 දින දක්වා වසර 03ක කාලයක් සඳහා ලංකා සතොස ආයතනයේ ශාඛාවක් සහ රට බීමහලක් පවත්වාගෙන යාම සඳහා බදු ලබා දීම සුදුසු බවට ගරු මහා සභාව තීරණය කිරීමෙන් අනතුරුව එම යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

<u>06:06 ගරු සභාපතිතුමා විසින් ඉදිරිපත් කරන ලද යෝජනාව සභාගත කරන ලදි.</u>

2022 වර්ෂය සඳහා ඇස්තමේන්තුගත ආදායමට වඩා වැඩිපුර ලද ආදායම් සඳහා සකස් කරන ලද පරිපූරක ඇස්තමේන්තුව සඳහා ගරු මහා සභාවේ අනුමැතිය ලබා දීම සුදුසු බවට ගරු මහා සභාවට යෝජනා කරමි.

| ආදායම් විස්තරය | පරිපූරක ඇස්තමේන්තුව අනුව ආදායම | අය ශීර්ෂය | වැය විස්තරය | වැය ශීර්ෂය | අතිරේක පරිපූරකයෙන් වෙන් කිරීම |
|---|---|---|---|---|---|
| ස්ථාවර තැන්පතු පොළී | 2378904.10 | 1-63 | කසළ කපන යන්ත්‍රයක් මිලදී ගැනීම<br><br>ප්‍රජාමූල සංවිධාන හා ප්‍රජාමණ්ඩල සවිබල ගැන්වීම | 209-2<br><br>607-4 | 700,000.00<br><br>1,678,904.10 |

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එම්.ඒ. සුමේධ අලුත්ගමගේ මහතා

එම යෝජනාව මා විසින් ස්ථිර කරනවා.

ගරු සභාපතිතුමා

2022 වර්ෂයේ අප ඇස්තමේන්තුගත කළ මුදලට වඩා වැඩියෙන් ස්ථාවර තැන්පත් පොළී ලැබී තිබෙනවා.එම මුදල රු.2378904.10ක් වන අතර එය අප වියදම් කිරීමට බලාපොරොත් වන්නේ කසළ කපන යන්ත්‍රයක් මිලදී ගැනීම සඳහා රු.700,000.00ක් ද ඉතිරි මුදල වන රු.1,678,904.10ක් ප්‍රජාමූල සංවිධාන හා ප්‍රජාමණ්ඩල සවිබල ගැන්වීම යටතේ සමිති සඳහා අවශ්‍ය භාණ්ඩ ලබා දීම වෙනුවෙනි.තම කොට්ඨාසයේ සමිතිවල ඉල්ලීම් ඉදිරිපත් කරන ආකාරයෙන් සහ මින් පෙර භාණ්ඩ ලබාදුන් සමිති සඳහා මෙම භාණ්ඩ ලබාදෙන ලෙසත් දන්වා සිටිනවා.

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එච්.පී. ආනන්ද කුලතිලක මහතා

ගරු සභාපතිතුමනි,සෑම මන්ත්‍රීවරයෙකුට ම එක් සමිතියක ඉල්ලීමක් ඉදිරිපත් කිරීමට අවස්ථාව ලබාදීම සුදුසු බව මගේ අදහසයි.

ගරු සභාපතිතුමා
එසේ ඉල්ලීම් ඉදිරිපත් කිරීම සුදුසු බව මගේ අදහසයි.

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එම්.පී.ප්‍රසන්න විමල් මනතුංග මහතා
ගරු සභාපතිතුමනි,පසුගිය වර 2020 සහ 2021 වසරවලදී සභා අරමුදලින් එක් මන්ත්‍රීවරයෙකුට ලක්ෂ දෙකහෝ තුන බැගින් වෙන් කළත් එය පසුව ක්‍රියාත්මක කළේ නැහැ.එම මුදල් ප්‍රතිපාදන සම්බන්ධයෙන් ගරු මහා සභාව දැනුවත් කරන ලෙස ඉල්ලා සිටිනවා.

ගරු සභාපතිතුමා

ගරු මන්ත්‍රීතුමනි,කොවිඩ් වසංගතය සමග එය නතර කිරීමට සිදුවුවත් මෙවර මෙය ක්‍රියාත්මක කළහැකියි.එම මුදල් සභා අරමුදලට ගැනීමට 2022 මැයි මස මහා සභා තීරණයක් ගෙන තිබෙනවා.2020 හා 2021 වර්ෂවල ද්‍රව්‍ය මිලදී ගැනීම සඳහා වෙන්කරන ලද රුපියල් එකොළොස් ලක්ෂ හැත්තෑ පන්දහසක මුදල සභා අරමුදලට බැර කිරීම සුදුසු බවට ගරු මහා සභාව තීරණය කිරීමෙන් පසුව එම යෝජනාව ඒකමතිකව සභා සම්මත වී තිබෙනවා.

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ආර්.පී. ගුණරත්න මහතා

ගරු සභාපතිතුමනි.එවකට පැවති තත්ත්වය මත අපට පුටුවක් හෝ යම් භාණ්ඩයක් සමිතිවලට ලබාදීමට තිබූ අවස්ථාව අහිමි වුණා.

ගරු සභාපතිතුමා

මේ පිළිබඳව වෙනත් අදහසක් ඉදිරිපත් නොවන බව පෙනීයන නිසා මෙම යෝජනාව සභා සම්මත කර ගන්නා ලෙස මා ගරු මහා සභාවෙන් ඉල්ලා සිටිනවා.

තීරණය

2022 වර්ෂය සඳහා ඇස්තමේන්තුගත ආදායමට වඩා වැඩිපුර ලද ආදායම් සඳහා සකස් කරන ලද පරිපූරක ඇස්තමේන්තුව සඳහා ගරු මහා සභාවේ අනුමැතිය ලබා දීම සුදුසු බවට ගරු මහා සභාව තීරණය කිරීමෙන් අනතුරුව එම යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

06:07 ගරු සභාපතිතුමා විසින් ඉදිරිපත් කරන ලද යෝජනාව සභාගත කරන ලදි.

ගරු විෂයභාර අමාත්‍යවරයාගේ අනුමැතියට යටත්ව, බල ප්‍රදේශයේ කොට්ඨාසවල ක්‍රියාත්මක ස්වේච්ඡා සමිති සඳහා ප්ලාස්ටික් පුටු ලබාදීම වෙනුවෙන් රු.1,678,904.10ක මුදලක් 2022 සභා අරමුදල් ප්‍රතිපාදන මගින් දැරීම සඳහා ගරු මහා සභාවේ අනුමැතිය ලබාදීම සුදුසු බවට ගරු මහා සභාවට යෝජනා කරමි.

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එම්.පී.ප්‍රසන්න විමල් මනතුංග මහතා

එම යෝජනාව මා විසින් ස්ථිර කරනවා.

ගරු සභාපතිතුමා

මින් පෙර සභාවට ඉදිරිපත් කරන ලද පරිපූරක ඇස්තමේන්තුව අනුව ගරු විෂයභාර අමාත්‍යවරයාගේ අනුමැතියට යටත්ව, බල ප්‍රදේශයේ කොට්ඨාසවල ක්‍රියාත්මක ස්වේච්ඡා සමිති සඳහා ප්ලාස්ටික් පුටු ලබාදීම වෙනුවෙන් රු.1,678,904.10ක මුදලක් 2022 සභා අරමුදල් ප්‍රතිපාදන මගින් දැරීම සඳහා ගරු මහා සභාවේ අනුමැතිය ලබාදීම සුදුසු බවට ගරු මහා සභාවට යෝජනා කරනවා.

තීරණය

ගරු විෂයභාර අමාත්‍යවරයාගේ අනුමැතියට යටත්ව, බල ප්‍රදේශයේ කොට්ඨාසවල ක්‍රියාත්මක ස්වේච්ඡා සමිති සඳහා ප්ලාස්ටික් පුටු ලබාදීම වෙනුවෙන් රු.1,678,904.10ක මුදලක් 2022 සභා අරුදල් ප්‍රතිපාදන මගින් දැරීම සඳහා ගරු මහා සභාවේ අනුමැතිය ලබාදීම සුදුසු බවට මහා සභාව තීරණය කිරීමෙන් අනතුරුව එම යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

07 කාරක සභා වාර්තා සළකා බැලීම

07:01 මුදල් හා ප්‍රතිපත්ති කාරක සභාව

2022.11.29 වන දින පැවති මුදල් හා ප්‍රතිපත්ති කාරක සභා රැස්වීම් වාර්තාව සභා ගත කරන ලදි. ඒ අනුව 2022 වර්ෂයට අදාළ ආදායම් වියදම් පුරෝකථනයද, 2022 ඔක්තෝබර් මස මුළු ලැබීම් රු:10,717,219.93ක් ද මුළු වියදම රු.15,984,191.45ක් ද විය. 2022 ඔක්තෝබර් මසට අදාළ බැංකු සැසඳුම් ප්‍රකාශය 2022.11.08 වන දින මහනුවර විගණන අධිකාරී වෙත යොමුකර ඇත.

07:02 පරිසර හා පොදු පහසුකම් පිළිබඳ කාරක සභා වාර්තාව

2022.11.29 වන දින පැවති පරිසර කමිටු වාර්තාව සභා ගත කරන ලදි.

07:03 කාර්මික හා කර්මාන්ත කමිටු වාර්තාව

2022.11.29 වන දින පැවති කාර්මික හා කර්මාන්ත කමිටු වාර්තාව සභා ගත කරන ලදි.

## 08.සභාවේ මාසික ලැබීම් හා ගෙවීම් වාර්තාව

| අනු අංකය | දිනය | ආදායකයා | ගෙවීම් විස්තරය | වවුචර් අංකය | හරස් සටහන් | මුදල |
|---|---|---|---|---|---|---|
| 1 | 2022-11-21 | රෂීඩ් ගනී ,දිවුරුම් දුන් භාෂා පරිවර්තක,නො 230/1, කොන්ඩදෙණිය, කටුගස්තොට | 2023 වර්ෂයේ බදු ගාස්තු පැනවීමේ මහ සභා තීරණ දමිළ , ඉංග්‍රීසි භාෂා වලට පරිවර්තනය කිරීමේ හා යතුරු ලියන ගාස්තු ගෙවීම | 1283 | | 31,450.00 |
| 2 | | ආර්.පී.ඩී.එන් කුමාර , කුරුදුවත්ත ටයර් හවුස්, කුරුදුවත්ත | CPYU - 8947 ත්‍රීරෝද රථයේ රෝදයට ටියුබ් එකක් සහ කොලර් එකක දමා ටයරය සවි කිරීම වෙනුවෙන් මුදල් ගෙවීම. | 1284 | | 2,200.00 |
| 3 | | පි.කේ.පී.ඩබ්.පි බණ්ඩාර , නො 18/1/1, නාවලපිටිය දෙවැනි පටුමග, ගම්පල | ගඟ ඉහළ කෝරළේ ප්‍රාදේශීය සභා කාර්යාලයේ බලපත්‍ර, ජල ගාස්තු දත්ත ඇතුලත් කරන පරිගණකයේ ( CPU ) අක්‍රිය වීම හේතුවෙන් Ram 4 GB , 500 Hard Disk ලබා ගැනීම වෙනුවෙන් මුදල් ගෙවීම. | 1285 | | 9,300.00 |
| 4 | | Singer Sri Lanka P.L.C.,No.464,Galle Road, Colombo 3. | ගඟ ඉහළ කෝරළේ ප්‍රාදේශීය සභාවට අයත් ඩෙන්මාර්ක් කසල මධ්‍යස්ථානයට කසල කිරන තරාදියක් (300Kg ) ලබා ගැනීම වෙනුවෙන් මුදල් ගෙවීම. | 1286 | 25.00 | 106,474.00 |
| 5 | | Singer Sri Lanka P.L.C.,No.464,Galle Road, Colombo. | ගඟ ඉහළ කෝරළේ ප්‍රාදේශීය සභාවට අයත් කාය වර්ධන මධ්‍යස්ථානයට බර කිරන තරාදියක් (150Kg )ලබා ගැනීම වෙනුවෙන් මුදල් ගෙවීම. | 1287 | 25.00 | 99,974.00 |
| 6 | | ලේකම්, ගඟ ඉහළ කෝරළේ ප්‍රාදේශිය සභාව | ගඟ ඉහළ කෝරළේ ප්‍රාදේශීය සභාව සතු මහජන පුස්තකාලයේ හා ශාඛා පුස්තකාලවලට අවශ්‍ය ද්‍රව්‍ය මිලට ගැනීම වෙනුවෙන් ලබා ගත් අත්තිකාරම් මුදල් පියවීම. | 1288 | | 42,900.00 |
| 7 | | කුරුදුවත්ත පොහොර කඩේ, කුරුදුවත්ත කඩවීදිය | ගඟ ඉහළ කෝරළේ ප්‍රාදේශීය සභාවේ සනීපාරක්ෂක කටයුතු සඳහා ප්ලාස්ටික් කොසු ,හාපික් ,සැනිටයිසර් ලබා ගැනීම වෙනුවෙන් මුදල් ගෙවීම. | 1289 | 25.00 | 28,875.00 |
| 8 | | කුරුදුවත්ත පොහොර කඩේ, කුරුදුවත්ත කඩවීදිය | ගඟ ඉහළ කෝරළේ ප්‍රාදේශීය සභාව සතු ඩෙන්මාර්ක් කසල මධ්‍යස්ථානයට පොහොර ඇසුරුම් කිරීමට 5Kg මලු හා නුල් බෝල ලබා ගැනීම වෙනුවෙන් මුදල් ගෙවීම. | 1290 | 25.00 | 74,175.00 |
| 9 | | Mahanuwara Egencies - No 7 , Kumara Veediya , Kandy | ගඟ ඉහළ කෝරළේ ප්‍රාදේශීය සභාවේ සෞඛ්‍ය අංශයට හා කර්මාන්ත අංශයට සනීපාරක්ෂක භාණ්ඩ ලබා ගැනීම වෙනුවෙන් මුදල් ගෙවීම. | 1291 | | 14,535.00 |

| | | | | | | |
|---|---|---|---|---|---|---|
| 10 | | ජයපුර ට්‍රේඩින් කොම්පැණි, අංක 11, නාවලපිටිය පාර, ගම්පල. | ගඟ ඉහළ කෝරළේ ප්‍රාදේශීය සභා කාර්යාලයේ සෞඛ්‍ය අංශයට හා කසල මධ්‍යස්ථානයට ග්ලවුස් ලබා ගැනිම වෙනුවෙන් මුදල් ගෙවීම. | 1292 | | 3,400.00 |
| 11 | | Lake House Branch Office , No 99, D.S.Senanayaka Street,Kandy. | ගඟ ඉහළ කෝරළේ ප්‍රාදේශීය සභාවේ 2023 වර්ෂයේ සැපයුම්කරුවන් ලියාපදිංචි කිරීමේ දැන්වීම් භාෂා ත්‍රිත්වයෙන් පල කිරීම වෙනුවෙන් මුදල් ගෙවීම. | 1293 | | 145,686.60 |
| 12 | | ලේකම්, ගඟ ඉහළ කෝරළේ ප්‍රාදේශීය සභාව | ගඟ ඉහළ කෝරළේ ප්‍රාදේශීය සභා කාර්යාලයේ පරිහරණය සඳහා A4 පැකට් 70 ලබා ගැනිම වෙනුවෙන් ලබාගත් අත්තිකාරම් මුදල් පියවීම. | 1294 | | 150,500.00 |
| 13 | | කවිඳු බිල්ඩර්ස්, අංක 162, පොල්ගහඅංග, වැලිගල්ල | 2022 වර්ෂයේ සභා අරමුදල් ප්‍රතිපාදන යටතේ ක්‍රියාත්මක කරන ලද කුරුඳුවත්ත වෙළඳ සංකීර්ණය ඉදිකිරීම 01 වන- අදියර දෙවන බිල්පත ගෙවීම. | 1295 | 1,126,167.16 | 3,833,641.65 |
| 14 | | ඩබ්.ඩී.එන්.ඩී.එල් වික්‍රමසිංහ මිය, සංවර්ධන නිලධාරී | 2022-11-15 දින උසාවි දඩ මුදල් උපලේඛන ලබා ගැනිම සඳහා ගම්පොල උසාවියට හා නාවලපිටිය උසාවියට යාම වෙනුවෙන් ගමන් වියදම් ගෙවීම. | 1296 | | 1,320.00 |
| 15 | | ලේකම් ,ගඟ ඉහළ කෝරළේ ප්‍රාදේශීය සභාව | ඉනෝකා වික්‍රමසිංහ මියගේ වැටුපෙන් අයකර විවිධ තැන්පත් හි රඳවාගත් මුදල් නැවත ගෙවීම. | 1297 | 3708.03 | 8,167.78 |
| 16 | | ABC ඔටෝසර්විස් සෙන්ටර්, නො. 572/2, නාවලපිටිය පාර, උලපනේ. | CPYU - 8947 ත්‍රීරෝද රථයේ ඇන්ජින් මවුන්ට් 3ක් අළුතින් දැමීම සඳහා මුදල් ගෙවීම. | 1298 | | 2,850.00 |
| 17 | | ABC ඔටෝසර්විස් සෙන්ටර්, නො. 572/2, නාවලපිටිය පාර, උලපනේ. | CPRW - 6917 ට්‍රැක්ටර් ට්‍රේලරයේ රෝදයක බෙයාරින් දෙකක් අළුතින් දැමීම සඳහා මුදල් ගෙවීම. | 1299 | | 11,200.00 |
| 18 | | ABC ඔටෝසර්විස් සෙන්ටර්, නො. 572/2, නාවලපිටිය පාර, උලපනේ. | CPYU - 8947 ත්‍රීරෝද රථයේ තිරිංග පද්ධතියේ බ්‍රේක් සිලින්ඩර් එකක් දමා අළුත්වැඩියා කිරීම වෙනුවෙන් ගෙවීම. | 1300 | | 2,750.00 |
| 19 | | වී. ධර්මරාජා, ප්‍රාදේශීය ලේකම් කාර්යාලය, පස්බාගේ කෝරළේ, නාවලපිටිය. | 2023 වර්ෂයේ අයවැය සකස් කිරීමේදි දමිළ භාෂාවට පරිවර්තනය කිරීම වෙනුවෙන් මුදල් ගෙවීම. ( වචන 8168) | 1301 | | 20,420.00 |
| 20 | 2022-11-22 | ඩී.කේ.එස්.කේ මැණිකේ මිය,කළමානාකරණ සේවා නිලධාරී. | 2023 අයවැය සකස් කිරීමේ කටයුතු සඳහා ගඟ ඉහළ කෝරළේ ප්‍රාදේශීය සභාව වෙත පැමිණීම වෙනුවෙන් ගෙවීම. | 1302 | | 8,141.00 |
| 21 | 2022-11-23 | ඇත්ගාල නැගෙනහිර ග්‍රාම සංවර්ධන සමිතිය, ඇත්ගාල, ගම්පල. | 2022 වර්ෂයේ සභා අරමුදල් යටතේ ක්‍රියාත්මක කරන ලද ආරියදාස මහතාගේ නිවස අසලින් යන පඩිපෙළ සංවර්ධනය කිරීමේ ව්‍යාපෘතියේ මුදල් ගෙවීම. | 1303 | 28,975.00 | 221,025.00 |
| 22 | | සමගි ප්‍රජා මුල සංවිධානය, තැලිහුන්න පාසල | කුරුඳුවත්ත මහජන පුස්තකාලයට සමගි ප්‍රජා මුල සංවිධානය මගින් ජලය ලබා | 1304 | | 120.00 |

| | | | | | | |
|---|---|---|---|---|---|---|
| | | අසල , කුරුඳුවත්ත. | ගැනිම වෙනුවෙන් මුදල් ගෙවීම. - ඔක්තෝබර් මාසය | | | |
| 23 | | සී/ස ගඟ ඉහළ කෝරළේ වි.සේ.ස. සමිතිය, කුරුඳුවත්ත කඩවීදිය | 2022-11-01 සිට 2022-11-15 දක්වා සී/ස ගඟ ඉහළ කෝරළේ වි.සේ.ස. සමිතියේ ඉන්ධන පිරවුම්හලෙන් ණය පදනම මත ලබා දි ඇති ඉන්ධන සඳහා මුදල් ගෙවීම. | 1305 | | 274,481.80 |
| 24 | | ABC ඔටෝසර්විස් සෙන්ටර්, නො 572/2, නාවලපිටිය පාර, උලපනේ. | 252-6525 කැබ් රථයේ 256775 Km සේවා වාරය සිදු කිරීම වෙනුවෙන් මුදල් ගෙවීම. | 1306 | 25.00 | 39,545.00 |
| 25 | | ABC ඔටෝසර්විස් සෙන්ටර්, නො 572/2, නාවලපිටියපාර, උලපනේ . | 252-6525 කැබ් රථයේ ඉදිරිපස බ්‍රේක් පෑඩ් අළුතින් දැමීම වෙනුවෙන් මුදල් ගෙවීම. | 1307 | | 9,800.00 |
| 26 | | ලේකම් ,ගඟ ඉහළ කෝරළේ ප්‍රාදේශිය සභාව. | කාර්යාලීය ලිපි තැපැල් කිරීමට අවශ්‍ය මුද්දර ලබා ගැනිම. | 1308 | | 10,000.00 |
| 27 | | ලේකම් ,ගඟ ඉහළ කෝරළේ ප්‍රාදේශිය සභාව. | ඇත්ගාල උපකාර්යාලයේ කාර්යාලීය ලිපි තැපැල් කිරිම සඳහා මුද්දර ලබා ගැනිම. | 1309 | | 5,000.00 |
| 28 | 2022-11-25 | ලේකම් ,ගඟ ඉහළ කෝරළේ ප්‍රාදේශිය සභාව. | සේවක වැටුප් ගෙවීම-2022 නොවැම්බර් | 1310 | 210,002.89 | 2,737,556.70 |
| 29 | 2022-11-28 | ලේකම් ,ගඟ ඉහළ කෝරළේ ප්‍රාදේශිය සභාව. | දේශීය ණය සහ සංවර්ධන අරමුදල් නිලධාරීන් සමඟ 2022-11-28 දින පැවැත්වීමට නියමිත සාකච්ඡාවට හා 2022-11-29 දින පැවැත්වීමට නියමිත මුදල් කමිටුව සඳහා සංග්‍රහ වියදම් සඳහා අත්තිකාරම් මුදල් ලබා ගැනිම. | 1311 | | 5,000.00 |
| 30 | | යුනයිටඩ් මෝටර්ස් ලංකා පි.එල්.සි. ,අංක 109 , රණවණ පාර , කටුගස්තොට. | CPPF 7455 කැබ් රථයේ 230581 Km සීමාවේ සේවා වාරය සිදු කිරීම වෙනුවෙන් මුදල් ගෙවීම. | 1312 | | 21,534.80 |
| 31 | | දේශීය ආදායම් කොමසාරිස් ජනරාල් , දේශිය ආදායම් කොමසාරිස් දෙපාර්තමේන්තුව , කොළඹ 02. | 2022 වර්ෂයේ තෙවන කාර්තුවේ රුපියල් 25 මුද්දර ගාස්තු හා 10% මුද්දර බදු දේශීය ආදායම් කොමසාරිස් දෙපාර්තමේන්තුවට ගෙවීම. | 1313 | | 11,025.00 |
| 32 | | දේශිය ණය සහ සංවර්ධන අරමුදල, අංක 24/ඒ , වෝඩ් පෙදෙස, කොළඹ. | අංක LGGP/GANGA/PS/LR/LR/02 ණය මුදල - 2022 නොවැම්බර් මස ණය වාරික හා පොලී ගෙවීම. | 1314 | | 20,556.93 |
| 33 | 2022-11-29 | අජිත් ෆනිචර්ස් සහ ෆැෂන් හවුස්, අංක 54, ඇත්ගාල, ගම්පල. | ගඟ ඉහළ කෝරළේ ප්‍රාදේශීය සභා සෞඛ්‍ය අංශයේ ට්‍රැක්ටර් රථ රියදුරන් දෙදෙනාට වැහි කබා දෙකක් ලබා දිම වෙනුවෙන් මුදල් ගෙවීම. | 1315 | | 11,000.00 |
| 34 | | ඇත්ගාල උතුර ග්‍රාම සංවර්ධන සමිතිය, ජයමාලපුර, ගම්පල. | සභා අරමුදල් 2022 යටතේ ක්‍රියාත්මක කරන ලද ජයමාලපුර 9 පටුමග සිට තේවත්ත මාර්ගය සංවර්ධනය කිරිම ව්‍යාපෘතියේ මුදල් ගෙවීම. | 1316 | 56,000.00 | 429,000.00 |
| 35 | | පේපර් ලයින් ට්‍රේඩින් පුද්ගලික සමාගම, අංක 14, හරස් වීදිය, මහනුවර. | ගඟ ඉහළ කෝරළේ ප්‍රාදේශීය සභා කාර්යාලයට ලිපි ද්‍රව්‍ය ලබා ගැනිම වෙනුවෙන් මුදල් ගෙවීම. | 1317 | | 24,083.30 |

| | | | | | | |
|---|---|---|---|---|---|---|
| 36 | | පේපර් ලයින් ට්‍රේඩින් පුද්ගලික සමාගම, අංක 14, හරස් වීදිය, මහනුවර. | ගඟ ඉහළ කෝරළේ ප්‍රාදේශීය සභාවට අයත් බල ප්‍රදේශයේ වරිපනම් තක්සේරු අංක දැමීම සඳහා පර්මනට් මාර්කර් පෙන් 10ක් ලබා ගැනිම වෙනුවෙන් මුදල් ගෙවීම. | 1318 | | 950.00 |
| 37 | | පේපර් ලයින් ට්‍රේඩින් පුද්ගලික සමාගම, අංක 14, හරස් වීදිය, මහනුවර. | ගඟ ඉහළ කෝරළේ ප්‍රාදේශීය සභා කාර්යාලයට ලිපි ද්‍රව්‍ය ලබා ගැනිම වෙනුවෙන් මුදල් ගෙවීම. | 1319 | | 88,222.25 |
| 38 | | එල්.එච්. චන්ද්‍රසේකර සහ සහෝදරයෝ , අංක 80 ,රජවීදිය ,මහනුවර. | ගඟ ඉහළ කෝරළේ ප්‍රාදේශීය සභාවේ ප්‍රධාන කාර්යාලයේ ඡායා පිටපත් යන්ත්‍රයට ටෝනර් එකක් හා Samsung 111 S මුද්‍රණ යන්ත්‍රයට Cartridge එකක් ලබා ගැනිම වෙනුවෙන් මුදල් ගෙවීම. | 1320 | | 80,060.01 |
| 39 | | එල්.එච්. චන්ද්‍රසේකර සහ සහෝදරයෝ , අංක 80 ,රජවීදිය ,මහනුවර. | ගඟ ඉහළ කෝරළේ ප්‍රාදේශීය සභා කාර්යාලයට ලිපි ද්‍රව්‍ය ලබා ගැනිම වෙනුවෙන් මුදල් ගෙවීම. | 1321 | | 52,729.85 |
| 40 | | උපුල් හාඩියෙවයාර් ,නව ගන්නෝරුව පාර, පේරාදෙණිය. | ගඟ ඉහළ කෝරළේ ප්‍රාදේශීය සභා ඩෙන්මාර්ක් කසල මධ්‍යස්ථානයට පොහොර ඇසුරුම් කිරීම සඳහා ඇසුරුම් මලු ලබා ගැනිම වෙනුවෙන් මුදල් ගෙවීම. | 1322 | | 230,000.00 |
| 41 | | උපුල් හාඩ්වෙයාර් ,නව ගන්නෝරුව පාර, පේරාදෙණිය. | ගඟ ඉහළ කෝරළේ ප්‍රාදේශීය සභා සෞඛ්‍ය අංශයට සනීපාරක්ෂක උපකරණ ලබා ගැනිම වෙනුවෙන් මුදල් ගෙවීම. | 1323 | | 31,105.00 |
| 42 | | මහජන බැංකුවේ ලංකා විදුලි බල මණ්ඩලයේ ගිණුම - ලංකා විදුලි බල මණ්ඩලය, මහනුවර. | කුරුඳුවත්ත ක්‍රීඩාපිටියේ 2022 නොවැම්බර් මස විදුලි බිල ගෙවීම. | 1324 | | 702.57 |
| 43 | | මහජන බැංකුවේ ලංකා විදුලි බල මණ්ඩලයේ ගිණුම ලංකා විදුලි බල මණ්ඩලය, මහනුවර. | ප්‍රාදේශීය සභා ප්‍රධාන කාර්යාලයේ 2022 නොවැම්බර් මස විදුලි බිල ගෙවීම. | 1325 | | 12,894.36 |
| 44 | | මහජන බැංකුවේ ලංකා විදුලි බල මණ්ඩලයේ ගිණුම ලංකා විදුලි බල මණ්ඩලය, මහනුවර. | ඇත්ගාල ක්‍රීඩාපිටියේ 2022 නොවැම්බර් මස විදුලි බිල ගෙවීම. | 1326 | | 369.24 |
| 45 | | මහජන බැංකුවේ ලංකා විදුලි බල මණ්ඩලයේ ගිණුම ලංකා විදුලි බල මණ්ඩලය, මහනුවර. | උලපනේ ප්‍රාදේශීය සභා උපකාර්යාලයේ 2022 නොවැම්බර් මස විදුලි බිල ගෙවීම. | 1327 | | 1,343.59 |
| 46 | | මහජන බැංකුවේ ලංකා විදුලි බල මණ්ඩලයේ ගිණුම ලංකා විදුලි බල මණ්ඩලය, මහනුවර. | කුරුඳුවත්ත ක්‍රීඩාපිටියේ කායවර්ධන මධ්‍යස්ථානයේ 2022 නොවැම්බර් මස විදුලි බිල ගෙවීම. | 1328 | | 1,343.59 |
| 47 | | මහජන බැංකුවේ ලංකා විදුලි බල මණ්ඩලයේ ගිණුම ලංකා විදුලි බල මණ්ඩලය, මහනුවර. | කුරුඳුවත්ත ආයුර්වේද ගොඩනැගිල්ලේ 2022 නොවැම්බර් මස විදුලි බිල ගෙවීම. | 1329 | | 728.21 |

| | | | | | | |
|---|---|---|---|---|---|---|
| 48 | | මහජන බැංකුවේ ලංකා විදුලි බල මණ්ඩලයේ ගිණුම ලංකා විදුලි බල මණ්ඩලය, මහනුවර. | කුරුඳුවත්ත මහජන පුස්තකාලයේ 2022 නොවැම්බර් මස විදුලි බිල ගෙවීම. | 1330 | | 548.72 |
| 49 | | දවස මධ්‍යස්ථානය ,14, දුම්රියපල පාර, ගම්පොල. | ඇත්ගාල පුස්තකාලයේ 2022 ඔක්තෝබර් මස මිලදී ගත් පුවත්පත්වල බිල්පත ගෙවීම. | 1331 | | 6,335.00 |
| 50 | | දවස මධ්‍යස්ථානය ,14, දුම්රියපල පාර, ගම්පොල. | ඇත්ගාල පුස්තකාලයේ 2022 සැප්තැම්බර් මස මිලදී ගත් පුවත්පත්වල බිල්පත ගෙවීම. | 1332 | | 5,910.00 |
| 51 | | S.B. Printers PVT LTD No.441/B, Colombo Road, Negombo. | ගඟ ඉහළ කෝරළේ ප්‍රාදේශීය සභා කාර්යාලයේ කටයුතු සඳහා සුළු මුදල් පොත් 2ක් ,රජයේ ආධාර ලේඛන 3ක්, බලපත්‍ර ලේඛන 2ක්, කඩකුලී ලේඛන 2ක්, වෙනත් ආදායම් ලේඛන 2ක් ,ප්‍රධාන මුදල් පොත් 2ක් ,ගෙවීම් මුදල් පොත් 2ක් ලබා ගැනිම වෙනුවෙන් මුදල් ගෙවීම. | 1333 | 25.00 | 41,375.00 |
| 52 | | Central Stationeries, No189, Colombo Road, Kandy. | ගඟ ඉහළ කෝරළේ ප්‍රාදේශීය සභා කාර්යාලයේ පරිහරණය සඳහා 130x ෆයිල් හා CR පොත් ලබා ගැනිම වෙනුවෙන් මුදල් ගෙවීම. | 1334 | | 8,020.00 |
| 53 | | New General Trading , No. 6 , Kumara Veediya, Kandy. | ගඟ ඉහළ කෝරළේ ප්‍රාදේශීය සභා කාර්යාලයට ලිපි ද්‍රව්‍ය ලබා ගැනිම වෙනුවෙන් මුදල් ගෙවීම. | 1335 | | 43,186.50 |
| 54 | | විශ්‍රාම වැටුප් අධ්‍යක්ෂ ජනරාල් - අංක 001100109026659 , විශ්‍රාම වැටුප් දෙපාර්තමේන්තුව මාලිගාවත්ත. | 2022 ජූලි ,අගෝස්තු ,සැප්තැම්බර් මාස වලට අදාලව විශ්‍රාම වැටුප් බිල්පත් ගෙවීම. | 1336 | | 18056.01 |
| 55 | 2022-11-30 | සාමගි ග්‍රාම සංවර්ධන සමිතිය අළුගොල්ල , මීතලාව. | 2022 වර්ෂයේ සභා අරමුදල් මගින් ක්‍රියාත්මක කරන ලද වැලිකන්දගම බාලසිංහ මහතාගේ නිවස සිට ඉදිරියට මාර්ගය සංවර්ධන කිරීම ( දෙවන අදියර ) මුදල් ගෙවීම. | 1337 | 57,635.55 | 441,586.55 |
| 56 | | Association of Public Finance Accountants of Sri Lanka. | 2022-12-02 දින පැවැත්වීමට නියමිත හොඳම මුල්‍ය ප්‍රකාශ ඉදිරිපත් කිරීම වෙනුවෙන් 2020 වර්ෂයට අදාල සහතික පත්‍ර ප්‍රදානෝත්සවයට සහභාගි වීමට අදාල මුදල් ගෙවීම. | 1338 | | 5,000.00 |
| 57 | | සි.කේ. ගාර්දි පුංචිහේවා, කාර්යභාර නිලධාරී. | ඇත්ගාල උපකාර්යාලයේ ගරු සභාපතිතුමාගේ කාර්යාල කාමරයේ සීනුව සඳහා බැටරි දෙකක් ලබා ගැනිමට අතින් වියදම් වු මුදල් ගෙවීම. | 1339 | | 260.00 |
| 58 | | එම්.පි.සිසිර කුමාර වැඩ මුලික | අතිකාල දීමනා ගෙවීම.- 2022 ඔක්තෝබර් මාසය | 1340 | | 2426.60 |
| 59 | | එම්.පි.සිසිර කුමාර වැඩ මුලික | අතිකාල දීමනා ගෙවීම. - 2022 සැප්තැම්බර් මාසය | 1341 | | 1460.35 |
| 60 | | පි.ඕ.පි.ඩී.එන්. | බල ප්‍රදේශයෙන් බැහැර | 1342 | | |

| | | | | | | |
|---|---|---|---|---|---|---|
| | | ජයසේකර මහතා ගරු සභාපතිතුමා | රාජකාරි සඳහා ගමන් වියදම් ගෙවීම. - 2022 නොවැම්බර් මාසය | | | 13,000.00 |
| 61 | 2022-12-01 | කේ.ආර්. දිමුතු මධුසංඛ කලංසූරිය - පරිගණක උපදේශක | 2022 නොවැම්බර් මස ඊ නැණ පියස පරිගණක උපදේශක දීමනාව ගෙවීම. | 1343 | 25.00 | 29,975.00 |
| 62 | | ඩබ්.එම් මද්දුම බණ්ඩාර මයා - තාක්ෂණ නිලධාරී | 2022 වර්ෂයේ නොවැම්බර් මස සඳහා තාක්ෂණ නිලධාරී වැටුප් ගෙවීම. | 1344 | 25.00 | 61,903.00 |
| 63 | | ඒ.එස්.ජේ.එස් පෙරේරා මයා -බර වාහන යන්ත්‍ර ක්‍රියාකරු | 2022 වර්ෂයේ නොවැම්බර් 01 සිට 30 දක්වා වැටුප් ගෙවීම. | 1345 | 6,733.00 | 37,451.80 |
| 64 | | කේ.පී.පී.එන් බණ්ඩාර මයා -ගරු සභාපතිතුමාගේ මහජන සම්බන්ධතා නිලධාරී | ගරු සභාපතිතුමාගේ මහජන සම්බන්ධතා නිලධාරී සඳහා 2022 නොවැම්බර් මාසයට අදාල දීමනා ගෙවීම. | 1346 | 25.00 | 24,975.00 |
| 65 | | ප්‍රධාන දුම්රිය ගණකාධිකාරී,දුම්රිය දෙපාර්තමේන්තුව, 355,කොළඹ 10. | කළමනාකරණ සේවා නිලධාරී කේ.පී.පී හේමමාලා මිය වෙනුවෙන් නිකුත් කල දුම්රිය බලපත්‍ර සඳහා මුදල් ගෙවීම. | 1347 | | 1,100.00 |
| | | **එකතුව** | | | **1,489,446.63** | **9,660,706.76** |

## 09. වෙනත්

**2022 මැයි මස සිට 2022 ඔක්තෝබර් මස දක්වා මහා සභාවේ ගනු ලැබූ සභා තීරණවල ප්‍රගතිය සභාගත කරන ලදී.**

**2022.05.24 වන දින මහා සභාවේ ගනු ලැබූ තීරණවල ප්‍රගතිය**

| තීරණ අංකය | තීරණය | ගත් ක්‍රියා මාර්ගය/ ප්‍රගතිය |
|---|---|---|
| **05:01:01** | **අසුපිණි ඇල්ල නැරඹුම් මධ්‍යස්ථානය ඉදිකිරීමේ ව්‍යාපෘතියේ ඉදිරි සංවර්ධන කටයුතු කරගෙන යාම සඳහා ද්‍රව්‍ය වල පවතින මිළ ගණන් වලට අනුව බිල්පත් සකස් කළ හැකිදැයි ඉංජිනේරු සේවා දෙපාර්තමේන්තුවේ නිර්දේශ ලබාගෙන ඒ අනුව කටයුතු කිරීම සුදුසු බවට ගරු මහා සභාවට තීරණය කරන ලදි.** | **සංශෝධිත ඇස්තමේන්තුවට අනුව ඉංජිනේරු සේවා දෙපාර්තමේන්තුවේ අනුමැතිය අනුව ගෙවීම් සිදුකර ඇත.** |
| **05:01:02** | **කුරුඳුවත්ත වෙළඳ සංකීර්ණය ඉදිකිරීම - අදියර 01 ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීමේදි පාංශු තත්ත්ව පරීක්ෂණ වාර්තාව (Bore Hole Test) ලබාගැනිම සඳහා සොයිල් ටෙක් ප්‍රයිවට් ලිමිටඩ් ආයතනය(Soil Tech (Pvt) Ltd) වෙත රුː 428,166.00 ක මුදල ගෙවීම් කර පාංශු තත්ත්ව පරීක්ෂණ වාර්තාව ලබා ගැනීම සුදුසු බවට ගරු මහා සභාව තීරණය කිරීමෙන් අනතුරුව එම යෝජනාව බහුතර ඡන්දයෙන් සභා සම්මත විය.** | **2022-05-27 දින සොයිල් ටෙක් ප්‍රයිවට් ලිමිටඩ් ආයතනය වෙත රු.428,166.00ක මුදලක් ගෙවා ඇත.** |
| **05:01:03** | **ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිෂන් සභාවට අයත් ඉඩම් අප සභාව වෙත පවරා ගැනීමට අදාළව මැනුම් කටයුතු සිදු කළ යුතු ඉහත සඳහන් ඉඩම් මැන නිරවුල් කර ගැනීම සඳහා ගරු මහා සභාවේ අනුමැතිය ලබා දීම සුදුසු බවට ගරු මහා සභාව තීරණය කිරීමෙන් අනතුරුව එම යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.** | **ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිෂන් සභාවේ ලියාපදිංචි මිනින්දෝරුවන්ගෙන් මැනුම් කටයුතු සිදුකිරීම සඳහා මිළ ගණන් කැඳවා ඇත.** |
| **05:01:04** | **කුරුඳුවත්ත පැරණි ප්‍රාදේශීය සභා භූමියේ ඉදිකිරීමට යෝජිත නව වෙළඳ සංකීර්ණයේ සංවර්ධන කටයුතු සිදු කිරීමට ක්‍රියාත්මක කිරීම සඳහා සභාව විසින් ගෙවන ලද රුː 10,663,260.00 ක අත්තිකාරම් මුදලින් කොපමණ වැඩ කොටසක් නිම කර ඇතිදැයි කොන්ත්‍රාත්කරුගෙන් බිල්පත් ලබා ගැනීම සුදුසු බවටත් වර්තමානයේ වෙළඳපොළ පවතින මිළ ගණන් වලට අනුව ව්‍යාපාතියේ ඉදිකිරීම් කටයුතු කිරීමට කොන්ත්‍රාත්කරු එකඟ වන්නේනම් මෙම ව්‍යාපෘතිය ඉදිරියට ක්‍රියාත්මක කරගෙන යාම සුදුසු බවටත් ගරු මහා සභාව** | **2022.06.29 දිනැති සංශෝධිත සැළැස්මට අනුව සංශෝධිත ඇස්තමේන්තමේන්තුවක් ඉදිරිපත් කර ඇත.2022-11-10 දින වවුචර් අංක 1251 මගින් රු.1,799,282.82ක් වටිනා පළමු බිල්පත ගෙවා ඇත.** |

| | | |
|---|---|---|
| | තීරණය කරන ලදි. | |
| 05:01:05 | උඩහේන්තැන්න මැදගොඩ හංදියේ ඉදිකිරීමට යෝජිත වෙළඳ හා බහුකාර්ය ගොඩනැගිල්ල ඉදිකිරීම අදියර 01ට අදාළව සභාවේ මුදල් ප්‍රතිපාදන නොමැති නිසා සහ මුදල් අමාත්‍යංශය මගින් නිකුත් කර ඇති ජාතික අයවැය චක්‍රලේඛ අංක 03/2022 චක්‍රලේඛය අනුව මෙම ව්‍යාපෘතියේ වැඩ තාවකාලිකව නැවැත්වීම සුදුසු බවට ගරු මහා සභාව තීරණය කිරීමෙන් අනතුරුව එම යෝජනාව ඒකමතිකව සභා සම්මත විය. | 2022-05-24 මහා සභා තීරණය අනුව වෙළඳ සංකීර්ණයේ වැඩ නවත්වා ඇත.2022-08-09<br>දින ඉංජිනේරු සේවා දෙපාර්තමේන්තුව වෙත ලිඛිතව දන්වා ඇත. |
| 05:01:06 | ගඟ ඉහළ කෝරළේ ප්‍රාදේශීය සභාව සතු ඇත්ගාල උප කාර්යාලය සතියේ වැඩ කරන දින 05 අඛණ්ඩව පවත්වාගෙන යාමට අවශ්‍ය කාර්ය මණ්ඩලය සඳහා කාර්ය භාර නිලධාරි වශයෙන් - කළමනාකරණ සේවා නිලධාරි - 01ක්ද සංවර්ධන නිලධාරි - 02ක්ද තාක්ෂණ නිලධාරි - 01ක්ද ආදායම් රැස්කිරීම සඳහා සංවර්ධන නිලධාරි - 01 යොදවාගෙන එම කාර්යාලය අඛණ්ඩව පවත්වාගෙන යාම සුදුසු බවට ගරු මහා සභාව තීරණය කිරීමෙන් අනතුරුව එම යෝජනාව ඒකමතිකව සභා සම්මත විය. | අදාළ නිලධාරීන්ට රාජකාරි පැවරීම් සිදුකර රාජකාරියේ යොදවා ඇත. |
| 05:02:01 | ගම්පොළවෙල හා මාළිගාපුරණ ගම් වලට පිවිසෙන පාලම කැඩීගොස් ඇති බැවින් තාක්ෂණ නිලධාරි මහතා එම ස්ථානයට යොමු කර එම තාක්ෂණ නිලධාරි වාර්තාවට අනුව පළාත් පාලන කොමසාරිස්තුමාගේ අනුමැතියට යටත්ව ත්‍රී රෝද රථයක් ධාවනය කිරීමට හැකි වන පරිදි සභා අරමුදල් යොදවා තාවකාලික පාලමක් ඉදිකිරීම සුදුසු බවට ගරු මහා සභාව තීරණය කරන ලදි. | සභා තීරණයක් ගෙන ඉදිරි කටයුත සිදු කරන ලෙස පළාත් පාලන කොමසාරිස්තුමා දන්වා ඇත. |
| 06:01 | 2020 හා 2021 වර්ෂවල ද්‍රව්‍ය මිලදී ගැනිම සඳහා වෙන්කරන ලද රුපියල් එකොළොස් ලක්ෂ හැත්තෑපන්දහසක මුදල සභා අරමුදලට බැර කිරීම සුදුසු බවට ගරු මහා සභාව තීරණය කිරීමෙන් අනතුරුව එම යෝජනාව ඒකමතිකව සභා සම්මත විය. | සභා අරමුදලට බැරකර ඇත. |
| 06:02 | ප්‍රාදේශීය සභාව සතු ට්‍රැක්ටර් රථ සඳහා 11-28 ප්‍රමාණයේ ටයර් මිළදී ගැනීමට කොළඹ ටයර් - ගම්පොළ ආයතනය මගින් එක් ටයරයක් රුː 103,500.00 බැගින් ටයර් 04ක් මිළදී ගැනීම සුදුසු බවට ගරු මහා සභාව තීරණය කිරීමෙන් අනතුරුව එම යෝජනාව ඒකමතිකව සභා සම්මත විය. | මිළදී ගැනීම් සිදුකර ඇත. |
| 06:03 | ගඟ ඉහළ කෝරළේ ප්‍රාදේශීය සභාව මගින් ක්‍රියාත්මක කරන ලද ඊ නැණ පියස පරිගණක පුහුණු මධ්‍යස්ථානයේ 2022 ජූලි මස 01 වන දින සිට සතියේ සෑම බදාදා සහ සිකුරාදා දින දෙක තුළ පරිගණක පුහුණු පාඨමාලා පැවැත්වීම සුදුසු බවටත් ඒ සඳහා සහභාගී වන උපදේශකවරයාට එක් දිනකට රුː 2000.00ක දෛනික දීමනාවක් ගෙවීමේ පදනම මත පරිගණක පුහුණු පාඨමාලා පැවැත්වීම සුදුසු බවට ගරු මහා සභාව තීරණය කිරීමෙන් අනතුරුව එම යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.<br>**<u>2022.06.21 වන දින මහා සභාවේ ගනු ලැබූ තීරණවල ප්‍රගතිය</u>** | 2022-06-06 දින පැවති සම්මුඛ පරීක්ෂණයෙන් දිනකට රු.1500.00 බැගින් ගෙවීම් කිරීමේ ලදනම මත දින 05 සේවය කිරීම සඳහා පරිගණක උපදේශකවරයෙකු තෝරාගෙන ඇත. |
| තීරණ අංකය | තීරණය | ගත් ක්‍රියා මාර්ගය/ ප්‍රගතිය |
| 05:01:01 | අසුපිනිඇල්ල සංචාරක නැරඹුම් මධ්‍යස්ථානයේ සංවර්ධන කටයුතු කඩිනමින් නිමකර ප්‍රාදේශීය සභාව වෙත ආදායමක් ඉපයීම සඳහා සභා අරමුදලින් රුː 1,500,000.00 ක මුදලක් වැයකර එම කර්මාන්තයේ වැඩ අවසන් කිරීම සුදුසු බවට ගරු මහා සභාව තීරණය කරන ලදී. | I වන අදියරයෙහි මුදල් යොදවා වැඩ අවසන් කර ඇත. |
| 05:01:02 | ▪ ගඟ ඉහළකෝරළේ ප්‍රාදේශීය සභාව සතු ඇත්ගාල උප කාර්යාලයේ දෛනික කටයුතු පවත්වාගෙන යාමේදී සභාව වෙත ලැබෙන ගොඩනැගිලි | සභා තීරණය අනුව කටයුතු කර ඇත. |

| | | |
|---|---|---|
| | අයදුම්පත් අනුමත කිරීමට අදාළ සැළසුම් කමිටුව සඳහා පහත නම් සඳහන් නිලධාරීන්ගෙන් යුත් කමිටුවක් පත් කිරීම සුදුසු බවට ගරු මහා සභාව තීරණය කරන ලදී.<br>■ ගරු ප්‍රාදේශීය සභා සභාපති - පී.ඕ.පී.ඩී. නදීර බණ්ඩාර ජයසේකර මහතා<br>■ ඇත්ගාල උප කාර්යාලයේ කාර්යභාර නිලධාරී - ඩී.කේ.සුදර්ශනී කුමාරි මැණිකේ මෙනවිය<br>■ තාක්ෂණ නිලධාරි -ඩබ්.එම්.මද්දුම බණ්ඩාර මහතා | |
| 05:01:03 | ගඟ ඉහළ කෝරළේ ප්‍රාදේශීය සභාව මගින් ක්‍රියාත්මක කරනු ලබන ඊ නැණ පියස පරිගණක පුහුණු මධ්‍යස්ථානයේ උපදේශක දීමනාව දෛනිකව රු.1500.00 බැගින් මාසිකව රු.30000.00ක උපරිමයකට යටත්ව මාසික දීමනාව ගෙවීම සුදුසු බවට ගරු මහා සභාව තීරණය කරන ලදී. | ඊ - නැණ පියස පරිගණක උපදේශකවරයාට 2022 ජූලි මස සිට දිනකට රු.1500.00 බැගින් මසකට රු.30,000.00ක දීමනාවක් ගෙවනු ලබයි. |
| 05:01:04 | ගඟ ඉහළ කෝරළේ ප්‍රාදේශීය සභාව සභාව සතු බැකෝ ලෝඩර යන්ත්‍රය කුලියට දීම (1 පැයටආසන්න මිළ) - රුඃ 5000.00 ක්ද, සභාව සතු මෝටර්ග්‍රේඩරය යන්ත්‍රය කුලියටදීම (1 පැයටආසන්න මිළ)- රුඃ 6000.00ක්ද සභාව සතු ජල බවුසරයෙන් ලීටර 6000 බවුසරයක මිළ- රුඃ 5000.00ක්ද වශයෙන් කුලී මුදල් අයකිරීම සුදුසු බවට ගරු මහාසභාව තීරණය කරන ලදී. | මෙම වසරේ සිට මෙම මිළ ගණන් යටතේ කුලී පදනම මත ලබා දීමට කටයුතු කෙරේ. |
| 05:01:06 | ගඟ ඉහළ කෝරළේ ප්‍රාදේශීය සභා ප්‍රධාන කාර්යාලය සඳහා මුද්දර ගාස්තු රුඃ 10,000.00ක් ලෙසද ඇත්ගාල ප්‍රාදේශීය සභා උප කාර්යාලය සඳහා මුද්දර ගාස්තු රුඃ5000.00 ක් ලෙස ද ලබා ගැනීම සුදුසු බවට ගරු මහාසභාව තීරණය කරන ලදී. | සභා තීරණය අනුව කටයුතු කර ඇත. |
| 05:01:07 | 2022 වර්ෂයට අදාළ සභා අරමුදල් ව්‍යාපෘති ශ්‍රම දායකත්වය යොදාගෙන ක්‍රියාත්මක කිරීම සුදුස බවට ගරු මහා සභාව කරන ලදී. | ව්‍යාපෘති ක්‍රියාත්මක වෙමින් පවතී. |
| 05:01:08 | ගඟ ඉහළ කොරළේ ප්‍රාදේශීය සභාව සතු රථවාහන සහ යන්ත්‍ර සූත්‍ර අලුත්වැඩියා කිරීමේදී යාන්ත්‍රික ඉංජිනේරු වාර්තාව ලබා ගැනීම සඳහා පරීක්ෂණ ගාස්තු වශයෙන් රුඃ 1500.00 ක මුදලක් ගෙවීම සුදුසුබවට ගරු මහාසභාව තීරණය කරන ලදී. | සභා තීරණය අනුව කටයුතු කර ඇත. |
| 05:01:09 | සභා අරමුදල් 2022 යටතේ වැඩ අවසන් කර ඇති ව්‍යාපෘති වන ඇත්ගාල සමිති ශාලාව ඉදිකිරීම අදියර - 03 ව්‍යාපෘතිය සඳහා වැය වන රුඃ543,780 .71 මුදල ඇත්ගාල නැගෙනහිර ග්‍රාම සංවර්ධන සමිතිය වෙත ගෙවීමත් උලපනේ කසළ අංගනය ඉදිරිපිට ගොඩනැගිල්ල ඉදිකිරීම ව්‍යාපෘතිය සඳහා වැය වන රුඃ989,807.63 මුදල ප්‍රගති ග්‍රාම සංවර්ධන සමිතිය, සිංහපුර වෙත ගෙවීම සුදුසු බවටත් ගරු මහාසභාව තීරණය කරන ලදී. | ඇත්ගාල සමිති ශාලාව ඉදිකිරීම අදියර - 03 ව්‍යාපෘතිය සඳහා රුඃ543,780 .71 මුදලක් ඇත්ගාල නැගෙනහිර ග්‍රාම සංවර්ධන සමිතිය වෙත සහ උලපනේ කසළ අංගනය ඉදිරිපිට ගොඩනැගිල්ල ඉදිකිරීම ව්‍යාපෘතිය සඳහා රුඃ989,807.63 මුදලක් ප්‍රගති ග්‍රාම සංවර්ධන සමිතිය, සිංහපුර වෙත ගෙවා ඇත. |
| 05:01:10 | අංක 2/03, නාවලපිටිය පාරේ ගම්පොළ පිහිටි ෂෙඩිනා ෆාම් පොස්පෙරිටි ලොජිස්ටික් ඇන්ඩ් ඉන්වෙස්ට්මන්ට් ආයතනයේ කට්ටි කිරීම් මගින් අප ප්‍රදේශීය සභාවට අයත් ඉඩමෙහි ව්‍යාපෘති වාර්තාවක් සකස්කර තක්සේරු කර පළාත් පාලන කොමසාරිස්තුමාගේ උපදෙස් පරිදි නීත්‍යානුකූලව ගිවිසුම්ගතවීමෙන් අනතුරුව හරිත නිවාස සාදා දේශීය කෘෂිභෝග වගා කිරීමේ ව්‍යාපෘතියක් ආරම්භ කිරීම සඳහා ගම්පොළ,නො,40,කීරපනේ පදිංචි යූ.පී.කේ.එච්.කරුණාරත්න මහතා වෙත දීර්ඝකාලීන බදු පදනම මත ලබාදීම සුදුසු බවට ගරු මහාසභාව තීරණය කරන ලදී. | මෙම තීරණය ක්‍රියාත්මක කිරීම ගැටළු සහගත බව විමර්ශන නිලධාරී විසින් පෙන්වා දී ඇත. |

| | | |
|---|---|---|
| 06:01 | ගඟ ඉහළ කෝරළේ ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය තුළ පිහිටි නිවාස වලින් දෛනිකව ජනනය වන කසළ කොම්පෝස්ට්කරණය සඳහා සහනදායී මිළට වාර්ෂිකව බෙදා දෙන කසළ බදුන් සඳහා එක් බදුනකින් අයකරනු ලබන රුපියල් 1000.00ක මුදල වෙළඳපොළ මිළ ඉහළ යෑම හේතුවෙන් රුපියල් 3500.00ක් දක්වා වැඩි කිරීම සුදුසු බවට ගරු මහාසභාව තීරණය කරන ලදී, | සභා තීරණය අනුව කටයුතු කර ඇත. |
| 06:02 | ගඟ ඉහළ කෝරළේ ප්‍රාදේශීය සභාව සතු සභා ඉඩම් බදුදීම යටතේ ඇති කඩ කාමර දීර්ඝ කාලීන බදු පදනම මත ලබාගෙන 2022.06.08 වන දින දක්වා කුලී මුදල් අයවීමට ඇති බදුකරුවන් වන එච්.පී.ජයතිලක මයාගෙන් - රු. 87,544.31ක මුදලක්ද එන්.පී.කීර්තිරත්න මයාගෙන් - රු. 60,413.50ක මුදලක්ද ඩබ්.එච්.ඩබ්.විමලසේන මයාගෙන් - රු.1,16,627.50ක මුදලක්ද බී.පී.චමින්ද කුමාරසේනාධීර මයාගෙන්-රු.2,02,825.80ක මුදලක්ද එල්.ටී.වී.ප්‍රේමරත්න මයාගෙන් - රු.1,87,965.00ක මුදලක්ද අය කර ගැනීමට නීත්‍යානුකූලව කටයුතු කිරීම සුදුසු බවට ගරු මහාසභාව තීරණය කරන ලදී. | නීත්‍යානුකූලව කටයුතු කිරීම සඳහා නීතීඥ මහතා වෙත සියලු ලියකියවිලි භාර දී ඇත. |
| 06:03 | ගම්පොළ නගර සභා බල ප්‍රදේශය තුළමාසිකව එක්රැස් වන දිරන කසළ ඉතිරි ටොන් 90ක ප්‍රමාණය අප ප්‍රාදේශීය සභාව සතු ඩෙන්මාර්ක් කසළ අංගනයට බැහැර කිරීමට අවස්ථාව ලබාදීමේ යෝජනාවට ගරු මහා සභාවේ සියලුදෙනා එකඟ නොවීම හේතුවෙන් එම යෝජනාව ප්‍රතික්ෂේප විය. | සභා තීරණය අනුව කටයුතු කර ඇත. |

## 2022.07.19 වන දින මහා සභාවේ ගනු ලැබූ තීරණවල ප්‍රගතිය

| තීරණ අංකය | තීරණය | ගත් ක්‍රියා මාර්ගය/ ප්‍රගතිය |
|---|---|---|
| 05:01:01 | අප බල ප්‍රදේශයේ තක්සේරු කර ගැනීමට අවශ්‍ය දේපළ කඩිනමින් හඳුනාගෙන ඒවා නිවැරදිව තක්සේරු කර ගැනීම සඳහා ශ්‍රී ජයවර්ධනපුර විශ්ව විද්‍යාලයේ දේපළ කළමනාකරණ හා තක්සේරු විද්‍යා උපාධිය ලබා සිටින උපාධිධාරීන් කොන්ත්‍රාත් පදනමින් බඳවාගෙන තක්සේරු කටයුතු නිම කර ගැනීම සුදුසු බවට ගරු මහා සභාව තීරණය කරන ලදී. | ආදායම් පරීක්ෂකවරුන්ගේ වෘත්තීය සමිතියේ සහභාගීත්වයෙන් දේපළ ලැයිස්තු සකස් කිරීම සඳහා කටයුතු යොදමින් ඇත. |
| 05:01:02 | වර්තමානයේ පවතින ඉන්ධන සහ අනෙකුත් වියදම් දෙස බැලීමේදී අප විසින් අය කරනු ලබන මුදල ප්‍රමාණවත් නොවන හෙයින් ගම්පොළ නගර සභාව මගින් අප වෙත ලබා දෙන කසළ කිලෝග්රෑම් එකක් රු: 3.00 බැගින් ටොන් එකක් සඳහා රු: 3000.00ක මුදලක් අය කිරීම සුදුසු බවට ගරු මහා සභාව තීරණය කරන ලදී. | ටොන් එකක් සඳහා රු: 3000.00ක මුදලක් ගෙවීම සඳහා ගම්පොළ නගර සභාව එකඟතාවය පළ කර ඇති අතර එම මුදලට කසළ ලබා ගැනීම සිදු කරනු ලබයි. |
| 05:01:03 | පර්චස් 05කින් යුතු උලපනාවත්ත සමගි ග්‍රාම සංවර්ධන / සුභ සාධක සමිතියට අයත් ප්‍රජාශාලා භූමිය ගඟ ඉහළ කෝරළේ ප්‍රාදේශීය සභාවට නීත්‍යානුකූලව පවරා ගැනීමට හා එහි ඔප්පු ලියාපදිංචි ගාස්තු සභාව මගින් දැරීම සුදුසු බවට ගරු මහා සභාව තීරණය කරන ලදී. | උලපනාවත්ත සමගි ග්‍රාම සංවර්ධන / සුභ සාධක සමිතියට අයත් ප්‍රජාශාලා භූමිය ගඟ ඉහළ කෝරළේ ප්‍රාදේ ශීය සභාවට නීත්‍යානුකූලව පවරා ගැනීම සඳහා ඔප්පු සකස් කිරීමට නීතීඥ මහතාට භාරදී ඇත. |
| 06:01 | 2021 වර්ෂයේ ණය හිමි කරන ලද ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රීනී සුබෝධා ලක්ෂානි රිබේරා මහත්මිය විසින් ඉදිරිපත් කරන ලද යෝජනාව වන වල්ලහගොඩ කහටගස්තැන්න ප්‍රධාන මාර්ගය සංවර්ධනය කිරීමේ ව්‍යාපෘතියේ අඩුපාඩු ඇති බැවින් එම අඩුපාඩු සකස් කර වැඩ අවසන් කිරීමෙන් පසු මාර්ග තත්ත්ව පරීක්ෂාව සිදුකොට ඇත්ගාල රන්කෙත ගොවි සංවිධානය වෙත එම ව්‍යාපෘතියේ මුදල් ගෙවීම සුදුසු බවට ගරු මහා සභාව තීරණය කරන ලදී. | ව්‍යාපෘතියේ අඩුපාඩු සකස් කළ පසු තාක්ෂණ නිලධාරී නිර්දේශය අනුව ගෙවීම් කටයුතු සිදුකරන ලදී. |

## 2022.08.16 වන දින මහා සභාවේ ගනු ලැබූ තීරණවල ප්‍රගතිය

| තීරණ අංකය | තීරණය | ගත් ක්‍රියා මාර්ගය/ ප්‍රගතිය |
|---|---|---|
| 05:01:01 | ගඟ ඉහළ කෝරළේ ප්‍රාදේශීය සභාවේ කොන්ත්‍රාත් පදනම මත සේවයේ යෙදී සිටින තාක්ෂණ නිලධාරී ඩබ්.එම්.මද්දුම බණ්ඩාර මහතාගේ සය මාසික කොන්ත්‍රාත් සේවා කාලය 2022.08.17 වන දින සිට අවසන් වන බැවින් සේවා අවශ්‍යතාවය සළකා 2022.08.18 දින සිට ඉදිරියට මාස 06ක කාලයක් සඳහා කොන්ත්‍රාත් පදනම මත නැවත සභා සේවයේ යොදවා ගැනීම සුදුසු බවට ගරු මහා සභාව තීරණය කරන ලදී. | සභා තීරණය අනුව කටයුතු කර ඇත. |
| 05:01:02 | වල්ලහගොඩ ග්‍රාම නිලධාරී වසමේ හතුගොඩ, අස්වැද්දුම, පහළ කුඩමාකේ, ඌරාමඩ යන ග්‍රාමයන්හි දුම්රිය මාර්ගයට යාබදව පවතින නිවෙස් සහිත ඉඩම්වලට දුම්රිය මාර්ගය හරහා ගමන් කිරීමට මාර්ගයක් සකස් කරදෙන ලෙස ගම්වාසීන් විසින් දුම්රිය දෙපාර්තමේන්තුවෙන් කර ඇති ඉල්ලීමට අනුව ප්‍රධාන දුම්රිය මාර්ගයේ කොළඹ සිට බදුල්ල දෙසට එනවිට වම්පසට වන්නට ඇති දුම්රිය මාර්ග රක්ෂිතයේ කෙළවරේ සිට දුම්රිය මාර්ගය දෙසට අඩි 08ක් පළල දුම්රිය රක්ෂිත ඉඩම් කොටස මැනුම් කිරීම සඳහා වැය වන රුඃ 25,729.76ක ඇස්තමේන්තු මුදල දුම්රිය දෙපාර්තමේන්තුව වෙත ගෙවීම සුදුසු බවට ගරු මහා සභාව තීරණය කරන ලදී. | අදාළ ඉඩම් කොටස මැනුම් කිරීමට වැයවන රු. රුඃ 25,729.76ක මුදල 2022-09-09 වන දින දුම්රිය දෙපාර්තමේන්තුව වෙත ගෙවා ඇත. |
| 05:01:03 | 2022 වර්ෂයට අදාළ අයවැය ලේඛනයේ ප්‍රතිපාදන වෙන්කර ඇති යම් යම් වැය ශීර්ෂවල ප්‍රතිපාදන ඉක්මවා ගොස් ඇති බැවින් වැය ශීර්ෂ මාරු කර ප්‍රතිපාදන සළසා ගැනීම සඳහා අදාළ වැය ශීර්ෂ පිළිබඳ සවිස්තරාත්මක තොරතුරු ඉදිරිපත් කිරීමෙන් අනතුරුව ඉදිරි කටයුතු කිරීම සුදුසු බවට ගරු මහා සභාව තීරණය කරන ලදී. | සභා තීරණය අනුව කටයුතු කර ඇත. |
| 06:01 | ගඟ ඉහළ කෝරළේ ප්‍රාදේශීය සභාව සතු කුරුඳුවත්ත කාය වර්ධන මධ්‍යස්ථානයේ පුහුණු කටයුතු සිදුකිරීම සඳහා මුඃරෙඃ 71 යටතේ පුහුණු උපදේශක තනතුරක් ඇති කිරීම සුදුසු බවට ගරු මහා සභාව තීරණය කරන ලදී. | මුඃරෙඃ 71 යටතේ පුහුණු උපදේශක තනතුරක් ඇති කිරීම සඳහා කටයුතු කෙරෙමින් පවතී. |

## 2022.09.20 වන දින මහා සභාවේ ගනු ලැබූ තීරණවල ප්‍රගතිය

| තීරණ අංකය | තීරණය | ගත් ක්‍රියා මාර්ගය/ ප්‍රගතිය |
|---|---|---|
| 05:01:01: | 2023 වර්ෂය සඳහා බදු පැනවීම | ගැසට් පත්‍රයේ පළ කිරීම සඳහා කටයුතු යොදා ඇත. |
| 05:01:02: | 2023 වර්ෂය සඳහා සැපයුම්කරුවන් හා කොන්ත්‍රාත්කරුවන් ලියාපදිංචි කිරීම සුදුසු බවට ගරු මහා සභාව තීරණය කරන ලදී. | ගැසට් පත්‍රයේ පළ කිරීම සඳහා කටයුතු යොදා ඇත. |
| 05:01:03 | 2022 වර්ෂයේ අයවැය මගින් වෙන්කර ඇති ඇතැම් වැය විෂයන්වල ප්‍රතිපාදන ප්‍රමාණවත් නොවන හෙයින් ප්‍රතිපාදන ඉතිරි වී ඇති වැය ශීර්ෂයන් වලින් ප්‍රතිපාදන ලබා ගැනීම සඳහා වීරමොං ක්‍රියාපටිපාටිය අනුගමනය කරමින් වැය ශීර්ෂ මාරු කිරීම සඳහා ගරු මහා සභාවේ අනුමැතිය ලබා දීම සුදුසු බවට ගරු මහා සභාව තීරණය කරන ලදී. | සභා තීරණය අනුව කටයුතු කර ඇත. |
| 05:01:04 | ඇත්ගාල ප්‍රදේශයේ අනවසර ඉදිකිරීමක් කඩා ඉවත් කිරීම සම්බන්ධ M 5795/08 නඩුවේ අභියාචනා සළකාබැලීම සඳහා සිදුකරනු ලැබූ පරීක්ෂණයේ වාර්තාව අනුව සිසිර අලුත්ගමගේ මහතාගෙන් රු.509,610.00ක්ද ඒ.මහින්දරත්න අලුත්ගමගේ මහතාගෙන් රු.448,456.80ක්ද එම්.බී. කරල්ලියද්ද මහතාගෙන් රු. 50,961..00ක් සහ එන්.එම්. උදයශාන්ත නවරත්න මහතාගෙන් රු.10,192.20ක් යනාදී වශයෙන් අදාළ වන්දි මුදල් කඩිනමින් සභාව වෙත අයකර ගැනීම සුදුසු බවට | මුදල් ගෙවා අවසන් කරන ලෙස දන්වා ලිපි යොමු කර ඇත.නමුත් මේවන තෙක් එම මුදල ගෙවීමට කටයුතු කර නොමැත. |

| | | |
|---|---|---|
| | ගරු මහා සභාව තීරණය කරන ලදී. | |
| 05:01:05 | 1987 අංක 15 දරණ ප්‍රාදේශීය සභා පනතේ අර්ථකථනය කර ඇති ආකාරය අනුව වරිපනම් අයකළ හැකි දේපළ ලෙස දක්වා ඇත්තේ ගෙයක්, ගොඩනැගිල්ලක්, ඉඩමක් හෝ ගෙපතක් යනාදිය වන අතර ඒ අනුව ආදායම් පරීක්ෂක විසින් පෙන්වා දී ඇති පරිදි කුඹුරු ඉඩම් යන්න එහි අර්ථකථනය කර නොමැති බැවින්ද මු. රෙ. 102(2) සහ මු.රෙ. 113 ප්‍රකාරව අත්හැර දැමිය හැකි බැවින් ද වරිපනම් ලේඛනයේ හිඟ ශේෂ පවතින කුඹුරු ඉඩම්වල මේ දක්වා ඇති සම්පූර්ණ හිඟ මුදල වන රු.267,608.10 ක මුදල වරිපනම් ලේඛන වලින් ඉවත් කිරීම සුදුසු බවට ගරු මහා සභාව තීරණය කරන ලදී. | ගැසට් පත්‍රයේ පළ කිරීම සඳහා කටයුතු යොදා ඇත. |
| 05:01:06 | පළාත් නිශ්චිත සංවර්ධන ප්‍රදාන - 2021 යටතේ ක්‍රියාත්මක කරන ලද ශ්‍රීධරන්පුර ජල යෝජනා ක්‍රමය සඳහා සභාව වෙත ලැබී ඇති රුපියල් 2,919,595.38 ක මුදල තාක්ෂණ නිලධාරී නිර්දේශය අනුව මෙම ව්‍යාපෘතිය ක්‍රියාත්මක කරන ලද කොන්ත්‍රාත් ආයතනය වන චීෆ් ඉංජිනියරින් ආයතනය (CHIEF ENGINEERING) වෙත ගෙවීම සුදුසු බවට ගරු මහා සභාව තීරණය කරන ලදී. | තාක්ෂණ නිලධාරී නිර්දේශය අනුව 2022-10-18 දින ගෙවීම් සිදුකරන ලදී. |
| 05:01:07 | සමෘද්ධි බැංකුව මැදගොඩ හන්දියේ ස්ථාපිත කිරීම සම්බන්ධව හිටපු අමාත්‍ය ගරු මහින්දානන්ද අලුත්ගමගේ මැතිතුමා, ප්‍රාදේශීය ලේකම්තුමිය, ප්‍රාදේශීය මන්ත්‍රීවරුන් හා නිලධාරීන් එක්ව සාකච්ඡා කර තීරණයක් ගැනීම සුදුසු බවත් ඒ අනුව ඉඩම ලබා දීම සම්බන්ධයෙන් තීරණයක් ගැනීම සුදුසු බවටත් ගරු මහා සභාව තීරණය කරන ලදී. | සභා තීරණය අනුව කටයුතු කර ඇත. |
| 05:01:08 | මධ්‍යම පළාත තුළ පිහිටි රජය සතු ඉඩම් සඳහා සිදුකර ගන්නා මැනුම් සඳහා ගෙවීම් කිරීමේදී ඉංජිනේරු සේවා දෙපාර්තමේන්තුවේ ප්‍රසම්පාදන කමිටුවට ඉදිරිපත් කළ මිළ ගණන් අනුව මහනුවර දිස්ත්‍රික්කය සඳහා නම් ඉදිරිපත් කර ඇති මිනින්දෝරු ගයාසර ගිණිගේ මහතා යොදා ගැනීම සුදුසු බවට ගරු මහා සභාව තීරණය කරන ලදී. | දැනුම් දෙන ලදී. |
| 05:01:09 | 2022-04-26 දින පැවති මහා සභාවේ තීරණ අංක 05:01:02 යටතේ මැනුම් කර ගැසට් කිරීම සඳහා සභා අනුමැතිය ලද ගඟ ඉහළ කෝරළේ ප්‍රාදේශීය සභාවට අයත් රජඇල අසල සිට ගම්පොලවෙල ප්‍රධාන පාරට සම්බන්ධ වන මහපුරණ පාර, ඇත්ගාල ප්‍රධාන පාර, සිංහපුරගම මැද පාර, වැටකේදෙණිය සිට උඩුවැල්ල දක්වා පාර, යටපාන බුන්නාව හරහා තියඹරාමය දක්වා පාර, පරගල බස්නැවතුම්පොල අසල සිට පරගල නව ජනපදය පාර, කොලුවල වැලිහිරියේ සිට බටගොල්ල දක්වා පාර, මීතලාව නාගහමුල හන්දියේ සිට ගිරාඋල්ල පන්සල හරහා ප්‍රධාන පාරට සම්බන්ධ වන අතුරු මාර්ගය, අලුගොල්ලේ සිට රන්තැටියාවත්තට යන පාර යන මාර්ග මැනුම් කිරීම අවසන් බැවින් වසර තුනක කාල සීමාවක් ඇතුළත නීත්‍යානුකූලව ගැසට් කිරීම සඳහා ගරු විෂයභාර අමාත්‍යතුමාගේ අනුමැතිය ලබා ගැනීම සුදුසු බවට ගරු මහා සභාව තීරණය කරන ලදී. | ගරු විෂයභාර අමාත්‍යතුමාගේ අනුමැතිය ලබා ගැනීම සඳහා ලිපි යොමු කර ඇත.නිශ්චිත කාලවකවානුවක් සභා තීරණයට ඇතුළත් කිරීම සඳහා සභා තීරණය සංශෝධනය කිරීමට සභාවට යොමු කර ඇත. |
| 05:01:10 | 2022 වර්ෂයට අදාළව ගඟ ඉහළ කෝරළේ ප්‍රාදේශීය සභාවට අයත් ජයමාලපුර 10 වන පටුමඟ, මුස්ලිම් විද්‍යාලය අසල සිට තලේගොඩ පිට්ටනිය හරහා පයනු වංගුව දක්වා පාර, වැලිකන්ද හන්දියේ සිට හැරකොළ දක්වා පාර, තැඹිලිගල විහාරස්ථානය අසලින් ඇත්ගාල නගරය යා කරන පාර, ගම්පොලවෙල ගනේවත්ත පාර, පරගල ගම මැද ක්‍රීඩාපිටිය අසල සිට ගම මැද මාර්ගය කුලරත්න මහතාගේ නිවස අසල දක්වා පාර, ගල්පාය සිට ගොවිපොල හරහා ලෙච්චම්වත්ත පාර, බොස්වෝඩ් පන්සල අසල සිට රහලගල දක්වා දිවෙන පාර, මීතලාව සිට උඩගම බෝමළුව දක්වා පාර යන මාර්ග 09 මැනුම් කර ගැසට් කිරීම සඳහා ගරු මහා සභාවේ අනුමැතිය ලබා ගැනීම සුදුසු බවට ගරු මහා සභාව තීරණය කරන ලදී. | ගරු විෂයභාර අමාත්‍යතුමාගේ අනුමැතිය ලබා ගැනීම සඳහා ලිපි යොමු කර ඇත. |

## 2022.10.18 වන දින මහා සභාවේ ගනු ලැබූ තීරණවල ප්‍රගතිය

| තීරණ අංකය | තීරණය | ගත් ක්‍රියා මාර්ගය/ ප්‍රගතිය |
|---|---|---|
| 05:01:01 | 2023 වර්ෂය සඳහා සකස් කරන ලද අයවැය කෙටුම්පත අනුමත කිරීම සුදුසු බවට තීරණය කරන ලදී. | සභා තීරණය අනුව කටයුතු කර ඇත. |
| 05:01:02 | මාර්ගය නැවත නම් කිරීම සම්බන්ධයෙන් උපදේශක කාරක සභාව සමග සාකච්ඡා කිරීමෙන් අනතුරුව ගරු මහා සභාවේ අනුමැතිය ලබාදීම සුදුසු බවට ගරු මහා සභාව තීරණය කරන ලදී. | සභා තීරණය අනුව කටයුතු කර ඇත. |
| 05:01:03 | ගඟ ඉහළ කෝරළේ ප්‍රාදේශීය සභාව සතු පැරණි ප්‍රාදේශීය සභා භූමියේ ඉදිකිරීමට යෝජිත නව වෙළඳ සංකීර්ණයේ ටෙන්ඩර් පටිපාටියෙන් බැහැරව ,ගරු විෂයභාර අමාත්‍යවරයාගේ අනුමැතියට යටත්ව ගොඩනැගිල්ලෙහි පළමු මහළ ලංකා බැංකුව සහ කාර්ගිල්ස් ෆුඩ් කම්පැණි වෙත දීර්ඝකාලීන බදු පදනම මත බදු දීමට අදාළව 2022-06-29 වන දිනැති සංශෝධිත සැළැස්ම අනුව පහළ මහලේ වාහන අංගනය ඉදිකෙරෙන කොටසේ කාර්ගිල්ස් ෆුඩ් ආයතනයේ ගබඩාව ඉදිකිරීම සුදුසු බවටත් පළමු මහලේ වාණිජ කටයුතු සඳහා වර්ග අඩි 3698ක ප්‍රමාණයත් සමග මුළු වර්ග අඩි 6587ක ප්‍රමාණයක් කාර්ගිලිස් ෆුඩ් කම්පැණි ආයතනය වෙත දීර්ඝකාලීන බදු පදනම මත ලබාදීම සුදුසු බවටත් කුරුඳුවත්ත ලංකා බැංකු ශාඛාව සඳහා පළමු මහලේ වර්ග අඩි 1620ක් සමග මුළු වර්ග අඩි 3297ක ප්‍රමාණයක් දීර්ඝ කාලීන බදු පදනම මත ලබාදීම සුදුසු බවට තීරණය කරන ලදී. | ටෙන්ඩර් පටිපාටියෙන් බැහැරව බදු දීම සඳහා ගරු විෂය භාර අමාත්‍යවරයාගේ අනුමැතියට යොමු කර ඇත. |
| 05:01:04 | 2022 වර්ෂයේ සභා අරමුදල් ප්‍රතිපාදන යටතේ ක්‍රියාත්මක කිරීමට නියමිත මල්වත්තගම උදාකළ ගම්මානයේ ඉදිකරන ලද බුදුමැදුර ප්‍රතිසංස්කරණය කිරීමට විෂයභාර අමාත්‍යවරයාගේ අනුමැතිය ලබාගැනීම සඳහා ගරු මහා සභාවේ අනුමැතිය ලබාදීම සුදුසු බවට ගරු මහා සභාව තීරණය කරන ලදී. | ගරු විෂය භාර අමාත්‍යවරයාගේ අනුමැතියට යොමු කිරීම සඳහා සකස්කර ඇත. |
| 05:01:05 | 2022 වර්ෂයේ සභා අරමුදල් මගින් ක්‍රියාත්මක කරන ලද බෝගොල්ල සම්පත් මහතාගේ නිවස අසල මාර්ගය සංවර්ධනය කිරීම ව්‍යාපෘතිය සඳහා රු.750,000.00ක මුදලක් උලපනේවත්ත සමගි ග්‍රාම සංවර්ධන සමිතිය වෙත ගෙවීම සුදුසු බවට ගරු මහා සභාව තීරණය කිරීමෙන් අනතුරුව එම යෝජනාව ඒකමතිකව සභා සම්මත විය. | ගෙවීම් කර ඇත. |
| 05:01:06 | 2021 වර්ෂයේ ණයහිමි කර ඇති සභා අරමුදල් ප්‍රතිපාදන යටතේ ක්‍රියාත්මක කරන ලද වල්ලහගොඩ කහටගස්තැන්න මාර්ගය සංවර්ධන කිරීමේ ව්‍යාපෘතිය සඳහා රු.1,244,740.30ක මුදලක් ඇත්ගාල බටහිර - රන්කෙත ගොවි සංවිධානය වෙත ගෙවීම සුදුසු බවට ගරු මහා සභාව තීරණය කරන ලදී. | ගෙවීම් කර ඇත. |
| 06:01 | කුරුඳුවත්ත වෙළඳ සංකීර්ණය ඉදිකිරීම ව්‍යාපෘතිය - අදියර 01 සඳහා අමුද්‍රව්‍යවල හා වෙනත් සේවාවන්හි වෙළඳපොළ මිළ ඉහළ යාම හේතුවෙන් පෙර ඇස්තමේන්තු මුදල ඉක්මවා එකතු කළ අගය මත බද්ද 15%ක් ,භෞතික වෙනස්වීම් සඳහා 10% දක්වා ද මිළ විචලනයන් සඳහා 5%ක් ද උපදේශන සේවා ගාස්තු සඳහා 3.5 % ද ඇතුළත්ව තවත් රුපියල් මිලියන 27.7 ක මුදලක් වැයවෙතැයි ඇස්තමේන්තුගත කර ඇති බැවින් සංශෝධිත ඇස්තමේන්තු මුදල වන රු.121,700,000.00 ක් සහ සංශෝධිත සැලැස්ම සඳහා ගරු මහා සභා අනුමැතිය ලබාදීම සුදුසු බවට ගරු මහා සභාව තීරණය කරන ලදී. | සභා තීරණය අනුව කටයුතු කර ඇත. |
| 06:02 | ඉඩම් හිමිකම් නිරවුල් කිරීමේ දෙපාර්තමේන්තුව මගින් යොමු කරන ලද ලිපියක් මගින් ඇත්ගාල වෙළඳ සංකීර්ණයෙහි අංක 21 දරණ කඩ කාමරය එම ආයතනයේ ප්‍රාදේශීය කාර්යාලයක් පවත්වාගෙන යාම සඳහා බදු පදනමින් ලබා දෙන ලෙස ඉල්ලීම අනුව ඉඩම් හිමිකම් නිරවුල් කිරීමේ දෙපාර්තමේන්තුවේ ප්‍රාදේශීය කාර්යාලයක් පවත්වා ගෙන යාම සඳහා ඇත්ගාල වෙළඳ සංකීර්ණයෙහි අංක 21 දරණ කඩ කාමරය ගරු විෂයභාර අමාත්‍යවරයාගේ පූර්ව අනුමැතියට යටත්ව විවෘත ටෙන්ඩර් පටිපාටියෙන් බැහැරව ,රජයේ නව තක්සේරුවකට | කුඩා තේවතු සංවර්ධන අධිකාරියේ ප්‍රාදේශීය කාර්යාලයේ බදු කාලසීමාව 2022-12-31 දක්වා පවතින බැවින් ඔවුන් ඉවත් වූ පසු තීරණය ක්‍රියාත්මක කෙරෙනු ඇත. |

| | | |
|---|---|---|
| | යටත්ව වසර 03ක කාලසීමාවක් සඳහා බදු පදනමින් ලබාදීම සුදුසු බවට ගරු මහා සභාව තීරණය කරන ලදී. | |
| 06:03 | 2022 අයවැය ප්‍රතිපාදන මගින් වෙන්කර ඇති රු.700,000.00ක මුදලින් කුරුඳුවත්ත,ඇත්ගාල හා උලපනේ පුස්තකාල සඳහා පොත් මිළදී ගැනීම සඳහා සභා අනුමැතිය ලබාදීම සුදුසු බවට ගරු මහා සභාව තීරණය කරන ලදී. | පොත් මිළදී ගන්නා ලදී. |
| 06:04 | දැනට ගඟ ඉහළ කෝරළේ ප්‍රාදේශීය සභා බල සීමාව තුල වරිපනම් බදු අය කිරීමට සිදුවන ප්‍රදේශ සහ ඉදිරියේ දී වරිපනම් බදු අය කිරීම සඳහා දැනට ගැසට් කර ඇති බල ප්‍රදේශවලට අයත් නොවන, විශේෂ දේපල ලෙස හඳුනාගත් දේපල සඳහා වරිපනම් බදු පැනවීමේ කාර්යය වෙනුවෙන් විශේෂ දේපල ලෙස ප්‍රකාශයට පත් කිරීම සුදුසු බවට ගරු මහා සභාව තීරණය කරන ලදී. | සභා තීරණය අනුව ඉදිරි කටයුතු සිදුකෙරෙමින් පවතී. |

## 02. ගරු ප්‍රාදේශීය සභා උප සභාපති ඒ.මහින්දරත්න අලුත්ගමගේ මහතා

ගරු සභාපතිතුමනි.ඇත්ගාල අනවසර ඉදිකිරීම පිළිබඳ පරීක්ෂණයට නඩුවේ කිසිවක් අදාළ කරගෙන නැහැ.මා එම නඩුවෙන් නිදොස් කොට නිදහස් කළත් වාර්තාවේ සඳහන් වන්නේ මා නිදොස් කොට නිදහස් කළ බවට වන මා කළ ප්‍රකාශය පමණයි.අවම වශයෙන් නඩු අංකය හෝ සඳහන් වන්නේ නැහැ.එය නිරීක්ෂණයට භාජනය වී ඇත්තේ වන්දි නඩුවේ මුලික කරුණු පමණයි.පළමු නඩු වාර්තාව ගෙන්වාගෙන එය සභාව හරහා මට ලබා ගන්නා ලෙස නීතිඥවරයා උපදෙස් ලබා දී තිබෙනවා.

<u>ගරු සභාපතිතුමා</u>

ගරු උප සභාපතිතුමා,නඩු ගොනුව පරීක්ෂා කර බලා අවශ්‍ය කටයුතු කිරීම සුදුසුයි.

## 03.ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ආර්.පී.ගුණරත්න මහතා

ගරු සභාපතිතුමනි,කුරුඳුවත්ත හා ඇත්ගාල ක්‍රීඩා පිටි සඳහා ක්‍රීඩා අමාතනංශයත් ප්‍රාදේශීය සභාවත් විශාල මුදල් ප්‍රමාණයක් වැය කර තිබෙනවා.ක්‍රීඩා සමාජ ඇතිකර මෙය වර්ධනය කිරීමේ හැකියාව තිබෙනවා.නමුත් නිරන්තරයෙන් විදුලි බල්බ ක්‍රියාවිරහිත වීම,ට්‍රිප් ස්විච්,මේන් ස්විච් පිළිස්සීම සිදුවෙනවා.2023 වර්ෂයේ ඉතිරිවන යම් ප්‍රතිපාදන මුදලක් යොදවා අකුණු සන්නායකයක් සවිකිරීමට කටයුතු කරන ලෙස ඉල්ලා සිටිනවා.සීසීටීවී කැමරා අකර්මණ්‍ය වීම නිසා ඉතා ඉහළ වටිනාකමක් ඇති කායවර්ධන මධ්‍යස්ථානයේ භාණ්ඩවල ආරක්ෂාව පිළිබඳවත් ගැටළු ඇති විය හැකියි.වර්තමානයේ තරුණ ප්‍රජාව අන්තර්ජාලයට,මත්ද්‍රව්‍ය වලට ඇබ්බැහි වී සිටින පසුබිමක ගඟ ඉහල කෝරළේ ප්‍රාදේශීය සභාව ඔබ තමුන්නාන්සේලාගේ නායකත්වය හා දායකත්වය මත ඉහළ තත්ත්වයකට මෙම ක්‍රීඩා පිටි ගෙනැවිත් තිබෙනවා.කවුරු ඉදිරි කාලයෙ ්දේශපාලන බලයට පැමිණියත් ක්‍රීඩාව ඉහළ තත්ත්වයට ගෙන ඒමට සකස් කළ මෙම සම්පත් ආරක්ෂා කර ගැනිමටත් කටයුතු කළයුතු බව ප්‍රකාශ කළ යුතුයි.

<u>ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී සරත් කුමාරලාල් මහතා</u>

ගරු සභාපතිතුමනි,ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ආර්.පී.ගුණරත්න මහතා ගෙන ආ යෝජනාව මම අනුමත කරනවා.අකුණු සන්නායකයක අවශ්‍යතාවය සියයට සියයක් ම තිබෙනවා.ලොකු මිළකට මිළදී ගන්නවාට වඩා සෑදිය හැකි නම් වඩාත් සුදුසුයි.එසේම ක්‍රීඩාපිටිය වෙන් කිරීමේදී සවස එම පුහුණු කටයුතු හෝ තරග අවසන් කිරීමට වෙලාවක් ලබා දී තිබිය යුතුයි.ක්‍රීඩා කිරීම සඳහා පැමිනි ප්‍රදේශයේ තරුණයින් එම කටයුතු අවසන් වන තෙක් සවස 6.30 පමණ වන තෙක් බොහෝ වේලාවක් බලා සිටිනවා.එවිට ඔවුන් අතර ගැටුම් ඇතිවෙනවා.එම ගැටුම් මමත් විසඳූ අවස්ථා තිබෙනවා.එසේම එහි දුම් පානය කරනවා.ක්‍රීඩාංගනයේ සේවය කරන කම්කරු මහතුන් කියන දේවල් ඔවුන් අසන්නේත් නැහැ.පැමිණි පිරිස් පිට නොවීම නිසා ගේට්ටුව වැසීමටවත් නොහැකියි. එම නිසා ක්‍රීඩාංගනය නැවත භාර දියයුතු වේලාව සහ නීති පද්ධතියක් සඳහන් කර දැන්වීම් පුවරුවක් සකස් කළ යුතුබව මගේ අදහසයි.

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ආර්.පී.ගුණරත්න මහතා

ගරු සභාපතිතුමනි,ප.ව.5.00ට අවසන් වීමට තිබූ තරගයක් වර්ෂාව වැනි හේතුවක් මත යම් වේලාවක් ඉදිරියට ගත කිරීම ගැටළුවක් නොවුණත් පුහුණු තරගවලදී මෙය නිසි වේලාවට ක්‍රියාත්මක කළ යුතුය යන්න මගේ අදහසයි.

ගරු සභාපතිතුමා

ගරු මන්ත්‍රීතුමා,අප විසින් සාදන ලද අකුණු සන්නායකයකට අනුමැතිය ලබා ගැනීම ගැටළු සහගතයි.වගකීම් සහතිකය සහිතව ලියාපදිංචි සහ හොඳ ආයතනයකින් මිළට ගැනීම වඩාත් සුදුසු බව මගේ අදහසයි.එසේම ක්‍රීඩාංගනයේ ගැටළු සම්බන්ධව වැඩපිළිවෙළක් සකස් කරන්නට අවශ්‍ය කටයුතු කිරීමට බලාපොරොත්තු වෙනවා.

04,නිවාඩු ඉල්ලීම්

01. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රිනී චන්ද්‍රා අලුත්ගමගේ මහත්මිය අසනීප තත්ත්වය හේතුවෙන් සභා වාරයට සහභාගී විය නොහැකි බැවින් අද දින නිවාඩු අනුමත කර දෙන ලෙස ඉල්ලීමක් කර ඇත..එම ඉල්ලීම අනුමත කරන ලදී.

02.ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රිනී රාජකුමාර් විදූෂණී මහත්මිය අත්‍යවශ්‍ය කරුණක් හේතුවෙන් සභා වාරයට සහභාගී විය නොහැකි බැවින් අද දින නිවාඩු අනුමත කර දෙන ලෙස ඉල්ලීමක් කර ඇත.එම ඉල්ලීම අනුමත කරන ලදී.

03. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ආර්.එම්.චාමික අනුරාධ රත්නායක මහතා අසනීප තත්ත්වයෙන් පසුවන බැවින් මෙම වාරයට සහභාගී විය නොහැකි බැවින් අද දින නිවාඩු අනුමත කර දෙන ලෙස ඉල්ලීමක් කර ඇත.එම ඉල්ලීම අනුමත කරන ලදී.

05.ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ආර්.පී.ගුණරත්න මහතා

ගරු සභාපතිතුමනි,කුරුඳුවත්ත නගර සංවර්ධනයට අක්කර පහක භූමියක් වෙන්කර තිබෙනවා.රෝහලටත් අක්කර පහක භූමියක් වෙන්කර තිබෙනවා.නාගරීකරණය සමග මුදලේ වටිනාකම අඩු වීමත් සමග නව ව්‍යාපෘති රාශියක් මෙම නගරයට පැමිණ තිබෙනවා.නමුත් මෙම භූමියට අපට නෛතික අයිතියක් නැහැ.මෙය නිරවුල්ව ඉඩම් ප්‍රතිසංස්කරණ බල මණ්ඩලය හරහා මැන වෙන්කර තිබෙනවා.මේ සඳහා ගෙවිය යුතු මුදල් ප්‍රතිපාදන ඔබතුමා ගෙවා එම ඔප්පුව සභා සන්තක කර තබන ලෙස ඉල්ලා සිටිනවා.දැනට ලක්ෂ හතරක් ගෙවා තිබෙනවා.ඉතිරි මුදල් ගෙවා මෙය නිරවුල් කරන ලෙස ඉල්ලා සිටිනවා.අවම වශයෙන් ලක්ෂ 50ක් හෝ ගෙවන ලෙස මා යෝජනා කරනවා,

ගරු සභාපතිතුමා

රු.9,999,999.00ක් ගෙවීමට තිබෙනවා.ගොඩනැගිල්ල සෑදූ පසු අපට ලැබෙන තැන්පත් මුදලින් මෙය ගෙවීමට මා අදහස් කරනවා.කෙසේ නමුත් ලක්ෂ 50ක් හෝ ගෙවීමට කටයුතු කරන බව දන්වා සිටිනවා.

ගරු සභාපතිතුමා

අද දින මහා සභා රැස්වීම සඳහා පැමිණි ගරු උප සභාපතිතුමා ඇතුළු ගරු මන්ත්‍රීතුමන්ලා හා ගරු මන්ත්‍රීතුමියන්ලාට ස්තූතිවන්තවන බව ප්‍රකාශ කරන ලදි. අද දින සභාවාරය සාර්ථකව පවත්වාගෙන යාමට සහාය ලබාදුන් සියලුදෙනාටත් ප්‍රාදේශීය සභාවේ ලේකම්තුමිය ඇතුළු කාර්යය මණ්ඩලයේ සියලු දෙනාටත් ස්තූතිවන්ත වෙමින් ගරු සභාපතිතුමා විසින් සභාවේ වැඩ කටයුතු පෙ:ව: 11.40 ට අවසන් කරන ලදි.

සභාපති

ගඟ ඉහළ කෝරලේ ප්‍රාදේශීය සභාව

2022 12.06 වනදින ගඟ ඉහළකෝරලේ

ප්‍රාදේශීය සභා රැස්වීම් ශාලාවේදී ය.